

වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயற்திறன் அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

2022

වාරිමාර්ග අමාත්‍යාංශය

நீர்ப்பாசன அமைச்சு

Ministry of Irrigation

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

අන්තර්ගතය

වැය ශීර්ෂ අංකය 198 - වාරිමාර්ග අමාත්‍යාංශය

පරිච්ඡේදය 01	ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය	01
පරිච්ඡේදය 02	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	06
පරිච්ඡේදය 03	වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය	72
පරිච්ඡේදය 04	කාර්යසාධන දර්ශක	78
පරිච්ඡේදය 05	තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	79
පරිච්ඡේදය 06	මානව සම්පත් පැතිකඩ	81
පරිච්ඡේදය 07	අනුකූලතා වාර්තාව	82

ඇමුණුම්

ඇමුණුම I	අවසන් කරන ලද පුහුණු වැඩසටහන් (KITI)
ඇමුණුම II	වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති
ඇමුණුම III	ක්‍රියාත්මක ආයතන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති / වැඩසටහන්
ඇමුණුම IV	විගණකාධිපතිවරයාගේ වාර්තාව (වාරිමාර්ග අමාත්‍යාංශය)

වැය ශීර්ෂ - 198

වාරිමාර්ග අමාත්‍යාංශය

01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

වාරිමාර්ග අමාත්‍යාංශයට අයත් සියළු ආයතන ද, වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ වූ රාජ්‍ය අමාත්‍යාංශයන්හි විෂය පථයන් ද ඇතුලත් කර එක් අමාත්‍යාංශයක් ලෙස 2022 වසර තුළ ක්‍රියාත්මක වූ වාරිමාර්ග අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකාවේ ජල සම්පත් සංවර්ධනය සහ කළමනාකරණය පිණිස සුවිශේෂී වූ කාර්යභාරයක් ඉටුකරනු ලබයි.

රටෙහි සමස්ථ ගොවි ප්‍රජාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමෙහිලා කෘෂිකාර්මික සංවර්ධනය පිණිස වාරි ජලය සැපයුමත්, ඉන් ඔබ්බට යමින් පානීය, කාර්මික හා විදුලි උත්පාදන යන බහුවිධ අරමුණු ඔස්සේ ජල සම්පත් සංවර්ධනය හා මෙහෙයවීමත් තුළින් සිය කාර්යභාරය වඩාත් පුළුල් කිරීමට කටයුතු කර ඇති වාරිමාර්ග අමාත්‍යාංශය කාර්යක්ෂම ලෙස එම කාර්යයන් ඉටු කිරීම සඳහා තවදුරටත් කටයුතු කරයි.

ඒ අනුව, මධ්‍යම හා මහා වාරි කලාප ආශ්‍රිතව ඒකාබද්ධ ජල කළමනාකරණ ප්‍රවේශයක් ඔස්සේ ගොවි ප්‍රජාව සවිබල ගැන්වීමත්, භූගත ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය තුළින් එහි ප්‍රමාණාත්මක හා ගුණාත්මකභාවය පවත්වා ගැනීමත් සඳහා විවිධ වැඩසටහන් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

වාරිමාර්ග අමාත්‍යාංශයට පැවරී ඇති කාර්යභාරය ඉටු කිරීමෙහිලා අමාත්‍යාංශය යටතේ ඇති අනුබද්ධිත ආයතන වන වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ වාරිමාර්ග කළමනාකරණ අංශය මඟින් ලැබුණු දායකත්වය ඉතා වැදගත් වේ.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

1.2.1. දැක්ම

"තිරසාර ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය තුළින් සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීම"

1.2.2. මෙහෙවර

ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය තුළින් බහුවිධ අවශ්‍යතා ඉටු කරමින් ප්‍රජාවගේ හා පරිසරයේ යහපැවත්ම සැලසීම

1.2.3. අරමුණු

i. රටේ සියලු ජල පරිභෝජන හා බලශක්ති අවශ්‍යතා සඳහා අවශ්‍ය වන ජල සම්පත සංවර්ධනය හා කළමනාකරණය

ii. ඉඩම් හා ජල භාවිත කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම

iii. ගංඟා ද්‍රෝණි හා ජල මූලාශ්‍ර සංරක්ෂණය මගින් ජලයේ ගුණාත්මක බව හා තිරසාර බව ආරක්ෂා කිරීම

iv. ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමට අවශ්‍ය වාරි ජල හා කෘෂිකාර්මික උපදේශන පහසුකම් සැලසීම

v. සියලු ශ්‍රී ලාංකිකයන්ට සෞඛ්‍ය ආරක්ෂිත ගෘහස්ත ජල සැපයුමක් තහවුරු කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම

vi. පාරිසරික සමතුලිතතාව හා සංවර්ධනය සඳහා අවශ්‍ය ජල පහසුකම් සැලසීම

vii. වාරි පද්ධති ආශ්‍රිත ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම තුළින් කෘෂිකර්මාන්තයේ තිරසාර බව තහවුරු කිරීම

viii. කර්මාන්ත, සංචාරක සේවා අංශ වල ජල අවශ්‍යතා සපුරාලීම

ix. ශ්‍රී ලංකාවේ භූගත ජල සම්පත් සංවර්ධනය, සංරක්ෂණය හා කළමනාකරණය

x. මහවැලි විශේෂ ආර්ථික බලප්‍රදේශ මඟින් ජාතික ආහාර නිෂ්පාදන ක්‍රියාවලියට සක්‍රීය දායකත්වයක් ලබාදීම

1.3. ප්‍රධාන කාර්යයන්

i. අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්හි විෂයන්ට අදාල ප්‍රතිපත්ති සම්පාදනය, ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සමාලෝචනය හා ඇගයීම.

ii. ජල සම්පත් හා වාරි පද්ධති සංවර්ධනය

iii. මෙහෙයුම හා නඩත්තුව ද ඇතුලු ව වාරිමාර්ග පද්ධති හා ගංඟා ද්‍රෝණි කළමනාකරණය

iv. ජල මූලාශ්‍ර හා වාරිමාර්ග පද්ධති සංරක්ෂණය හා ආරක්ෂා කිරීම.

v. බහුවිධ අවශ්‍යතා සඳහා අවශ්‍ය ජල ප්‍රමාණයන් වෙන් කිරීම සඳහා තාක්ෂණික මගපෙන්වීම හා නිර්ණායක සකස් කිරීම.

vi. ජල මූලාශ්‍ර හා ආශ්‍රිත පරිසර දූෂණය වැලැක්වීමට හා ජලයේ ගුණාත්මක බව තහවුරු කිරීම සඳහා උපායමාර්ගික වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

vii. ගොඩබිමට කරදිය ගලා ඒම වැලැක්වීමේ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

viii. අපවහනය සහ ගංවතුර ආරක්ෂණය.

ix. ඉංජිනේරුමය උපදේශන සේවා ලබා දීම.

x. රාජ්‍ය අංශයේ ප්‍රධානතම ඉදිකිරීම් සේවා සැපයුම්කරු ලෙස ප්‍රමිතිගත ඉදිකිරීම් කාර්යන්හි නිරතවීම.

xi. වාරිමාර්ග පද්ධති වල ආයතනික සංවර්ධනය හා ඵලදායීතාවය ප්‍රවර්ධනය කිරීම.

xii. භූගත ජලය සංවර්ධනය අධීක්ෂණය හා කළමනාකරණය.

xiii. වැසි ජල සංරක්ෂණය, වැසි ජලය රැස්කිරීම ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

xiv. ජාතික විදුලිබල සැපයුමෙහි ප්‍රධාන පුනර්ජනනීය බලශක්ති සැපයුම්කරු ලෙස මහවැලි ජලාශ පද්ධති කළමනාකරණය

xv. දේශීය ආහාර නිෂ්පාදන ක්‍රියාවලියේ ප්‍රධාන කොටස්කරුවෙකු ලෙස මහවැලි විශේෂ බල ප්‍රදේශ හරහා ලබාදෙන දායකත්වය පුළුල් කිරීම

xvi. දේශීය වාරිමාර්ග ඉංජිනේරු සේවාව ආරක්ෂා කරමින් වාරිමාර්ග ක්ෂේත්‍රයේ වෘත්තීය සේවා පුළුල් කිරීම.

1.4. සංවිධාන සටහන


අමාත්‍යාංශ ලේකම්
අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී.ල.කු.සේ.)
අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී.ල.කෘ.සේ.)
අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී.ල.ඉ.සේ.)
අති.ලේකම් (නාක්. හා ප්‍රසම්.)
ප්‍රධාන මූල්‍ය නිලධාරී
අති.ලේකම් (පාලන)
අති.ලේකම් (ජල සම්.කළ. හා සං.)
අති.ලේකම් (ව්‍යා.පිරිස්.කළ.)
අති.ලේකම් (ඉඩම් හා නීති)
අධ්‍යක්ෂ (සැලසුම්)
අධ්‍යක්ෂ (නාක්.විග.)
ප්‍ර.අ.වි.
අධ්‍යක්ෂ
අධ්‍යක්ෂ
අධ්‍යක්ෂ
අධ්‍යක්ෂ
අධ්‍යක්ෂ
ප්‍රධාන ගණකාධිකාරී
පෙ.ස. ලේ
අධ්‍යක්ෂ
අධ්‍යක්ෂ (ජල සම්.කළ. හා සං.)
අධ්‍යක්ෂ (ඉඩම් හා නීති)
සහ.අධ්‍ය. (සැලසුම්)
සහ.අධ්‍ය. (නාක්,විග.)
අ.වි.
සහ. අධ්‍ය.
සහ. අධ්‍ය.
සහ. අධ්‍ය.
සහ. අධ්‍ය.
සහ. අධ්‍ය.
සහ. අධ්‍යක්ෂ
සහ. අධ්‍යක්ෂ
ගණකාධිකාරී
සහ. ලේකම්
සහ. අධ්‍යක්ෂ
සහ. අධ්‍යක්ෂ
සහ. අධ්‍යක්ෂ
සහ.අධ්‍යක්ෂ (ශ්‍රී.ල.ස්‍රි.සේ.)
සහ.අධ්‍යක්ෂ (ශ්‍රී.ල.ප්‍රි.සේ.)
නීති නිලධාරී
පරි. නිලධාරී
භාෂා පරිවර්තක
ශාඛා ප්‍රධානී
ශාඛා ප්‍රධානී
ශාඛා ප්‍රධානී
ශාඛා ප්‍රධානී
ශාඛා ප්‍රධානී
ශාඛා ප්‍රධානී
ශාඛා ප්‍රධානී
සං.නිල. ක.සේ.නි.
සං.නිල. ක.සේ.නි.
සං.නිල. ක.සේ.නි.
සං.නිල. ක.සේ.නි.
සං.නිල. ක.සේ.නි.
සං.නිල. ක.සේ.නි.
සං.නිල. ක.සේ.නි.
සුළු සේවකයින්
සුළු සේවකයින්
සුළු සේවකයින්
සුළු සේවකයින්
සුළු සේවකයින්
සුළු සේවකයින්
සුළු සේවකයින්

1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

- චාරිමාර්ග දෙපාර්තමේන්තුව

1.6. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන/ අරමුදල්

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
- චාරිමාර්ග කළමනාකරණ අංශය
- ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය
- මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම
- ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව
- මහවැලි උපදේශක සේවා කාර්යාංශය

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු

අ) ව්‍යාපෘතියේ නම	ආ) දායක නියෝජිතායතනය	ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම් (රු.මි.)	ඈ) ව්‍යාපෘති කාල සීමාව
මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP)	ආසියානු සංවර්ධන බැංකුව හා ශ්‍රී ලංකා ජනරජය	160,356 (සංශෝධිත) (මූලිකව ඇ.ඩො.මි. 675)	2015 – 2024
උමාඔය බහුකාර්යය සංවර්ධන ව්‍යාපෘතිය (2015 වසරේ සිට දේශීය අරමුදල් යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ)	ශ්‍රී ලංකා ජනරජය හා ඉරානයේ ආර්ථික සංවර්ධන බැංකුව	89,800 (ඇ.ඩො.මි.514.06+ රු.මි. 98,361.70)	2010 මාර්තු - 2023 ජුනි
මොරගහකන්ද සහ කළුගඟ ජලාශ ව්‍යාපෘතිය	CDB, SFD, KFAED, OFID, GOSL	117,700 (ඇ.ඩො.මි. 770.41)	2007 – 2023 මාර්තු
දේශගුණික බලපෑම් අවම කිරීමේ බහුඅදියර වැඩසටහන	ලෝක බැංකු ණය පහසුකම්	16,750	2021 – 2026 වසර 6
භූගත ජල විමංසන ජාලයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය	නෙදර්ලන්තයේ රාබෝ බැංකුව විසින් ලබා දෙන ලද ණය මුදලකි	5,613.00 (යුරෝ මිලියන 20.63)	2018 මාර්තු - 2022 දෙසැම්බර්
ඒකාබද්ධ ජල කළමනාකරණ ප්‍රවේශයක් තුළින් ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ කුඩා ඉඩම් හිමි ගොවීන්ගේ දේශගුණික විපර්යාසවලට මුහුණදීමේ ශක්තිය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (වැව්ගම් පුබුදුව - CRIWMP)	හරිත දේශගුණික අරමුදල සහ ශ්‍රී ලංකා ජනරජය	9,114 (ඇ.ඩො.මි. 52.08)	2017 – 2024
ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)	ලෝක බැංකුව	14,199.43	2021 - 2026

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

2.1.1. විශේෂ කරුණු හා ප්‍රගතිය

තිරසාර ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය තුළින් සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීමේ දැක්ම පෙරදැරිව, ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය තුළින් බහුවිධ අවශ්‍යතා ඉටුකරමින් ප්‍රජාවගේ හා පරිසරයේ යහපැවැත්ම සැලසීම උදෙසා වාරිමාර්ග අමාත්‍යාංශය නිරන්තරයෙන් කටයුතු කරයි. මෙම අමාත්‍යාංශය යටතේ ඇති වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් දිවයින පුරා ඇති වැව් හා වාරිමාර්ග පද්ධති මෙහෙයුම්, නඩත්තු හා සංරක්ෂණ කටයුතු වලට අමතරව වාරිමාර්ග පද්ධතීන් පුළුල් කිරීමට ද උරදී සිටින වාරිමාර්ග අමාත්‍යාංශය හුදෙක් වාරිමාර්ග සංවර්ධනයට පමණක් සීමා නොවී ජාතික අවශ්‍යතාවයක් වන පානීය ජලය හා ජල විදුලිය උත්පාදනය ආදී බහුවිධ අවශ්‍යතාවන් සැපයීම ඉලක්ක කරමින් කටයුතු කරයි.

අර්බුදකාරී තත්ත්වයන් රැසක් මැද වුවද වාරිමාර්ග අමාත්‍යාංශය විසින් සුවිශේෂී අරමුණු රැසක් ඉටුකරගත් වසරක් ලෙස 2022 වර්ෂය හඳුන්වා දිය හැකිය. උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියෙහි මූලස්ථායී වැඩ සංචරකයෙහි 97%ක පමණ වැඩ කොටසක් මේ වන විට නිමකර ඇති අතර 2023 වර්ෂයේ මැද භාගය වන විට ව්‍යාපෘතිය නිම කිරීමට සැලසුම් කර ඇත.

ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනයෙහි, යුරෝපා සංගමයෙහි හා ශ්‍රී ලංකා රජයේ මූල්‍ය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කිරීමට යෝජිත මුන්දෙණිආරු ගංහා නිම්න සංවර්ධන ව්‍යාපෘතියෙහි ණය ගිවිසුම් අත්සන් කිරීමට අවශ්‍ය මූලික වැඩ කොටස් 2022 වර්ෂය තුළ අවසන් කරන ලදී. කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතියේ ඉදිකිරීම් දැනටමත් ගිවිසුම්ගත කොන්ත්‍රාත්කරුවන් මගින් ඉටුකර ගැනීම සඳහා වන සම්මුති සාකච්ඡා 2021 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර එම කටයුතු 2022 වර්ෂයේදී නිමකර ඉදිරි කටයුතු සඳහා මුදල් අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. මෙම ව්‍යාපෘතීන්ගේ ඉදිකිරීම් හැකි ඉක්මනින් ආරම්භ කිරීමට වාරිමාර්ග අමාත්‍යාංශයේ අපේක්ෂාව වෙයි.

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන, ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය හා දේශගුණික බලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය යන ව්‍යාපෘතීන්ගේ කටයුතු ආසියානු සංවර්ධන බැංකුව හා ලෝක බැංකුව සමග සාකච්ඡා කොට ප්‍රතිඅරමුණුගත කිරීමට කටයුතු කර ඇත. මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහනෙහි ප්‍රතිඅරමුණුගත අරමුදල් වලින් ඇමරිකානු ඩොලර් මිලියන 40ක පමණ මුදලක් වැය කරමින් මෙරට මියුරේට් ඔෆ් පොටෑෂ් (MOP) අවශ්‍යතාවයෙන් මෙට්‍රික් ටොන් 40,000ක ප්‍රමාණයක් ප්‍රසම්පාදනයට අවශ්‍ය දායකත්වය වාරිමාර්ග අමාත්‍යාංශය විසින් ලබා දී ඇත.

මොරගහකන්ද ජලාශය ඉදිකිරීම හේතුවෙන් දැනට මහවැලි පද්ධතිය තුළ අතිරික්තව ඇති ජලය මින්නේරිය වැව වෙත හැරවීමත් එම තත්ත්වය හේතුවෙන් වැවෙහි ජල ස්කන්ධය දීර්ඝ කාලයක්

ඉහළ මට්ටමක පැවතීමත් නිසා වන අලින් සම්බන්ධයෙන් මතුවූ ගැටලුව විසඳීම සඳහා වාරිමාර්ග අමාත්‍යාංශය විසින් මැදිහත්වීමක් සිදු කරන ලදී.

2022 වර්ෂය තුළදී මෙරට ඇති වූ විදුලි අර්බුදය කළමනාකරණය කිරීම උදෙසා ජල විදුලිබල උත්පාදනයට අවශ්‍ය ජලය නිසි කළමනාකරණ ක්‍රමවේද ඔස්සේ සැපයීමට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය කටයුතු කර ඇත.

වාරිමාර්ග ආඥාපනතට අවශ්‍ය සංශෝධන සිදු කිරීම, වාරිමාර්ග රක්ෂිත සීමා ප්‍රකාශයට පත් කිරීම හා නව ගංවතුර අවදානම් කළමනාකරණය කිරීමේ පනතක් ස්ථාපනය කිරීම යන කරුණු සම්බන්ධයෙන් නිර්දේශය ලබා දීම සඳහා වාරිමාර්ග අමාත්‍යාංශය විසින් කමිටුවක් පත් කරන ලදී. මේ අනුව එම කමිටුව විසින් නිර්දේශිත වාරිමාර්ග පද්ධතීන්ගේ හා ස්වභාවික දියමාර්ග වල රක්ෂිත සීමා රජයේ ඉඩම් ආඥාපනත යටතේ ප්‍රකාශයට පත් කිරීමට අදාළ ගැසට් නිවේදනයෙහි කෙටුම්පත ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කරන ලදි. නව ගංවතුර අවදානම් කළමනාකරණය කිරීමේ පනත නීතිකෙටුම්පත් සම්පාදක වෙතින් කෙටුම්පත් කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2022 වර්ෂයේදී ලබා දෙන ලදී.

වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ප්‍රධාන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය පහත පරිදි සාරාංශගතකොට දැක්විය හැකිවේ.

1. මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 160,356 සංශෝධිත වැඩසටහන් පිරිවැය (ඇ.ඩො. මි. 976) ආසියානු සංවර්ධන බැංකුව විසින් සහතික කළ ණය මුදල (ඇ.ඩො. මි. 561)	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මාතලේ, නුවර, කුරුණෑගල, අනුරාධපුරය, පොළොන්නරුව
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ආසියානු සංවර්ධන බැංකුව සහ ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව / වගා ත්‍රීව්‍රතාවය**	ජලාශ ධාරිතාව (ඝන මීටර මිලියන) • උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය - ඝන මීටර මිලියන 191 • වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය - හෙක්ටයාර් 13,000 • උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය - හෙක්ටයාර් 12,300 • මිණිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය - හෙක්ටයාර් 7,500
ව්‍යාපෘති කාලය	2015 - 2024	**ප්‍රතිලාභීන්**	<u>අදියර 1</u> • වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය - 300,000 • උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය - 700,000 • මිණිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය - 62,000
ප්‍රතිපාදන 2022	රු.මි. 38,000	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 43,000
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 68,286.34	**සමස්ථ භෞතික ප්‍රගතිය**	35.4%
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 32,016.34		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• වෑමැඩිල්ල වම් ඉවුරු ඇළ නබඩගහවත්ත දක්වා වැඩිදියුණු කිරීම (කි.මී. 0+000 සිට කි.මී. 5+250) සහ නව වාන් ඇළ ඉදිකිරීම (කි.මී.0+000 සිට කි.මී.0+600) NWPC-NCB-1 කොන්ත්‍රාත් පැකේජය භෞතිකව නිමකර ඇත. • 2022/23 මහ කන්නය සඳහා ගොවීන් වෙත MOP පොහොර මෙට්‍රික් ටොන් 41,800ක් සැපයීම - බෙදා හැරීම සිදු කෙරේ. • දැනට ක්‍රියාත්මක වෙමින් පවතින කොන්ත්‍රාත් පැකේජවල 2022 දෙසැම්බර් මස 31 වන දින දක්වා භෞතික ප්‍රගතිය පහත පරිදි වේ, ➢ MLBCRP-ICB 1 - වම් ඉවුර සහ දකුණු ඉවුරු ඇළ මාර්ග සඳහා ජල පාලනය සහ මිනුම් පහසුකම් ඇතුළුව මිණිපේ අමුණ එසවීම - 10% ➢ NWPCP-ICB-2 නැබඩගහවත්ත සිට මහකිතුළ පිවිසුම් උමඟ දක්වා ප්‍රධාන ඇළ ඉදිකිරීම (කි.මී. 5+250 සිට කි.මී.22+300) - 15% ➢ NWPCP-ICB-1 මහකිතුළ පිවිසුම් උමඟ, මහකිතුළ, මහකිරුළ ජලාශ හා මහකිතුළ, මහකිරුළ යා කෙරෙන පෝෂක ඇළ මාර්ගය ඉදිකිරීම. – 1.26%		

	➢ UEC-ICB-2B - කළු ගඟ / මොරගහකන්ද යා කරන ඉහල ඇළහැර ඇළ කි. මී. 8.8 උමං දෙකක් ඇතුළත්ව ඉදිකිරීම (කි.මී 0+100 සිට 08+830 km) - 12% ➢ UEC-ICB-2A- ඉහළ ඇළහැර ඇළෙහි කි.මී.27+509 සිට කි.මී.55+600 දක්වා උමඟ ඉදිකිරීම - 5%
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහනේ අදියර 1 අවසන් වීමෙන් පසු ආසන්න වශයෙන් ප්‍රතිලාභී පවුල් 185,000ක ගේ පමණ පානීය ජල අවශ්‍යතාවයන් සපුරාලීමට හැකි වනු ඇත.(NWPCP - ප්‍රතිලාභී පවුල් 35,000, සහ NCPCP- ප්‍රතිලාභී පවුල් 150,000 කි.) • ඉහත ආකාරයට පානීය ජලය සපයා වත්මන් වකුගඩු රෝගය පිළිබඳ ගැටලුවට පිළියම් යෙදීම • මීටර් 3.5කින් මිණිපේ අමුණ එසවීම තුළින් එහි ඉහළ කොටසෙහි ජලය රඳවා ගැනීමට හැකි වීමෙන් වාර්ෂිකව ගිගාවොට් පැය 9ක ධාරිතාවයකින් යුත් අමතර විදුලිබල උත්පාදනයක් කිරීමට හැකිවීම. • වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසු කෘෂිකාර්මික කටයුතු සඳහා ප්‍රදේශයේ පිහිටි ප්‍රධාන වැව් හතකට සහ කුඩා වැව් 350කට ජලය සැපයීම. • 2022/23 මහ කන්නය සඳහා ගොවීන්ට වගා කිරීමට අවශ්‍ය MOP පොහොර මෙට්‍රික් ටොන් 41,800ක් ලබා දීම. • මහවැලි කලාපයේ - B,C,D & G ප්‍රදේශ වල අනෙකුත් ක්ෂේත්‍ර භෝග නිෂ්පාදනය ව්‍යාප්ත කිරීම (මිරිස්, සෝයා බෝංචි, බඩ ඉරිඟු, ලොකු ඵෑණු) සහ බිත්තර නිෂ්පාදනය ව්‍යාප්ත කිරීම - පොලිටනල් යටතේ වසරකට මිරිස් බීජ කිලෝග්‍රෑම් 1000ක් නිෂ්පාදනය කරන අතර එය වාණිජ ඉඩම් හෙක්ටයාර 2,500ක් වගා කිරීමට උපකාරී වේ. - වැසි ආවරණ යටතේ වසරකට ලොකු ඵෑණු බීජ කිලෝග්‍රෑම් 9,000ක් නිෂ්පාදනය කරන අතර හෙක්ටයාර් 1,000ක වාණිජ ඉඩම් වගා කිරීමට උපකාරී වේ. - සුහුරු කෘෂිකාර්මික පැකේජය යටතේ වියළි මිරිස් මෙට්‍රික්ටොන් 200ක්, සෝයා මෙට්‍රික්ටොන් 240ක්, බඩඉරිඟු මෙට්‍රික්ටොන් 9360ක් සහ ලොකු ඵෑණු මෙට්‍රික්ටොන් 2,000ක් වාර්ෂිකව නිෂ්පාදනය කිරීම. - එක් කණ්ඩායමකින් බිත්තර මිලියන 15ක් නිෂ්පාදනය කිරීම (සති 80) • ව්‍යාපෘති ප්‍රදේශයට අයත් ගම්මානයන්හි අත්පත් කරගත් ඉඩම් සඳහා රජය විසින් අනුමත කරන ලද ඉතා ආකර්ශනීය සහ සාධාරණ වන්දි පැකේජ මගින් ප්‍රජාවට ප්‍රතිලාභ ලබා දීම. ඒ අනුව ව්‍යාපෘති හේතුවෙන් විපතට පත් පුද්ගලයින් 646 දෙනෙකුට රුපියල් මිලියන 660ක වන්දි මුදලක් හිමි විය. • ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පරිසරයට සිදුවන හානිය අවම කර ගැනීම සඳහා හෙක්ටයාර් 600ක භූමි ප්‍රමාණයක් නැවත වන වගාව යටතට ගැනෙන අතර මේ වන විට හෙක්ටයාර් 145ක ප්‍රමාණයක නැවත වන වගාව අවසන් කර ඇත. • ඇළ මාර්ග පද්ධතිය ඔස්සේ ප්‍රවේශ මාර්ග වැඩිදියුණු කිරීම. • දේශගුණික විපර්යාස නිසා ඇතිවන සංකූලතා අවම කිරීම • ව්‍යාපෘති අයත් ප්‍රදේශයන්ගේ භූගත ජලය වැඩිදියුණු කිරීම සහ ගෙවතු වගාව වැඩිදියුණු කිරීම. • මිරිදිය ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීම සහ පරිසර හිතකාමී සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීම. • ඉදිකිරීම් කටයුතු හේතුවෙන් ව්‍යාපෘති ප්‍රදේශයේ ජනතාවට නව රැකියා අවස්ථා උදාවීම.

2. උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 80,447.50	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	බදුල්ල, මොණරාගල සහ හම්බන්තොට
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය හා ඉරානයේ ආර්ථික සංවර්ධන බැංකුව (EDBI)	**ජලාශ ධාරිතාව / වගා තීව්‍රතාවය**	• පුහුල්පොල වේල්ල ධාරිතාව - ඝන මීටර මිලියන 0.6 • ඩයරබා ජලාශය ධාරිතාව - ඝන මීටර මිලියන 0.9 දැනට පවතින ඉඩම් - හෙක්ටයාර 1500 අලුතින් සංවර්ධනය කළ ඉඩම් හෙක්ටයාර 4500 (මුළු වගා ඉඩම් - හෙක්ටයාර් 6000)
ව්‍යාපෘති කාලය	**මූලස්ථායී වැඩ -** 2010 මාර්තු – 2023 ජුනි	**ප්‍රතිලාභීන්**	ව්‍යාපෘතියේ පහල නිම්න සංවර්ධනය මගින් සෘජුව පවුල් 6,000කට ප්‍රතිලාභ අත්වේ. විදුලි බල උත්පාදනය මගින් සමස්ථ ජනතාවටම සෙත සැලසේ.
ප්‍රතිපාදන 2022	රු.මි. 4,200	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 3,600 (මූලස්ථායී වැඩ)
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 77,578.99	**සමස්ථ භෞතික ප්‍රගතිය**	97.39%
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 4,007.86		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	**මූලස්ථායී වැඩ - සමස්ථ භෞතික ප්‍රගතිය 97.34%** • පුහුල්පොල වේල්ල - 99.37% • ඩයරබා ජලාශය - 95.37% • සම්බන්ධිත උමඟ - 99.16% • පෙරඇර උමඟ - 98.88% • කැළඹුම් කුළුණ සහ කැළඹුම් ළිඳ - 96.87% • තිරස් පීඩන කුළුණ - 99.02% • බලාගාරය - 96.25% • ප්‍රධාන පිවිසුම් උමඟ සහ අනෙකුත් පිවිසුම් උමං - 98.30% • ස්විච් අංගනය - 95.50% • ප්‍රවේශ මාර්ගය සහ විකල්ප මාර්ග - 89.25% • විදුලි සම්ප්‍රේෂණ මග - 97.50% • පසු ආර උමඟ - 99.39%		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ ගිනිකොන දිග වියළි කලාපයේ ජල හිඟය සමනය කිරීම සඳහා උමා ඔය ද්‍රෝණියේ සිට කිරිඳි ඔය ද්‍රෝණියට වාර්ෂිකව අතිරික්ත ජලය ඝන මීටර මිලියන 145ක් උමාඔය ද්‍රෝණියේ ජල පරිහරණය කරන්නන් හා පරිසරයට බලපෑම් නොකර හරවා යැවීමයි.		

	• මොණරාගල දිස්ත්‍රික්කයේ නව ඉඩම් හෙක්ටයාර 4500කට ආසන්න ප්‍රමාණයක් සහ දැනට පවතින කෘෂිකාර්මික ඉඩම් හෙක්ටයාර 1500කට පමණ වාරි ජලය සැපයීම. • මොණරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල පානීය හා කාර්මික ජල අවශ්‍යතා සඳහා මීටර මිලියන 30ක් ලබා දෙනු ඇත. • මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය සහ තණමල්විල ප්‍රදේශවලට පානීය ජලය අලිකොටආර ජලාශයෙන් ලබා දෙනු ඇත. • මෙගාවොට් 120ක ධාරිතාවයකින් යුත් භූගත විදුලි බලාගාරය මගින් වාර්ෂිකව ජාතික විදුලිබල පද්ධතියට ගිගාවොට් පැය 290ක විදුලි බලයක් එක් කරයි. • තව ද, ජලය ඝන මීටර මිලියන 9ක් වාර්ෂිකව බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල ප්‍රදේශයට ඩයරබා ජලාශයෙන් සහ ඇටම්පිටිය ප්‍රදේශයට පුහුල්පොල ජලාශයෙන් ලබා දෙනු ඇත.

3. මොරගහකන්ද කළුගඟ ජලාශය ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 117,700	**ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක**	අනුරාධපුර, පොළොන්නරුව, ත්‍රිකුණාමලය, මාතලේ සහ කුරුණෑගල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය, සංවර්ධනය සඳහා සෞදි අරමුදල, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල, අරාබි ආර්ථික සංවර්ධන සඳහා කුවේට් අරමුදල	**ජලාශ ධාරිතාව / වගා තීව්‍රතාවය**	මොරගහකන්ද - ඝන මීටර මිලියන 570 කළුගඟ - ඝන මීටර මිලියන 250
ව්‍යාපෘති කාලය	2007 – 2023 මාර්තු	**ප්‍රතිලාභීන්**	මාතලේ, පොළොන්නරුව සහ අනුරාධපුරය දිස්ත්‍රික්ක වල ජනතාව
2022 සඳහා ප්‍රතිපාදන	රු.මි. 4,220.00	**2023 සඳහා ප්‍රතිපාදන**	රු.මි. 2,250.00
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 117,115.55	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	99.37%
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 3,667.00		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ඉඩම් අත්පත් කර ගැනීම සහ නැවත පදිංචි කිරීමේ කටයුතු ➢ ලග්ගල, පල්ලේගම හා නාඋල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වල හිමිකම් පරීක්ෂණ පැවැත්වීම හා වන්දි ගෙවීම. ➢ ඇළහැර හා කන්තලේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වල හිමිකම් පරීක්ෂණ පැවැත්වීම හා 10(i) වගන්තිය නිකුත් කිරීම. ➢ මෙයට අමතරව ලග්ගල, පල්ලේගම, කන්තලේ හා මැදිරිගිරිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වල 38 අතුරු විධානය යටතේ බුක්තිය භාරගැනීම.		

	• පහළ නිම්න සංවර්ධනය ➢ බෙදුම් ඇළ හා කෙත් ඇළ පද්ධති ඉදිකිරීම ➢ රිවර්ස්ටන් මාර්ගය ඉදිකිරීම සහ රිවර්ස්ටන් වනජීවී ප්‍රදේශයේ ගොඩනැඟිලි ඉදිකිරීම ➢ මොරගහකන්ද සහ රජාවෙල ජල පවිත්‍රාගාර ඉදිකිරීම ➢ වෙළඳ මාර්ග ඉදිකිරීම ➢ අලි පලවාහැරීමේ මෙහෙයුම් ➢ ගුරුවෙල බුබුල, මොරගහකන්ද නිල නිවාසය සහ රජාවෙල ජල නළ පද්ධති ඉදිකිරීම
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• ඝන මීටර මිලියන 557ක ධාරිතාවයෙන් යුතු මොරගහකන්ද ජලාශය • ඝන මීටර මිලියන 248ක ධාරිතාවයෙන් යුතු කළුගඟ ජලාශය • **විදුලි උත්පාදනය** - වසරකට ගිගාවොට් පැය 114.5ක ජල විදුලි නිෂ්පාදනයක් සිදු කිරීමට අපේක්ෂිතය. එමඟින් වාර්ෂිකව ඉන්ධන සඳහා පිරිවැය රු.මි. 1,545 ඉතිරිවේ. • පොදු පරිහරණය සඳහා ගොඩනැගිලි 465 • කි.මී. 276කින් යුත් මාර්ග පද්ධතිය • කි.මී. 330කින් යුත් ඇළ මාර්ග පද්ධතිය • කුඩා වැව් 11ක් ස්ථාපිත කිරීම • සුළු වැව් 20ක් ස්ථාපිත කිරීම • **කෘෂිකාර්මික කටයුතු සඳහා හෙක්ටයාර 5,000ක අමතර බිම් ප්‍රමාණයක් එක්වීම.** • **රට තුළ කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩිකිරීම.** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමත් සමඟ දැනට 100% සිට 154% පමණ වන වගා තීව්‍රතාව 181% දක්වා ඉහළ යනු ඇත. හෙක්ටයාරයකට වී අස්වැන්න වැඩි කිරීම ඇතුළු සෘජු ප්‍රතිලාභ මඟින් වාර්ෂිකව ටොන් 123,000ක අතිරේක කෘෂිකාර්මික නිෂ්පාදනයක් ලබා දෙනු ඇත. එමඟින් ලැබෙන වාර්ෂික ශුද්ධ කෘෂිකාර්මික ප්‍රතිලාභ රු.මි. 4,000ක් ලෙස ගණනය කර ඇත. • මාතලේ, පොළොන්නරුව, අනුරාධපුර සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කවලට පානීය හා කාර්මික ජල පහසුකම් සැපයීම. • **මිරිදිය ධීවර කර්මාන්තය** - සාමාන්‍ය මත්ස්‍ය නිෂ්පාදන විභවය වසරකට ටොන් 4,700ක් පමණ වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇති අතර වාර්ෂික ශුද්ධ ප්‍රතිලාභය රු.මි. 940කි. • **රැකියා අවස්ථා වැඩි කිරීම** - පුද්ගලයින් 650ක් සෘජුවම ව්‍යාපෘතියට බඳවා ගනු ලැබේ. මැණික් හා ස්වර්ණාභරණ, හෝටල් කළමනාකරණ හා ස්වයං රැකියා පුහුණු ආදිය පැවැත්වීමෙන්/ සංවිධානය කිරීමෙන් වැඩි තරුණ තරුණියන් පුහුණු කරනු ලැබේ. • **පාරිසරික සංචාරක ව්‍යාපාරය වැඩිදියුණු කිරීම** - වස්ගමුව ජාතික වනෝද්‍යානය, මින්නේරිය ජාතික වනෝද්‍යානය සහ රිවර්ස්ටන් ආදිය සංවර්ධනය කිරීමෙන් පරිසර සංචාරක ව්‍යාපාරය වැඩි දියුණු කිරීම. • **ගංවතුර පාලනය** - සෝමාවතිය සහ මනම්පිටිය ප්‍රදේශවල ඇති වූ ගංවතුර හානි පාලනය කිරීම

4. දේශගුණික බලපෑම් අවම කිරීමේ බහුඅදියර වැඩසටහන (CResMPA)

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 16,750	**ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක**	සියළුම දිස්ත්‍රික්ක
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ලෝක බැංකු ණය පහසුකම් / ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව / වගා තීව්‍රතාවය**	• වී ඔය බහුකාර්ය ජලාශය - ඝන මීටර මිලියන 49 • හෙක්ටයාර 25,000 පවුල් 35,000ක් (ප්‍රධාන වාරිමාර්ග හා මධ්‍යම මට්ටමේ වාරි පද්ධති/ ඇළවල් ප්‍රතිසංස්කරණය)
ව්‍යාපෘති කාලය	2021 - 2026	**ප්‍රතිලාභීන්**	• කාලගුණ සහ ගංවතුර අනතුරු ඇඟවීම් වැඩි දියුණු කිරීම - මිලියන 3.5ක ජනතාව • කැළණි ගං ද්‍රෝණියේ ගංවතුර සහ දේශගුණයට ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා බහුකාර්ය ජල යටිතල පහසුකම් 1,800,000ක ජනතාව • ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා වාරි ඉඩම් ගංවතුර හා නියඟයෙන් ආරක්ෂා කිරීම - පවුල් 35,000
ප්‍රතිපාදන 2022	රු.මි. 1,500	**2023 සඳහා ප්‍රතිපාදන**	රු.මි. 2,025
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 76.7	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	4.6%
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 58.60		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• වී ඔය බහුකාර්ය ජලාශය සඳහා සවිස්තරාත්මක ඉංජිනේරු සැලසුම්, ඇස්තමේන්තු සහ ටෙන්ඩර් ලේඛන සකස්කිරීම් සඳහා උපදේශකයෙකු බඳවා ගැනීම සඳහා අභිලාෂ කැඳවීම් (EOI) සිදුකර ප්‍රමුඛතා ගතකිරීම සිදු කරමින් පවතී. • වාරිමාර්ග දෙපාර්තුමේන්තුව සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ උපකරණ (ICT) සහ විද්‍යාගාර උපකරණ මිලදීගැනීමට ටෙන්ඩරය කැඳවා කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමට සූදානම් කිරීම. • වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙහි ජල විද්‍යා අංශයේ මෙහෙයුම් මැදිරිය සැලසුම් කිරීම සඳහා ICT උපදේශකයෙකු බඳවා ගැනීම සඳහා ටෙන්ඩර් ඇගයීම අවසන් කර සාකච්ඡාද අවසන් කර ඇත. • කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙහි ජල කාලගුණ විද්‍යා ජාලය නවීකරණය කිරීම සඳහා සැලසුම්, පිරිවිතර සහ ටෙන්ඩර් ලේඛන සකස්කිරීම සඳහා උපදේශන සමාගමක සේවය ලබා ගැනීම සඳහා ලෝක බැංකුවේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව අභිලාෂ කැඳවීමට සූදානම් කර ඇත.		

	• ශ්‍රී ලංකා කාලගුණ තොරතුරු ජාලය (SLWIN) සංවර්ධනය කිරීම මගින් දත්ත හුවමාරු කිරීම සහ බලපෑම් පදනම් අනතුරු ඇඟවීම සඳහා පොදු වේදිකාවක් නිර්මාණය කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපදේශකයකු බඳවා ගැනීමට අවශ්‍ය TOR සකස්කර ඇත. • පාරිසරික සහ සමාජ ආරක්ෂණ කළමනාකරණ රාමුව (ESSFW) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාලව සකස්කර ඇත. ඒ අනුව ESSFW සමඟ අනුගතව දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය සකස්කර ඇත. • කාර්ය මණ්ඩලයේ බහුතරයක් බඳවා ගැනීම අවසන් කර ඇත. ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය පිහිටුවන ලදී. • ප්‍රධාන සහ මධ්‍යම වාරිමාර්ග යෝජනා ක්‍රමවල අවදානමට ලක්විය හැකි ජනතාවගේ දේපල ගංවතුරෙන් සහ නියඟයෙන් ආරක්ෂා කිරීම සඳහා ඉක්මන් ප්‍රතිලාභ සහතික කරන හදිසි පිලිසකර කිරීම සඳහා, ව්‍යාපෘති සැලැස්ම, විෂය පථය නැවත සලකා බලා යෝජනාවක් සකස් කරන ලදී.
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• කාලගුණ සහ ගංවතුර අනතුරු ඇඟවීම් වැඩි දියුණු කිරීම තුළින් මිලියන 3.5ක ජනතාවක් ආරක්ෂා කිරීමට හැකිවීම. • කැළණි ගං ද්‍රෝණියේ ගංවතුර සහ දේශගුණයට ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා බහුකාර්ය ජල යටිතල පහසුකම් තුළින් 1,800,000ක ජනතාවකට ප්‍රතිලාභ ලැබීම. • කැළණි ගං ද්‍රෝණියේ වාර්ෂික සාමාන්‍ය ගංවතුර හානිය, ඇ.ඩො. මිලියන 78 දක්වා අඩු කිරීම. • පවුල් 35,000කගේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා වාරි ඉඩම් හෙක්ටයාර 25,000ක් ගංවතුර හා නියඟයෙන් ආරක්ෂා කිරීම.

5. ඵලදායිතා ප්‍රවර්ධන හා වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PEISEIP)

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 18,500	**ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක**	අම්පාර, අනුරාධපුර, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, ගම්පහ, හම්බන්තොට, මහනුවර, කුරුණෑගල, මන්නාරම, මාතලේ, මාතර, මොණරාගල, නුවරඑළිය, පොළොන්නරුව, පුත්තලම, රත්නපුර, ත්‍රිකුණාමලය, වව්නියාව
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව / වගා තීව්‍රතාවය**	ව්‍යාපෘතියේ විෂය පථය : ව්‍යාපෘතියේ සංරචකයන් 04 වන, 1.වාරිමාර්ග පද්ධති පුනරුත්ථාපන සංරචකය (IIRC) 2.ගොවිපල සංවර්ධන සංරචකය (OFDC) 3.කෘෂිකාර්මික ඵලදායිතාව ඉහළ නැංවීමේ සංරචකය (APIC) 4.වාරි කළමනාකරණය සඳහා හැකියාවන් හා ධාරිතාවන් වැඩි කිරීමේ සංරචකය (ICTMC) යනාදිය මඟින් ඇති කරනු ලබන භූමියේ ඵලදායිතාව, ජලයේ ඵලදායිතාව හා බෝග ඵලදායිතාව ඉහළ නැංවීමයි. මහා පරිමාණ වාරිමාර්ග ව්‍යාපාර 40ක හා මධ්‍යම පරිමාණ වාරිමාර්ග ව්‍යාපාර 40ක වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ ඵලදායිතාව වැඩි දියුණු කිරීම මඟින් ගොවි ප්‍රජාවේ ආදායම ඉහළ නැංවීමත් එමගින් ව්‍යාපෘති ප්‍රදේශයේ වෙසෙන ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමත් මෙම ව්‍යාපාරයේ අරමුණයි.
ව්‍යාපෘති කාලය	2017 - 2022	**ප්‍රතිලාභීන්**	98,000
ප්‍රතිපාදන 2022	රු.මි. 100.00	**2023 සඳහා ප්‍රතිපාදන**	2022 අවසානයේ ව්‍යාපෘතිය නිමකර ඇත.
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 1,706.81	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	13.16%
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 78.66		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	වාරි යටිතල පහසුකම් පුනරුත්ථාපනය අඛණ්ඩව සිදුකිරීම, කමත් ඉදිකිරීම අඛණ්ඩව සිදුකිරීම, ගොවි ආර්ථිකය ඉහළ නැංවීම, ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු වී බීජ නිෂ්පාදනය සහ අම්පාර, අනුරාධපුර, බදුල්ල, කොළඹ, මඩකළපුව, නුවර, පුත්තලම, ත්‍රිකුණාමලය, ගාල්ල, හම්බන්තොට, නුවර, කුරුණෑගල, මොණරාගල, පොළොන්නරුව සහ මන්නාරම වාරිමාර්ග අධ්‍යක්ෂ කලාප වල කාබනික පොහොර නිෂ්පාදනය.		

ව්‍යාපෘතියේ සමස්ථ ප්‍රතිලාභ	• හෙක්ටයාර් 72,882 අයත් යටිතල පහසුකම් පුනරුත්ථාපනය කිරීම මගින් ගොවිපවුල් 97,832ට සහන සැලසීම. • ප්‍රධාන ඇළ කි.මී. 110, බෙදුම් ඇළ කි.මී. 280, ක්ෂේත්‍ර ඇළ කි.මී. 480 ඇතුළත් ඇළ පද්ධති පුනරුත්ථාපනය. • කුඩා පාලම් සහ බෝක්කු ඇතුළත්ව ගොවිපල මාර්ග කි.මී. 320ක් සංවර්ධනය. • තෝරාගත් ව්‍යාපෘති 80ක වගා තීව්‍රතාවය 1.5/1.8 සිට 2.0 දක්වා ඉහළ නැංවීම තුළින් පවුල් 98,000ක පමණ ආදායම වැඩිදියුණු කිරීම. • තෝරාගත් ව්‍යාපෘති 80ක ජලමිනුම් පද්ධතියක්, මිනුම් උපකරණ, සන්නිවේදන උපකරණ සහ දත්ත සකසන උපකරණ සහිතව ස්ථාපනය කිරීම. • වාරි පද්ධති 25ක GIS සිතියම් ගත කිරීම, ගොවි වෙළඳපොල 2ක්, සහ වැඩිදියුණු කළ කමත් 50ක් සංවර්ධනය.

6. ඒකාබද්ධ ජල කළමනාකරණ ප්‍රවේශයක් තුළින් ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ කුඩා ඉඩම් හිමි ගොවීන්ගේ දේශගුණික විපර්යාසවලට මුහුණදීමේ ශක්තිය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (වැව්ගම් පුබුදුව - CRIWMP)

ඇස්තමේන්තුගත මුදල	9,114.00 (රු. 175 = ඇ. ඩො.)	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අනුරාධපුර, කුරුණෑගල, පුත්තලම, පොළොන්නරුව, වවුනියාව, මන්නාරම, ත්‍රිකුණාමලය
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	හරිත දේශගුණික අරමුදල ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා තීව්‍රතාවය**	සුළු වාරි පද්ධති 325 හෙක්ටයාර 5,000
ව්‍යාපෘති කාලය	2017 ජූනි - 2024 ජූනි අවුරුදු 07	**ප්‍රතිලාභීන්**	1,950,374
ප්‍රතිපාදන 2022	රු.මී. 2,050	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මී. 2,930
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මී : 5,603	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	58.00%
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මී 1,187		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ග්‍රාමීය වාරිමාර්ග පද්ධති (ග්‍රා.වා.ප) යටතේ සුළු වැව් 33ක උඩුගං සංවර්ධන කටයුතු ආරම්භ කිරීම (ප්‍රගතිය 45%) • අර්ධ ලෙස නිම කර තිබූ ග්‍රාමීය වාරිමාර්ග පද්ධති 27ක උඩුගං සංවර්ධන කටයුතු සම්පූර්ණයෙන් නිම කිරීම • ග්‍රාමීය වාරිමාර්ග පද්ධති 16ක සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කිරීම - සින්නකුන්විකුලම් එල්ලංගා පද්ධතිය - මන්නාරම • ග්‍රාමීය වාරිමාර්ග පද්ධති 167ක මෙහෙයුම් සහ නඩත්තු උපකරණ ලබා දීම සහ මෙහෙයුම් සහ නඩත්තු කිරීම පිළිබඳව ගොවීන් පුහුණු කිරීම • ගොවිජන සේවා මධ්‍යස්ථාන 35ක් දේශගුණික උපදේශණ සේවා සැපයීමෙහි දැනුම් මධ්‍යස්ථාන ලෙස ශක්තිමත් කිරීම (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපකරණ සැපයීම මගින්)		

	• ගොවීන් 459204 ක් සඳහා දේශගුණික කෘෂිකාර්මික උපදේශණ බෙදාහැරීම • රට තුළ උද්ගතව ඇති ආහාර හිඟය විසඳීම සඳහා, විශේෂ කඩිනම් කෘෂිකර්ම වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම (දිස්ත්‍රික්ක 07 ක) - අක්කර 1820ක වෙනත් ක්ෂේත්‍ර බෝග වගාව - ගෙවතු 400ක් ශක්තිමත් කිරීම - කුකුළු ඒකක 94ක් පිහිටුවීම • වැසිජල ටැංකි පද්ධති ස්ථාපිත ගෘහ ඒකක 381ක ගෙවතු වගා ස්ථාපිත කිරීම - පළතුරු පැල 59835ක් බෙදා හැරීම • ග්‍රාමීය වාරි පද්ධති 12ක මත්ස්‍ය වගා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සහ ග්‍රාමීය වාරි පද්ධති 42ක මත්ස්‍ය වගා වැඩසටහන ආරම්භ කිරීම • ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමඟ නල එලීමේ උප ව්‍යාපෘති 12ක් ආරම්භ කිරීම • වැසි ජලය රැස් කිරීමේ පද්ධති 973 ක් ස්ථාපනය කිරීම. • දැනට කෘෂි කාලගුණික උපකරණ සවි කර ඇති ස්ථාන වල දත්ත රැස් කිරීම සහ ජල කළමනාකරණ උපදේශන බෙදා හැරීම
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• ග්‍රාමීය වාරිමාර්ග පද්ධති 325ක් වැඩි දියුණු කිරීම සහ දේශගුණික සුහුරු කෘෂිකාර්මික පිළිවෙත් මඟින් සුළු වාරි පද්ධති වල වගා තීව්‍රතාවය වැඩි කිරීම. (0.8 සිට 1.6 දක්වා) • දේශගුණයට ඔරොත්තු දෙන, විමධ්‍යගත ජල කළමනාකරණ විසඳුම් වන ග්‍රාමීය ජල සම්පාදන ක්‍රම 11ක් පිහිටුවීම, වැඩි දියුණු කළ ජල පිරිපහදු පද්ධති 125ක් ස්ථාපනය සහ වැසි ජල රැස්කිරීමේ ටැංකි පද්ධති 4,000ක් ස්ථාපනය හරහා අවදානමට ලක්විය හැකි ප්‍රජාවට වසර පුරා සුරක්ෂිත පානීය ජලය සැපයීම. • ඵලදායී කාලගුණික තත්ත්ව අධීක්ෂණ පද්ධති ස්ථාපනය කිරීම, කෘෂි කාලගුණ උපදේශන බෙදා හැරීම, පූර්ව අනතුරු ඇඟවීම් පද්ධති ශක්තිමත් කිරීම සහ ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වැඩි දියුණු කිරීම මගින් ජල කළමනාකරණය සහ ගංවතුර සහ නියඟයේ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ගේ ඒ සඳහා අනුවර්තනය වීමේ හැකියාව වැඩි දියුණු කිරීම.

7. තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 31,494	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්කය**	බදුල්ල, මහනුවර
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාවය/ වගා තීව්‍රතාවය**	• ඝන මීටර මිලියන 15.6 • බත්මැඩිල්ල ව්‍යාපාරයේ පවතින හෙක්ටයාර 810 නව හෙක්ටයාර 400 • මිනිපේ වම් ඉවුර ව්‍යාපාරයේ අර්ධ වශයෙන් හෙන්ටයාර 8000ක්
ව්‍යාපෘති කාලය	2021 - 2025	**ප්‍රතිලාභීන්**	පවුල් 10,000
මූල්‍ය ප්‍රතිපාදන 2022	රු.මි. 350	**2023 වසර සඳහා මූල්‍ය ප්‍රතිපාදන**	රු.මි. 500*

සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 585.31	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	14.00%
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 197.22		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන්	• ඉඩම් අත්පත් කරගැනීම • දකුණු ඉවුර පාර ඉදිකිරීම • උමාඔය පාලම යාවත්කාලීන කිරීම • ආරම්භ කරන ලද නැවත වන වගාව • මැනුම් කටයුතු • විමර්ශන සහ විස්තරාත්මක සැලසුම් කිරීම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• උමාඔය කිරිඳි ඔයට හැරවීම නිසා වගා කළ නොහැකි වන පහළ බෑවුමේ බත්මැඩිල්ල, මිනිපේ වම් ඉවුර ඇතුලු හෙක්ටයාර 400ක් සඳහා කන්න දෙකක් සඳහා ජලය සැපයීම. • ජල විදුලි උත්පාදනය මඟින් වාර්ෂිකව ගිගාවොට් පැය 51.6 ජාතික විදුලි පද්ධතියට එක් කිරීම. • පානීය ජල සැපයුම • ධීවර කර්මාන්තය දියුණු කිරීම. • ඌව පරණගම සිට කන්දකැටිය දක්වා මාර්ගය වේල්ල මතින් ඉදිකිරීමෙන් දුර ප්‍රමාණය කි.මී. 70ක් පමණ අඩුවීම. • සංචාරක කර්මාන්තය දියුණු කිරීම. • මහවැලි පද්ධතියට රොන්මඩ එකතුවීම පාලනය කිරීම.		

* ජාතික මෙහෙයුම් මැදිරියේ අවදානයට ලක්ව ඇත.

8. පහළ මල්වතු ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 22,900.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අනුරාධපුර, මන්නාරම සහ වවුනියාව
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව වගා තීව්‍රතාවය**	ඝන මීටර මිලියන 209 හෙක්ටයාර 13,472
ව්‍යාපෘති කාලය	2016 - 2024	**ප්‍රතිලාභීන්**	අනුරාධපුර, වවුනියාව සහ මන්නාරම දිස්ත්‍රික්ක වල පවුල් 10,000
ප්‍රතිපාදන 2022	රු.මි. 500.00	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 550.00*
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 953.33	**සමස්ථ භෞතික ප්‍රගතිය**	4.28 %
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 495.64		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• වේල්ල ඉදිකිරීම. • නිල නිවාස සහ සංචාරක බංගලාව ඉදි කිරීම අවසන් කර ඇත. • පිටවාන ඉදිකිරීම (කැණීම්). • ආදර්ශ වාරි ගොවිපළ ඉදිකිරීම. • දකුණු සහ වම් ඉවුරෙහි පහළ නිම්න සංවර්ධන සැලසුම් වැඩ.		

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• යෝධ වැව සහ අකතමුරිප්පු වැව යටතේ නව වාරි ඉඩම් හෙක්ටයාර 1,052කට (කුඹුරු සහ වෙනත් ක්ෂේත්‍ර බෝග) සහ දැනට වගා කළ හැකි ඉඩම් හෙක්ටයාර 12,420කට වාරි පහසුකම් සැපයීම. • වවුනියා, අනුරාධපුර සහ මන්නාරම යන දිස්ත්‍රික්ක වල වාර්ෂික ගෘහස්ථ ජල ඉල්ලුම සපුරාලීම සඳහා ජලය ඝනමීටර් මිලියන 27ක් සැපයීම. • ජාතික විදුලි බල පද්ධතියට වාර්ෂිකව ගිගාවොට් පැය 4.68ක් එක්කිරීම. • සංචාරක කර්මාන්තය දියුණු කිරීම. • නව නගර සැලසුම් ව්‍යාපෘතිය යටතේ තන්තිරිමලේ ප්‍රදේශය සංවර්ධනය කිරීම. • වවුනියා සහ මන්නාරම දිස්ත්‍රික්කයන් හි ගංවතුර පාලනය. • සූර්යය බලශක්ති ව්‍යාපෘති හඳුන්වාදීම. • උස්සාන වාරි ව්‍යාපෘති ඇතිකිරීම. • ව්‍යාපෘති කාලසීමාව තුළ නව රැකියා අවස්ථා උත්පාදනය. • ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය. • වනජීවී සංචරණයට ඉඩ සැලසෙන ලෙස වන රක්ෂිත / වනජීවී රක්ෂිත වැඩි දියුණු කිරීම සහ නැවත වන වගාව. • අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම. • ශක්තිමත් කරන ලද ගොවිජන සේවා ක්‍රියාකාරකම් සහ ආයතනික සංවර්ධන කටයුතු කිරීම.

* ජාතික මෙහෙයුම් මැදිරියේ අවදානයට ලක්ව ඇත.

9. ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 5,054	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	ගාල්ල, මාතර, හම්බන්තොට
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව / වගා තීව්‍රතාවය**	ඝණ මීලී මීටර් 12/0.16/11
ව්‍යාපෘති කාලය	2017 - 2022	**ප්‍රතිලාභීන්**	පවුල් 75,000 පමණ
ප්‍රතිපාදන 2022	රු.මි. 25	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 15*
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 4,090	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	92.50% (අදියර 01)
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 19.00		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ශක්‍යතා අධ්‍යයනය නිම කොට අවසන් වාර්ථාව අමාත්‍යාංශ ලේකම් වෙත යොමුකර ඇත. • පරිසර බලපෑම් ඇගයීම් අධ්‍යයනයේ අවසන් කෙටුම්පත් වාර්තාව 2022 දෙසැම්බර් 09 වන දින ලැබී ඇත. එය තාක්ෂණික ඇගයීම් කමිටුවේ අධ්‍යයනයන් සඳහා යොමුකර ඇත		

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	පිටදෙනිය හා කොටපොල අමුණු ඉදිකිරීම, පිටදෙනිය සිට කොටපොල දක්වා උමාං මාර්ගයක් ඉදි කිරීම, කොටපොල සිට අම්පනාගල දක්වා උමාං මාර්ගයක් ඉදි කිරීම, අම්පනාගල ජලාශය ඉදිකිරීම, අම්පනාගල සිට මුරුතවෙල දක්වා උමාං මාර්ගයක් ඉදි කිරීම, මුරුතවෙල සිට චන්ද්‍රිකා වැව දක්වා ඇල මාර්ගය ඉදි කිරීම තුළින්; • වාරි වපසරිය හෙක් 5,000; පවුල් 50,000කට ප්‍රතිලාභ සැලසේ. • පානීය/ කර්මාන්ත සඳහා ජලය සැපයීම ඝන මීලී මීටර 122 • වාර්ෂිකව ගිගාවොට් පැය 65ක ජල විදුලි උත්පාදනය

* ජාතික මෙහෙයුම් මැදිරියේ අවදානයට ලක්ව ඇත.

10. මල්වතු ඔය, මාඳුරු ඔය සහ කුඹුක්කන් ඔය ගංගා ද්‍රෝණි ආශ්‍රිතව භූගත ජල විමංඝන ජාලයක් ස්ථාපිත කිරීමේ නියමු ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 5,613.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අනුරාධපුරය, පොළොන්නරුව, වවුනියාව, මඩකලපුව, මන්නාරම, මොණරාගල, අම්පාර, යාපනය හම්බන්තොට, බදුල්ල සහ පුත්තලම
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	නෙදර්ලන්තයේ රාබෝ බැංකුව / ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා ත්‍රිව්‍රතාවය**	-
ව්‍යාපෘති කාලය	2018 - 2022	**ප්‍රතිලාභීන්**	පොදු ජනතාව, තීරණ ගන්නා නිලධාරීන්, පර්යේෂකයින් සහ භූගත ජලය සම්බන්ධ පාර්ශවකරුවන්
ප්‍රතිපාදන 2022	රු.මි. 350.00	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	2022 අවසානයේ ව්‍යාපෘතිය නිමකර ඇත.
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 5,400.86	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	100%
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 538.96		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• පර්යේෂණ නල ළිං 34ක් ඉදිකිරීම. • පර්යේෂණ නල ළිං 65ක් සඳහා ආවරණ (well heads) ඉදිකිරීම. • පර්යේෂණ නල ළිං 87ක් සඳහා පර්යේෂණ උපකරණ සවි කිරීම. • අන්තර්ජාල දත්ත පද්ධතිය (web portal) ස්ථාපිත කිරීම. • දත්ත මධ්‍යස්ථානය පිහිටුවීම.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	තෝරාගත් ගංගා ද්‍රෝණි 03හි භූගත ජල විමංඝන ජාලයක් ස්ථාපිත කිරීම තුළින් එම ගංගා ද්‍රෝණිවල භූගත ජල කළමනාකරණය සිදු කිරීමේ ඉදිරි කටයුතු සඳහා ප්‍රයෝජනවත් වන භූගත ජලයේ ප්‍රමාණාත්මකතාවය සහ ගුණාත්මකභාවය පිළිබඳ තත්කාලීන දත්ත ලබාගැනීම.		

11. නුවරඑළියේ බැරැක්තැන්න වැව ප්‍රතිසංස්කරණය කිරීම

ඇස්තමේන්තුගත මුදල	රු. මි. 230	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	නුවරඑළිය
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා තීව්‍රතාවය**	ඝන මීටර මිලියන 3,000 හෙක්ටයාර 800

ව්‍යාපෘති කාලය	වසර 02	**ප්‍රතිලාභීන්**	පවුල් 3,000
ප්‍රතිපාදන 2022	රු. මි. 54.00	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු. මි. 30.00
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු. මි. 106.03	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	91.00%
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු. මි. 49.58		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• අධික මුල් සහිත ජලජ වල් පැලෑටි උදුරා දැමීම සහ ඉවත් කිරීම • වැවේ ඇති රොන් මඩ කැණීම සහ ඉවත් කිරීම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර 800ක් වන අතර ගොවි පවුල් 350ක් ප්‍රතිලාභ ලබයි • පවුල් 3000ක් සඳහා පානීය ජලය සපයයි		

12. ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)

ඇස්තමේන්තුගත මුදල	රු. මි. 14,199.43	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මුළු දිවයිනටම
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ලෝක බැංකුව ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා තීව්‍රතාවය**	ඝන මීටර මිලියන 3,667 හෙක්ටයාර 159,571
ව්‍යාපෘති කාලය	2021 - 2026	**ප්‍රතිලාභීන්**	පවුල් 466,404
ප්‍රතිපාදන 2022	රු. මි. 3,000.00	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු. මි. 3,000
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු. මි. 769.38	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	12.85%
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු. මි. 463.89		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	පහත සඳහන් පරිදි වැඩ, භාණ්ඩ සහ උපදේශන ආශ්‍රිත ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් ක්‍රියාකාරකම්: • උතුරු පළාත් සභාව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව - ඇළ මාර්ග සහ වේලි ප්‍රතිසංස්කරණ කොන්ත්‍රාත් පැකේජ 7ක් • ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය - ඇළ මාර්ග සහ වේලි ප්‍රතිසංස්කරණ කොන්ත්‍රාත් පැකේජ 7ක් • වාරිමාර්ග දෙපාර්තමේන්තුව - ඇළ මාර්ග සහ වේලි ප්‍රතිසංස්කරණ කොන්ත්‍රාත් පැකේජ 3ක් • ඇළ මාර්ග හා වේලි ප්‍රතිසංස්කරණ පිළිබඳ උපදේශන සේවා පැකේජ 7ක් • උපදේශන නොවන සේවා - පැකේජ 01 • භාණ්ඩ - පැකේජ 04		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• වගා බිම් තුළ හා වගා බිම්වලින් බැහැරව සිදුකරන පාංශු හා ජල සංරක්ෂණ වැඩසටහන් මගින් ඉහළ මහවැලි ජල පෝෂක ප්‍රදේශයේ වෙසෙන පවුල් ආසන්න වශයෙන් 110,000 පමණ ප්‍රතිලාභ ලබයි. • තෝරාගත් වේලි 36කට අදාළව වේලි ආපදාවට ලක්වීමේ අවදානම අඩුවීම සහ ජල සම්පත් කළමනාකරණය හා ජල භාවිතයේ මෙහෙයුම් කාර්යක්මතාවය ඉහළ නැංවීම.		

	• හානියට පත් ඇළ මාර්ග මගින් ජලය නාස්තිවීම අවම කිරීම හා වෙනත් ක්ෂේත්‍ර බෝග වගාව වැඩිදියණු කිරීම. • ප්‍රධාන ව්‍යාපෘති කාර්යයන් තුළින් ප්‍රතිලාභ ලැබෙන බව තහවුරු කිරීම මගින් ව්‍යාපෘති කාර්යයන් සඳහා තරුණ ප්‍රජාවගේ හා කාන්තාවන්ගේ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම.

13. කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු. මි. 8,000	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	වව්නියාව, අනුරාධපුර සහ මුලතිව්
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව / වගා තීව්‍රතාවය**	ඝන මීටර මිලියන 53.9 හෙක්ටයාර 2,400
ව්‍යාපෘති කාලය	වසර 04	**ප්‍රතිලාභීන්**	පවුල් 6,000
ප්‍රතිපාදන 2022	රු. මි. 100	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු. මි. 100
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු. මි. 28.05	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	3.45%
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු. මි. 11.85		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• වේල්ල සැලසුම් කිරීම • වේල්ලේ වාන සැලසුම් කිරීම • සොරොව්ව සැලසුම් කිරීම • පහළ නිම්න ඇළ මාර්ග වල මිනුම් ගැනීම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• වාරි ජල පහසුකම් නව ඉඩම් හෙක්ටයාර් 1,700කට ලබාදීම (වී වගාව සහ අතිරේක බෝග) • පවුල් 10,000ක් සඳහා පානීය ජලය සැපයීම. • භූගත ජල මට්ටම වර්ධනය කිරීම, ධීවර කර්මාන්තය, ගොවිපල් ආශ්‍රිත සත්ව නිෂ්පාදන සහ රැකියා අවස්ථා ඇති කිරීම.		

14. මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු. මි. 38,500	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මඩකලපුව සහ අම්පාර
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව**	ඝන මීටර මිලියන 18.4 හෙක්ටයාර 10,000
ව්‍යාපෘති කාලය	2021 - 2030	**ප්‍රතිලාභීන්**	ගොවීන් - 4,500 ගොවීන් නොවන -1,000
ප්‍රතිපාදන 2022	රු. මි. 400.00	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු. මි. 650.00
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු. මි. 724.29	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	2.41%

2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු. මි. 390.20
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ප්‍රධාන ඇළෙහි කි.මී 1.25ක් ඉදි කිරීම් නිම කිරීමට ආරම්භ කළ අතර කි.මී 1.00ක වැඩ නිම කරන ලදි. • ව්‍යාපෘතියට ඇතලුවන දම්මින්න මාර්ගයේ කි.මී 1.0ක ඉදිකිරීම් නිම කිරීමට සැලසුම් කළ අතර එම ඉදිකිරීම අවසන් කර ඇත. • ඇතුලුමන් හා පිටමන් ව්‍යුහ 02ක ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ අතර ඉන් 1.4ක වැඩ නිමකර ඇත.
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• වාරිමාර්ග පහසුකම් සහ පානීය ජල පහසුකම් (අවශ්‍ය නිර්මිත ඉදිකිරීම මගින්) වැඩි දියුණු කිරීම. • පාරිසරික සංවර්ධන කටයුතු හා යටිතල පහසුකම් සංවර්ධනය. • පාරිසරික සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම. • සත්ත්ව පාලන කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය සංවර්ධන කටයුතු. • ඉදිකිරීමට යෝජිත වැව්වල ධීවර කර්මාන්තය ඇති කිරීම. • ජල පැතුරුම් ප්‍රදේශය හා භූ ගත ජල තලය වර්ධනය වීම.

15. පැලවත්ත ලංකා සීනි සමාගමේ පර්යන්ත ප්‍රදේශ ජනාවාස භූමියෙහි වාරි සංවර්ධන සැලැස්ම

ඇස්තමේන්තුගත මුදල	රු. මි. 143.50	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මොණරාගල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා තීව්‍රතාවය**	මාන්කඩ වැව - අක්කර අඩි 80 තුන්මුල්ල වැව - අක්කර අඩි 250 මීපල වැව - අක්කර අඩි 150 වෙල්ලස්ස වැව - අක්කර අඩි 175
ව්‍යාපෘති කාලය	වසර 02	**ප්‍රතිලාභීන්**	පැලවත්ත වැවිලි කර්මාන්තය
ප්‍රතිපාදන 2022	රු. මි. 50	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු. මි. 30
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු. මි. 78.05	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	44.42 %
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු. මි. 41.04		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	මාන්කඩ වැව 100% තුන්මුල්ල වැව 100% මීපල වැව 90%		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	පැලවත්ත උක් වගා ප්‍රදේශය තුළ ජලය ගබඩා කිරීමේ ධාරිතාවය වැඩි කිරීම සහ එමගින් උක් අස්වැන්න වැඩි කර ගැනීම.		

16. නාච්චාදුව මහා වාරිමාර්ග ව්‍යාපාරයේ ගොවිපල ඉඩම් ප්‍රතිසංවර්ධනය කිරීමේ අධ්‍යයනය සඳහා වූ නියමු ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු. මි. 156	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අනුරාධපුරය
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය / ජපාන පරිත්‍යාගය (JIID)	**ජලාශ ධාරිතාව/ වගා තීව්‍රතාවය**	• සංවර්ධනය වන මුළු බිම් ප්‍රමාණය - හෙක්ටයාර 48 • වගා බිම් ප්‍රමාණය - හෙක්ටයාර 26.5
ව්‍යාපෘති කාලය	2020-2023	**ප්‍රතිලාභීන්**	ගොවි පවුල් 44
ප්‍රතිපාදන 2022	රු. මි. 59.00	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 89.60 (දේශීය අරමුදල් - රු.මි. 81.00 ජපන් පරිත්‍යාග - රු.මි. 8.60)
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු. මි. 47.76	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	40.00%
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු. මි. 26.66		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ඉඩම් මැනීම, ඉඩම් ගැටළු නිරවුල් කර මායිම් ගල් දැමීම සහ නැවත ඔප්පු ලබා දීම. • කුඹුරු ලියැදි 526ක් ලියැදි 44කට විශාලකර මට්ටම් කර සංවර්ධනය කිරීම. • කෘෂි මාර්ග මී. 1500ක් පමණ සකස් කිරීම. • වාරිමාර්ග ඇළ පස්වලින් සකස් කිරීම.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• ගොවීන් නවීන තාක්ෂණික යන්ත්‍ර භාවිතයට හුරු කිරීම. • නිෂ්පාදන වියදම් 35% කින් අඩු කිරීම. • බෝග විවිධාංගිකරණය තුළින් බෝග ඵලදායිතාවය හා භූමි ඵලදායිතාවය ඉහළ නැංවීම. • ජල කාර්යක්ෂමතාවය 40% සිට 60% දක්වා ඉහළ නැංවීම. • ගොවිතැනින් ඈත්වන තරුණ ප්‍රජාව ගොවිතැන කෙරෙහි ආකර්ෂණය කර ගැනීම. • කෘෂි මාර්ග පහසුකම් වැඩිදියුණු කිරීම. • ගොවීන්ගේ ජීවන තත්ත්වය උසස්වීම. • ව්‍යාපෘතිය මගින් සංවර්ධිත ඉඩම්වල ආර්ථික වටිනාකම වැඩිවීම. • මෙම ව්‍යාපෘතිය ඉදිරි ව්‍යාපෘති සඳහා ආදර්ශයක් භාවිතා කළ හැකිවීම.		

17. "ගම සමඟ පිළිසඳරක්" වැඩසටහන

	ව්‍යාපෘතිය	මුළු ඇස්තමේන්තුව (රු.මිලි.)	ව්‍යාපෘති කාලය	2022 වසර සඳහා ප්‍රතිපාදන	2022.12.31 දිනට ප්‍රගතිය	
					මූල්‍ය ප්‍රගතිය (රු.මිලි.)	භෞතික ප්‍රගතිය
1	අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පදවිය හා වාහල්කඩ ගොවි ව්‍යාපාරවල ඇළ පද්ධතිය වැඩි දියුණු කිරීම	630.00	2021 - 2023	300.00	23.62	72%
2	පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වෙඩිකච්චිය ප්‍රදේශයේ කිරිමැටිපිටිය හා රඹවැව දක්වා මින්නේරිය වැවේ සිට පෝෂක ඇළ ඉදිකිරීම	100.00	2021 – 2023	50.00	21.00	90.38%
3	ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පේරමඩු වැව වැඩි දියුණු කිරීම	347.00	2021 - 2023	150.00	33.77	81%
4	පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, ඇළහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුමාරඇල්ල ප්‍රදේශයේ කුමාර ඇළ අමුණ ඉදිකිරීම	24.00	2021 - 2022	7.14	6.22	100%
5	ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පැන්ඔය අමුණ ඉදිකිරීම	60.00	2021 - 2022	53.00	11.6	79.65%
6	පුත්තලම දිස්ත්‍රික්කයේ වාරිමාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම	455.00	2021 - 2023	7.37	0.20	50%

වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ ග්‍රාමීය වැව්/අමුණු හා ආශ්‍රිත ඇළ මාර්ග සංවර්ධනය

ශ්‍රී ලංකාවේ කෘෂි ආර්ථිකය වැඩිදියුණු කිරීම හා වර්ෂා ජලය උපරිම ලෙස රඳවා ගනිමින් නිසි පරිදි කළමනාකරණය කිරීම තුළින් පානීය, කර්මාන්ත, කෘෂිකාර්මික, සංචාරක හා අනෙකුත් ආදායම් උත්පාදන ක්‍රියාවලීන් සඳහා වූ අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම ඉලක්ක කර ගනිමින් රට පුරා විහිදී ඇති ග්‍රාමීය වැව්, අමුණු හා ඇළ මාර්ග කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ආරම්භ කරන ලද "වාරි සෞභාග්‍යා" වැඩසටහන යටතේ පැවති ග්‍රාමීය වැව්, අමුණු හා ආශ්‍රිත ඇළ මාර්ග 5,000ක් පුනරුත්ථාපනය/ප්‍රතිසංස්කරණය හා නවීකරණය කිරීම වාරිමාර්ග අමාත්‍යාංශයේ මහපෙන්වීම යටතේ පැවති ග්‍රාමීය කුඹුරු ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක විය. මේ වනවිට මෙම වැඩ සටහන වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

මෙම ව්‍යාපෘතිය දිවයිනෙහි සියළු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ඊට අතිරේක ව මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ද ක්‍රියාත්මක කරන ලදී. මේ සඳහා ගොවි සංවිධාන හා පොදුජන සංවිධාන වල සහභාගිත්වය ද ලබා ගන්නා ලද අතර, ඉදිකිරීම් කටයුතු වලදී ශ්‍රී ලංකා යුධ හමුදාවේ ඉංජිනේරු අංශය, සිවිල් ආරක්ෂක බලකාය, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, බන්ධනාගාර දෙපාර්තමේන්තුව යන ආයතනවල දායකත්වය ද ලබා ගන්නා ලදී.

ඒ ඒ දිස්ත්‍රික්කයන්හි ව්‍යාපෘති තෝරා ගැනීම සහ ක්‍රියාත්මක කිරීමේ ආයතන හා ප්‍රදේශවාසීන් සමඟ සම්බන්ධීකරණ කාර්යයන් දිස්ත්‍රික් මට්ටමේදී ඒ ඒ දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ ප්‍රධානත්වයෙන් හා සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහභාගීත්වයෙන් සිදු කර ඇත.

ග්‍රාමීය වැව් සංවර්ධනය යටතේ 2021 වර්ෂයේ දී අවිච්ඡේද වූ ව්‍යාපෘතීන් මෙන්ම තෝරාගත් නව ව්‍යාපෘතීන් ද 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කරන ලදී.

එනමුත් රටේ පැවති අර්බුදකාරී ආර්ථික තත්ත්වය මත, මෙම ග්‍රාමීය වැව් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අපේක්ෂිත පරිදි ප්‍රතිපාදන වෙන් නොවූ අතර 2022 වර්ෂයේ දී ජාතික මට්ටමින් ගනු ලැබූ තීරණ හා උපදෙස් මත ඒ වන විටත් ක්‍රියාත්මක කිරීමට තෝරා ගෙන තිබූ නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදු නොකරන ලදී. එමෙන්ම එම අවස්ථාව වන විට යම්තාක් දුරකට ප්‍රතිලාභ අත්කරගත හැකි තත්ත්වයක පැවති ව්‍යාපෘති භෞතික ලෙස වැඩ නිම කරන ලද ලෙස සලකා කටයුතු කරන ලදී. තවදුරටත් ක්‍රියාත්මක කළ නොහැකි මට්ටමේ ව්‍යාපෘති අවලංගු කරන ලද අතර, 2022 වර්ෂය අවසානයේදී තවදුරටත් අවිච්ඡේද වූ ව්‍යාපෘති 2023 වර්ෂය තුල ක්‍රියාත්මක කිරීම සඳහා තෝරා ගන්නා ලදී. එම වර්ෂය අවසාන වන විට ග්‍රාමීය වැව් සංවර්ධන ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂිතය.

ඒ අනුව 2021-2023 කාල පරාසය තුල රු. මිලියන 12,500ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද ග්‍රාමීය වැව්, අමුණු හා ආශ්‍රිත ඇළ මාර්ග 5000ක් පුනරුත්ථාපනය / ප්‍රතිසංස්කරණය/ නවීකරණය කිරීම යටතේ 2022 වර්ෂය අවසානය වන විට වැව් අමුණු හා ආශ්‍රිත ඇළ මාර්ග 1000 කට අධික සංඛ්‍යාවක වැඩ නිම කර ඇත.

දිස්ත්‍රික් මට්ටමින් ප්‍රතිසංස්කරණය සඳහා තෝරා ගෙන ඇති වැව්/ අමුණු ආශ්‍රිත ඇළ මාර්ග භෞතික ප්‍රගතිය - (2022.12.31 දිනට)

	දිස්ත්‍රික්කය	සැලසුම් කල ව්‍යාපෘති සංඛ්‍යාව	**2022** වර්ෂය වන විට වැඩ අවසන් කල ව්‍යාපෘති සංඛ්‍යාව	**2023** වර්ෂය සඳහා තෝරාගෙන ඇති අවිච්ඡේද ව්‍යාපෘති සංඛ්‍යාව
1	කොළඹ	25	22	1
2	ගම්පහ	37	30	6
3	කළුතර	44	40	5
4	ගාල්ල	98	85	8
5	හම්බන්තොට	67	53	10
6	මාතර	106	102	2
7	කෑගල්ල	11	11	0
8	රත්නපුර	30	30	0
9	මහනුවර	117	111	4
10	මාතලේ	40	26	10
11	නුවරඑළිය	40	40	0
12	කුරුණෑගල	126	109	7
13	පුත්තලම	46	43	3
14	මඩකලපුව	41	35	3
15	ත්‍රිකුණාමලය	51	50	2
16	යාපනය	42	38	0
17	මුලතිව්	18	14	0
18	කිලිනොච්චිය	15	10	0
19	වව්නියාව	26	24	0
20	මන්නාරම	44	24	20
21	අනුරාධපුර	89	62	19
22	පොළොන්නරුව	37	33	2
23	බදුල්ල	78	76	0
24	මොණරාගල	45	42	1
25	අම්පාර	67	57	3
මුළු ව්‍යාපෘති ගණන		**1340**	**1167**	***106**

**ව්‍යාපෘති 07 ක් භෞතික ව නිම කර ඇති අතර ගෙවීම් පමණක් සිදු කිරීමට ඇත.*

ක්‍රියාත්මක ආයතන හා මූල්‍ය ප්‍රගතිය - 2022 .12.31 දිනට

	ආයතනය	තෝරාගෙන ඇති මුළු වැව්/ අමුණු/ ඇළවේලි සංඛ්‍යාව	වැඩ අවසන් කර ඇති වැව්/ අමුණු/ ඇළවේලි සංඛ්‍යාව	ප්‍රතිපාදන 2022 (රු.මි.)	2022.12.31 දක්වා වියදම (රු.මි.)
1	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	811	663	*1888.16	1,149.13
2	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව	298	288	285.52	272.70
3	පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව	146	137	28.07	27.60
4	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (පුනරුත්ථාපන වැඩ)	19	19	*84.71	92.42
5	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (A 9 මාර්ගයේ පිහිටි තෝරාගත් වැව් සංවර්ධනය)	9	3	*150	3.54
6	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර	57	57	27.16	27.16
7	මිනින්දෝරු දෙපාර්තමේන්තුව (උක්ත තෝරාගත් ක්‍රියාත්මක ව්‍යාපෘති ද ඇතුලත් ව සමීක්ෂණ කටයුතු)	(1293)	(121)	8.30	7.73
8	වෙනත්			21.08	19.48
	එකතුව	**1340**	**1167**	**2,493.00**	**1,599.76**
	මූල්‍ය ප්‍රගතිය 2022.12.31 – 71.5%				

** 2022 වර්ෂ අවසාන මූල්‍ය ප්‍රගති වාර්තාව අනුව උක්ත ප්‍රතිපාදන, අවශ්‍යතාවය පරිදි ගිණුම් අංශය මඟින් අනුමත මුළු ප්‍රතිපාදනය නොඉක්මවන පරිදි සංශෝධනය කර ඇත.*

වාරි සෞභාග්‍ය වැඩසටහන - වැව් මැනුම් කටයුතු පිළිබඳ සාරාංශය 2022 දෙසැම්බර් 31 දක්වා

දිස්ත්‍රික්කය	වැව් සංඛ්‍යාව	2022 වර්ෂයට පෙර නිම කරන ලද වැව් සංඛ්‍යාව	2022 වර්ෂයේ දී නිම කරන ලද වැව් සංඛ්‍යාව	ක්‍රියාත්මක වෙමින් පවතින	ඉතිරි ව්‍යාපෘති සංඛ්‍යාව	අවලංගු කරන ලද / අත්හිටුවන ලද ව්‍යාපෘති සංඛ්‍යාව	මිනින්දෝරුවන් සංඛ්‍යාව
මහනුවර	28	2	8	4	14	0	4
පුත්තලම	77	0	2	3	71	1	2
කුරුණෑගල	79	0	17	8	54	0	4
අනුරාධපුර	109	0	7	29	71	2	2
හම්බන්තොට	382	27	18	135	202	0	6
මොණරාගල	415	21	5	8	381	0	3
ත්‍රිකුණාමලය	44	0	1	9	34	0	4
අම්පාර	135	0	5	8	122	0	3
රත්නපුර	24	1	7	16	0	0	2
වව්නියාව	0	0	0	0	0	0	2
එකතුව	**1293**	**51**	**70**	**220**	**949**	**3**	**32**

** ගිණුම් අංශය මඟින් ලබා දී ඇති වියදම් වාර්තා අනුව 2022 වර්ෂයේ දෙසැම්බර් අවසානයට මැනුම් කටයුතු සඳහා රු. 7,733,683.86 ක වියදමක් දරා ඇත*

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මහා පරිමාණ සහ මධ්‍යම පරිමාණ වාරි ව්‍යාපෘති

1. යාන් ඔය ව්‍යාපෘතිය
2. පහළ උඟව ව්‍යාපෘතිය
3. මහගෝන වැව ව්‍යාපෘතිය
4. මොරාණ ජලාශය
5. ඇල්ල වැව ජලාශය
6. කුඹුක්කන්ඔය ජලාශය
7. රූගම් කිතුල් ජලාශය (මුන්දෙනිආරු ගංගා ද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය)
8. පොළොන්නරු දිස්ත්‍රික් වාරි සංවර්ධන ව්‍යාපෘතිය
9. මොණරාගල දිස්ත්‍රික්කයේ කඩිනම් වාරි සංවර්ධන ව්‍යාපෘතිය (වෙල්ලස්ස නවෝදය)
10. කැළණි ගඟ ආරක්ෂණ බැම්ම ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය
11. ගොඩිගමුව වැව සංවර්ධනය හා වැඩිදියුණු කිරීම
12. කැළණි, මුන්දෙනි ආරු, කළුගඟ, නිල්වලා හා ගිං ගංගා ද්‍රෝණි වල ගංවතුර වැලැක්වීමේ ව්‍යාපෘතිය
13. කුඩාවිලච්චිය ජලාශය ප්‍රතිසංස්කරණය කිරීම
14. දෙමටගල්ල වැව ප්‍රතිසංස්කරණය කිරීම
15. උමා ඔය පහළ සංවර්ධන ව්‍යාපෘතිය
16. හිඹිලියාකඩ වත්තේගෙදර වාරිමාර්ග යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
17. විලකණ්ඩිය ජලාශ ව්‍යාපෘතිය.
18. මහගල්ගමුව වැව වැඩිදියුණු කිරීම.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන වෙනත් ව්‍යාපෘති

1. දැදුරු ඔය ජලාශ ව්‍යාපෘතිය

1. යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 48,355.3	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අනුරාධපුර සහ ත්‍රිකුණාමලය
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 169 / හෙක්ටයාර 8700
ව්‍යාපෘති කාලය	2012-2023	**ප්‍රතිලාභීන්**	පවුල් 9,000
ප්‍රතිපාදන 2022	රු.මි.800	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි.3,500
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 36,891.05	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	85.68
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 616.28		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ලබා දීම – 7.1 % • නව වාරිමාර්ග පහසුකම් සංවර්ධනය – 5.2 % • ඉස්සන් වැව මූලස්ථායි වැඩ ඉදි කිරීම – 19 %		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• ඉඩම් අත්පත් කර ගැනීමේ සහ නැවත පදිංචි කිරීමේ ඉතිරි වැඩකටයුතු • නව සහ පවතින වාරිමාර්ග යටිතල පහසුකම් සංවර්ධනයේ ඉතිරි වැඩකටයුතු • පාරිසරික හා පුරාවිද්‍යා කළමනාකරණය සහ පසු රැකවරණය		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• වගා ඉඩම් හෙක්ටයාර 8,700ක වගා තිව්‍රතාවය වැඩි කිරීම සඳහා වාරි ජල පහසුකම් සැපයීම. • අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවුල් 50,000කට සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පවුල් 20,000කට පානීය ජලය සැපයීම. • කිලෝමීටර් 8ක කාපට් මාර්ගය සහ කිලෝමීටර 40ක බොරළු මාර්ග සංවර්ධනය කිරීම. • නගර සංවර්ධනය යටතේ ගම්මාන 4ක් සංවර්ධනය කිරීම (නගර 4කට ප්‍රජා ශාලා, ළදරු පාසල්, සේවා පියස ආදී වූ යටිතල පහසුකම් සංවර්ධනය). • කිලෝමීටර 16ක දිගින් යුතු අලි වැට ඉදිකිරීම.		

2. **පහළ උගව මධ්‍ය හා සුළු පරිමාණ සංවර්ධන ව්‍යාපෘතිය**

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 1,250	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මොණරාගල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	වටගල ආර - ඝන මීටර මිලියන 0.2 මල්ලිපොත - ඝන මීටර මිලියන 1 දෙබර ආර - ඝන මීටර මිලියන 1.25 පවතින ඉඩම් - හෙක්ටයාර 971 නව ඉඩම් - හෙක්ටයාර 728

ව්‍යාපෘති කාලය	2007 – 2023	**ප්‍රතිලාභීන්**	වටගල ආර - පවුල් 32 මල්ලිපොත - පවුල් 250 දෙබර ආර - පවුල් 72
ප්‍රතිපාදන 2022	රු.මි. 60	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 30
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 746.69	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	86.15
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 60		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	දෙබර ආර පෝෂිත ඇළ ඉදිකිරීම.		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• දෙබර ආර පෝෂිත ඇළ ඉදි කිරීමේ ඉතිරි වැඩකටයුතු		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• නව ඉඩම් හෙක්ටයාර 728ක් සහ පවත්නා ඉඩම් හෙක්ටයාර 971ක් සඳහා දෙකන්නය වගා කිරීමට වාරිමාර්ග පහසුකම් සැලසීම.		

3. **මහගෝන වැව ව්‍යාපෘතිය**

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 235	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මාතලේ
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 0.78 පවතින ඉඩම් - හෙක්ටයාර 16 නව ඉඩම් - හෙක්ටයාර 249
ව්‍යාපෘති කාලය	2012 – 2022	**ප්‍රතිලාභීන්**	පවුල් 200
ප්‍රතිපාදන 2022	රු.මි. 13	**2023වසර සඳහා ප්‍රතිපාදන**	-
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 234.86	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	100
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 12.99		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• දකුණු ඇළෙහි 1+200 සිට 2+000 දක්වා ඉදි කිරීම • FC01,FC02,FC03 කෙත් ඇලවල් ඉදිකිරීම		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• 2022 වසරේදී ව්‍යාපෘතිය අවසන් කර ඇත		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• පවතින ඉඩම් හෙක්ටයාර 16 සහ නව ඉඩම් හෙක්ටයාර 249ක් සඳහා වාරි ජලය සැපයීම.		

4. මොරාණ ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 2,900	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	බදුල්ල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 16 හෙක්ටයාර 570
ව්‍යාපෘති කාලය	2012-2023	**ප්‍රතිලාභීන්**	පවුල් 1,300
ප්‍රතිපාදන 2022	රු.මි. 130	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 180
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 2,655.32	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	98.22
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 82.48		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ලබා දීම – 27% • නැවත වන වගා වැඩසටහන		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• ඉඩම් අත්පත් කර ගැනීමේ ඉතිරි වැඩකටයුතු		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• නව සහ පවතින ඉඩම් හෙක්ටයාර 570කට සහ පවුල් 1300කට වාරි ජලය සැපයීම. • පවුල් 500කට පානීය ජලය සැපයීම. • කිලෝමීටර් 25ක මාර්ගයක් ඉදිකිරීම. • මීමැසි පාලනය හා මිරිදිය ධීවර කර්මාන්තය සම්බන්ධ වැඩසටහන් පැවැත්වීම. • නිවාස නොමැති ආබාධිත පවුලක් සඳහා ව්‍යාපෘතිය හරහා නිවසක් ඉදිකිරීම. • ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රජා ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීමක් ලෙස ප්‍රජා ශාලා දෙකක් ඉදිකිරීම, තැපැල් කාර්යාල ඉදිකිරීම, යාල්වෙල සහ කුඩාලුණු විද්‍යාල වලට ප්‍රවේශ මාර්ග වැඩිදියුණු කිරීම. • නැවත වන වගා වැඩසටහන.		

5. ඇල්ල වැව ජලාශය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 1,532.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	රත්නපුර
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 1.91 හෙක්ටයාර 570
ව්‍යාපෘති කාලය	අවුරුදු 03 (2021-2024)	**ප්‍රතිලාභීන්**	පවුල් 4,000
ප්‍රතිපාදන 2022	රු.මි. 100	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 100
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 261.85	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	14.65

2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 93.19
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ඉදි කිරීම සඳහා ව්‍යාපෘති භූමිය සැකසීම, කාර්යාලය, ගබඩා සහ ප්‍රවේශ මාර්ග ඉදිකිරීම – 11% • ප්‍රධාන වේල්ල ඉදි කිරීම – 1.5% • සෑදල වේල්ල ඉදි කිරීම – 3.1% • සොරොව් සහ පහළ පිටවාන ඉදිකිරීම – 34.8% • නැවත පදිංචි කිරීම් සහ වන්දි ගෙවීම – 4%
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• පිටවාන , සොරොව්ව සහ වේල්ල ඉදි කිරීමේ ඉතිරි වැඩ කටයුතු
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• කෘෂිකාර්මික හා ගෘහාශ්‍රිත කටයුතු සඳහා ජලය සැපයීමෙන් ප්‍රදේශයේ වෙසෙන ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම. • වියළි කාලවලදී වාරි කෘෂිකර්මාන්තය සඳහා ජල සුරක්ෂිතතාව සහතික කිරීම. • හුලන්දා ඔය සහ පනාමුර ව්‍යාපාර වල වගා තිව්‍රතාවය වැඩි කිරීම සහ නව ඉඩම් අක්කර 570කට වාරි ජල පහසුකම් ලබා දීම. • කොලොන්න ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා ජල ඉල්ලුම දිනකට ඝන මීටර 7,000ක් සැපයීම. • මිරිදිය ධීවර කර්මාන්තය ප්‍රවලිත කිරීම සහ පාරිසරික අවශ්‍යතා ඉටුකිරීම.

6. කුඹුක්කන්ඔය ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 32,397.3	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මොණරාගල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 48 හෙක්ටයාර 5,429
ව්‍යාපෘති කාලය	අවුරුදු 04	**ප්‍රතිලාභීන්**	පවුල් 10,000
ප්‍රතිපාදන 2022	රු.මි. 127	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු. මි. 300
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 417.19	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	1.96
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 98.89		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ගෙවීම් – 4.1 % • පහත් මට්ටමේ පිවිසුම් මාර්ගයක් ඉදිකිරීම – 39 % • ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය ඉදිකිරීම – 20%		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ගෙවීම් • වම් හා දකුණු ඉවුරු වාරිමාර්ග පද්ධති සංවර්ධනය		

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• නව සහ වාරි පහසුකම් නොමැති ඉඩම් හෙක්ටයාර 5,429ක් සඳහා වාරි ජලය සැපයීම. • වාර්ෂිකව පානීය ජල අවශ්‍යතාවය සඳහා ජලය ඝන මීටර් මිලියන 12ක් ලබා දීම. • විකල්ප මාර්ග කිලෝමීටර් 15ක් පමණ සංවර්ධනය කිරීම. • වාර්ෂිකව ගිගා වොට් පැය 16ක ජල විදුලිය උත්පාදනය. • මිරිදිය ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම. • නැවත පදිංචි කරනු ලබන ප්‍රදේශයේ නගර සංවර්ධනය සිදු කිරීම. • අවශ්‍ය පුද්ගලයන් සඳහා ආදායම් උත්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. • අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා අලිවැට ඉදිකිරීම.

7. මුන්දෙනි ආරු ගංහාද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය (රූගම් කිතුල් ජලාශය)

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 24,141	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අම්පාර සහ මඩකලපුව
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය + ප්‍රංශ සංවර්ධන ආයතනය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	රූගම් කිතුල් - ඝන මීටර මිලියන 88 මහ ඔය - ඝන මීටර මිලියන 80 හෙක්ටයාර 6,500
ව්‍යාපෘති කාලය	අවුරුදු 06 2021 – 2027	**ප්‍රතිලාභීන්**	පවුල් 50,000
ප්‍රතිපාදන 2022	රු.මි. 253	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 160
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 347.23	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	2.29
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 49.78		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• මිනුම් කටයුතු – 9 % • ඉඩම් අත්පත් කර ගැනීම සහ නැවත පදිංචි කිරීම – 3 % • ව්‍යාපෘති කළමනාකරණ සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක සඳහා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම – 11 %		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• මිනුම් කටයුතු • සැලසුම් කටයුතු සඳහා වියදම් පියවීම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• පවුල් 10,000කට අයත් වගා කළ හැකි සහ වගා කටයුතු සිදු කරන ඉඩම් හෙක්ටයාර 6,500ක් සඳහා වාරි පහසුකම් සපයා දීම. • මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කයේ පවුල් 31,000කට පානීය ජලය සැපයීම. • පහළ නිම්නයේ ගංවතුර පාලනය කිරීම. • ජලාශ දෙකෙහිම මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය වසරකට මෙට්‍රික් ටොන් 800කින් වැඩි කිරීම. • කිලෝමීටර් 85ක මාර්ග ජාලයක් ඉදිකිරීම. • නගර සංවර්ධනය කිරීම. • අලි වැට ඉදිකිරීම.		

	• නැවත වන වගා වැඩසටහන. • බීජ වී නිෂ්පාදනය සඳහා ජලය සැපයීම. • ගොවි සංවිධානය ශක්තිමත් කිරීම. • ආදායම් උත්පාදනය කිරීමේ වැඩසටහන සහ පුහුණුව (කෘෂිකාර්මික හා පශු සම්පත් ව්‍යාප්තිය).

8. **පොළොන්නරු දිස්ත්‍රික් වාරි සංවර්ධන ව්‍යාපෘතිය**

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 7,000	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	පොළොන්නරුව
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	අක්කර අඩි 351,700 (ජලාශ 04)
ව්‍යාපෘති කාලය	2016-2023	**ප්‍රතිලාභීන්**	පවුල් 29,790
ප්‍රතිපාදන 2022	රු.මි.50	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 200
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 1,333.26	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	27.21
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 47.29		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• කවුඩුල්ල, පරාක්‍රම සමුද්‍රය, මින්නේරිය, ගිරිතලේ සහ G කලාපයේ ඇළ මාර්ග වැඩිදියුණු කිරීම.		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• කවුඩුල්ල, පරාක්‍රම සමුද්‍රය, මින්නේරිය, ගිරිතලේ සහ G කලාපයේ ඇළ මාර්ග වැඩිදියුණු කිරීම අඛණ්ඩව කරගෙන යාම.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• පොළොන්නරුව දිස්ත්‍රික්කයේ යල කන්නයේ ජල හිඟය අවම කිරීම සහ ජල සැපයුමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම. • ඊසානදිග මෝසම් වර්ෂා කාලයේදී ගංවතුර හේතුවෙන් කුඹුරුවලට සිදුවන හානිය අවම කිරීම.		

9. **මොණරාගල දිස්ත්‍රික්කයේ කඩිනම් වාරි සංවර්ධන ව්‍යාපෘතිය (වෙල්ලස්ස නවෝදය)**

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 2,500	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මොණරාගල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	හෙක්ටයාර 3179
ව්‍යාපෘති කාලය	2016-2023	**ප්‍රතිලාභීන්**	පවුල් 15,000
ප්‍රතිපාදන 2022	රු.මි. 150	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 150
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි.1,180.13	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	58.67
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 148.99		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• වාරිමාර්ග කටයුතු පුනරුත්ථාපනය කිරීම – 8 % • කුඩා වැව් ප්‍රතිසංස්කරණය යටතේ පයිලේගම, මොරගොල්ල, ඌරඋල සහ දෙටගමුව වැව් සඳහා වේලි ඉදිකිරීමේ කටයුතු සිදුවෙමින් පවතී. • එළුකේ ඇළ සඳහා පස් වැඩ 90% අවසන් කර, පෙට්ටි බෝක්කුව ඉදිකිරීම ආරම්භ කර ඇත.		

2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• මොරගොල්ල වැව, පයිලේගම වැව, උෟර උල වැව, දෙටගමුව වැව, මහපැලැස්ස වැව සහ එළුකේ ඇළ වැව ප්‍රතිසංස්කරණය කිරීම.
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• වගා කළ හැකි ඉඩම් හෙක්ටයාර 3,179කට වාරි ජලය සැපයීම. • නව සහ වැඩිදියුණු කළ තාක්ෂණික ක්‍රම හා ආදර්ශන පිළිබඳ නියමු අධ්‍යනය • පවතින වාරිමාර්ග යටිතල පහසුකම් පුනරුත්ථාපනය කිරීම. • යටිතල පහසුකම් සංවර්ධනය (ග්‍රාමීය හා නාගරික). • ජල සම්පත් සංවර්ධන කිරීමේ විභවය හඳුනාගැනීම සඳහා විමර්ශනය, දත්ත රැස් කිරීම සහ අධ්‍යයනය කිරීම.

10. කැළණි ගඟ ආරක්ෂණ බැම් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 1000	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	කොළඹ, ගම්පහ
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	-
ව්‍යාපෘති කාලය	2018-2024	**ප්‍රතිලාභීන්**	පවුල් 15,000ක් පමණ
ප්‍රතිපාදන 2022	රු.මි. 145	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 400
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 430.52	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	38.59
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 95.78		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• කැළණි උතුරු බැම්ම පිළිසකර කිරීම හා වැඩි දියුණු කිරීම. • කැළණි ගං ඉවුර ආරක්ෂණ බැම් සුරක්ෂිත කිරීම සඳහා ගං ඉවුරේ ගේබියන් සහ ෂීට් පයිල් බැම් ඉදි කිරීම. • සුළු ගංවතුර ආරක්ෂණ නිර්මිත වැඩි දියුණු කිරීම.		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• කැලණි උතුරු බැම්ම, ගං ඉවුර ආරක්ෂාව, සුලු ගංවතුර ආරක්ෂණ ව්‍යුහයන් ප්‍රතිසංස්කරණය කිරීම, අඛණ්ඩව වැඩිදියුණු කිරීම සහ ඉඩම් අත්පත් කර ගැනීම.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• කැළණි ගඟ ආශ්‍රිතව පවුල් 15,000කගේ පමණ ජීවිත හා ඔවුන්ගේ දේපළ, කර්මාන්ත, මාර්ග හා යටිතල පහසුකම් ගංවතුරෙන් ආරක්ෂා කිරීම.		

11. ගොඩිගමුව වැව සංවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 234.63	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මාතලේ
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 0.25 හෙක්ටයාර 119
ව්‍යාපෘති කාලය	2018 – 2023	**ප්‍රතිලාභීන්**	පවුල් 265
ප්‍රතිපාදන 2022	රු.මි. 50	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 35
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 171.46	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	77.13

2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 36.82
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• වැව් බැම්ම ඉදිකිරීම • පිටවාන ඉදිකිරීම • රළපනාව (Rip rap) හා දියපෙරනය (Toe Filter) ඉදිකිරිම. • වම් ඉවුරු සොරොව්ව සහ දකුණු ඉවුරු සොරොව්ව ඉදිකිරීම • අමුණ (Anicut) ඉදිකිරීම • පෝෂිත ඇළ, ප්‍රධාන ඇළ ඉදිකිරීම සහ වාරිමාර්ග යටිතල පහසුකම් ඉහළ නැංවීම.
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• සියලුම ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• හෙක්ටයාර 121ක් වගා කිරීම සඳහා යල මහ දෙකන්නයට වාරි ජලය සැපයීම.

12. කැළණි, කළු, නිල්වලා හා ගිං ගංගා ද්‍රෝණි වල ගංවතුර වැලැක්වීමේ ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 2,100.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	ගාල්ල, මාතර, කළුතර, කොළඹ
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	-
ව්‍යාපෘති කාලය	අවුරුදු 05	**ප්‍රතිලාභීන්**	පවුල් 37,000
ප්‍රතිපාදන 2022	රු.මි. 100	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි 100
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 394.60	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	20.43
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 84.49		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• කැළණි ගඟ, කළු ගඟ, ගිං ගඟ හා නිල්වලා ගඟ ද්‍රෝණිවල ගංවතුර ආරක්ෂණ බැම් පුනරුත්ථාපනය කිරීම. • ගංවතුර බස්නා ඇළ පද්ධති හා ගංවතුර පාලන නිර්මිත අළුත්වැඩියා කිරීම. • නිල්වලා පොම්පාගාර පුනරුත්ථාපනය කිරීම. • ගංවතුර ආරක්ෂණ අංශයේ පරිපාලන ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු.		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• ගිං ගඟේ ගංවතුර ආරක්ෂණ බැම් ශක්තිමත් කිරීම. • තුඩාව, මාගල්ලගොඩ සහ තල්ගහගොඩ පොම්පාගාර ප්‍රතිසංස්කරණය කිරීම, නිල්වලා ගඟේ ගංවතුර බැම් ප්‍රතිසංස්කරණය කිරීම. • ගංවතුර අවම කිරීම සඳහා නාගරික ප්‍රදේශයේ ජලාපවහන ජාල වැඩිදියුණු කිරීම සහ කැලණි ගඟේ ගංවතුර බැම්වල සුළු පුනරුත්ථාපන කටයුතු.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• ගිං ගඟ ද්‍රෝණියේ කෘෂිකාර්මික ඉඩම් හෙක්ටයාර 5,000ක් පමණ ගංවතුරෙන් ආරක්ෂාවීම සහ පවුල් 20,000ක් පමණ ගංවතුර ආපදා වලින් මුදවා ගැනීම. • නිල්වලා ද්‍රෝණියේ කෘෂිකාර්මික ඉඩම් හෙක්ටයාර 5,060ක් ගංවතුරෙන් ආරක්ෂාවීම සහ පවුල් 12,000ක් පමණ ගංවතුර ආපදා වලින් ආරක්ෂාවීම. • කළුගඟ ද්‍රෝණියේ කෘෂිකාර්මික ඉඩම් හෙක්ටයාර 200ක් පමණ ආරක්ෂාවීම සහ පවුල් 5,000ක් පමණ ගංවතුර ආපදා වලින් ආරක්ෂාවීම.		

13. කුඩාවිලච්චිය ජලාශය ප්‍රතිසංස්කරණය කිරීම

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 6,000.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අනුරාධපුරය
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 23 හෙක්ටයාර 1078
ව්‍යාපෘති කාලය	අවුරුදු 03 (2021-2023)	**ප්‍රතිලාභීන්**	පවුල් 25,000
ප්‍රතිපාදන 2022	රු.මි. 86	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 300
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 159.4	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	4.95
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 56.75		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම – 16.9% • සැපයුම් ඇළ ඉදිකිරීම – 3.5%		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• පිවිසුම් මාර්ගය ඉදිකිරීම • වැව් බැම්ම, සොරොව්ව, පිටවාන සහ සැපයුම් ඇළ ඉදිකිරීම ආරම්භ කිරීම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• අනුරාධපුර දිස්ත්‍රික්කයේ පුද්ගලයින් 25,000කට පානීය ජලය සැපයීම (CKD අඩු කිරීම සහ සනීපාරක්ෂාව වැඩි කිරීම) • මහවිලච්චිය මහා වාරි යෝජනා ක්‍රමයේ බෝග තීව්‍රතාවය 1.57 සිට 2.0 දක්වා වැඩි කිරීම. • අලි මිනිස් ගැටුම් අවම කිරීම. • පුරාවිද්‍යා ස්ථාන තවදුරටත් විනාශ වීමෙන් ආරක්ෂා කිරීම. • විල්පත්තු ජාතික වනෝද්‍යානයේ වන සතුන්ට අවශ්‍ය ජල පහසුකම් සැපයීම. • මෝදරගම් අරු ගංගාවේ පාරිසරික තුලනය සඳහා ජල ගලනය සහතික කිරීම. • භූගත ජලය පෝෂණය කිරීම. • අනුරාධපුරයේ යෝජිත ඖෂධ කලාපය සඳහා ජලය සැපයීම.		

14. දෙමටගල්ල වැව ප්‍රතිසංස්කරණය කිරීම

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 2,230.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අනුරාධපුරය
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 2.32 හෙක්ටයාර 550
ව්‍යාපෘති කාලය	අවුරුදු 03 2021 – 2023	**ප්‍රතිලාභීන්**	පවුල් 1,246
ප්‍රතිපාදන 2022	රු.මි. 10	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි.5
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 1.91	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	0.25
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 1.65		

2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	පිවිසුම් මාර්ගය ඉදිකිරීම – 6.8%
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණය හා කඩිනම් කිරීමේ (RAMP) කමිටුවේ තීරණය අනුව වැඩ නවතා ඇත
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• ග්‍රාමීය වැව් 32ක් යටතේ හෙක්ටයාර 550ක් වගාකොට පවුල් 1,246කට ප්‍රතිලාභ සැලසීම. • භෝග තීව්‍රතාවය 0.6 සිට 1.5 දක්වා වැඩිවීම මඟින් ගොවි ප්‍රජාවගේ දරිද්‍රතා මට්ටම අඩු කිරීම. • ව්‍යාපෘති මැදිහත්වීම් මඟින් ප්‍රදේශයේ සමස්ථ සංවර්ධනය සහ එමඟින් සමාජ-ආර්ථික තත්ත්වයන්, ජීවන තත්ත්වයන් නංවාලීම සහ දරිද්‍රතාවය අවම කිරීම. • කහල්ල පල්ලෙකැලේ වනාන්තර ප්‍රදේශයේ වන සතුන්ට ජලය සැපයීම. • මානව - සත්ත්ව ගැටුම අඩු වීම. • ගෘහස්ථ භාවිතය සඳහා පිරිසිදු ජලය ලබාදීම. • භූගත ජලය පෝෂණය කිරීම/ වියළීමට ලක්වන ළිං වල ජල මට්ටම වැඩි කිරීම.

15. උමා ඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 17,914.19	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මොණරාගල, හම්බන්තොට
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය**	• අලිකොට ආර - ඝන මීටර මිලියන 6.5 • කුඩා ඔය ඝන මීටර මිලියන 22.6 • නව ඉඩම් හෙක්ටයාර 4500 • පවතින ඉඩම් හෙක්ටයාර් 1500
ව්‍යාපෘති කාලය	2013 -2023	**ප්‍රතිලාභීන්**	පවුල් 5,700
ප්‍රතිපාදන 2022	රු.මි. 2,060	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි.2,320
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 11,877.60	**සමස්ත භෞතික ප්‍රගතිය (%)**	74.05
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 2,006.67		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• කුඩාඔය ජලාශය ඉදිකිරීම – 14.2 % • හඳපානාගල ජලාශයේ වම් ඉවුරු ඇළ (කි.මී. 11) ඉදිකිරීම – 16.5 % • අලිකොට ආර - කුඩාඔය හරස් ඇළ ඉදිකිරීම – 12 % • කුඩාඔය - සිංහලයාගම හරස් ඇළ ඉදිකිරීම – 14 % • ගම් වාරිමාර්ග පද්ධති (සුළු වැව්) සංවර්ධනය – 14 % • හඳපානාගල අමුණ – 30 % • ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය සහ නැවත වන වගාව – 1.5 %		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• අලිකොට ආර, කුඩාඔය සහ හඳපානාගල ජලාශ ඉදිකිරීමේ ඉතිරි වැඩ කටයුතු		

	• හඳපානාගල ජලාශයේ වම් ඉවුරු ඇළ ඉදිකිරීමේ ඉතිරි වැඩ කටයුතු • අලිකොට ආර - කුඩාඔය හරස් ඇළ ඉදිකිරීමේ ඉතිරි වැඩ කටයුතු • හඳපානාගල අමුණ ඉදිකිරීමේ ඉතිරි වැඩ කටයුතු • ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය සහ නැවත වන වගාව
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• වාර්ෂිකව උමා ඔය ද්‍රෝණියේ සිට කිරිඳි ඔය ද්‍රෝණියට ජලය සන මීටර මිලියන 145ක් හරවා යැවීම. • නව ඉඩම් හෙක්ටයාර 4500 කට සහ දැනට පවතින ඉඩම් හෙක්ටයාර 1500 කට ජලය සැපයීම. • මොණරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික්ක සඳහා සන මීටර මිලියන 30 පානීය හා කාර්මික ජලය සැපයීම. • සත්ත්ව ගොවිපොළ සහ මිරිදිය ධීවර සංවර්ධනය • බොහෝ පුහුණු සහ නුපුහුණු පුද්ගලයින් සඳහා රැකියා අවස්ථා උදාවීම. • නවීන තාක්ෂණයේ දැනුම හුවමාරු කිරීම • කුඩා වැව් 54ක් වැඩි දියුණු කිරීම සහ වැව් 110කට ජලය සැපයීම

16. හිඹිලියාකඩ වත්තේගෙදර වාරිමාර්ග යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 7,155	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මාතලේ
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය**	- සන මීටර මිලියන 1.3 (වත්තේගෙදර වැව) - නව ඉඩම් අක්කර 1,010 සහ පවතින ඉඩම් අක්කර 1,300
ව්‍යාපෘති කාලය	2020-2024	**ප්‍රතිලාභීන්**	පවුල් 1,200
ප්‍රතිපාදන 2022	රු.මි. 271	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි.250
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 398.81	**සමස්ත භෞතික ප්‍රගතිය (%)**	5.25
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 221.61		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• වත්තේගෙදර වැව ඉදිකිරීම – 9 %		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• වත්තේගෙදර වැව හා සොරොව්ව ඉදිකිරීම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• පවතින හිඹිලියාකඩ ජලාශයේ ධාරිතාව වැඩි කිරීම • පවතින ඉඩම් අක්කර 1300 කට හා නව ඉඩම් අක්කර 1010 කට ජලය සැපයීම. • වගා තීව්‍රතාවය1 සිට 2 දක්වා වැඩි කිරීම.		

17. විලකණ්ඩිය ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 298	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	බදුල්ල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 1.06 හෙක්ටයාර 101
ව්‍යාපෘති කාලය	2012-2022	**ප්‍රතිලාභීන්**	පවුල් 250
ප්‍රතිපාදන 2022	රු.මි. 40	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	-
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 272.91	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	97.35
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 39.99		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ප්‍රධාන ඇළ සහ ප්‍රධාන ඇළෙහි නිර්මිත ඉදිකිරීම • බෙදුම් ඇළ මාර්ග සහ නිර්මිත ඉදි කිරීම • කෙත් ඇළ මාර්ග සහ නිර්මිත ඉදි කිරීම.		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• සියලුම ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• කන්න දෙකම වගා කිරීම සඳහා හෙක්ටයාර 101කට වාරි ජල පහසුකම් සැපයීම.		

18. මහගල්ගමුව පෝෂිත ඇළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 500	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	කුරුණෑගල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 8 හෙක්ටයාර 566
ව්‍යාපෘති කාලය	2014-2023	**ප්‍රතිලාභීන්**	පවුල් 2,000
ප්‍රතිපාදන 2022	රු.මි. 30	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 100
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 374.99	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	93.05
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 13.45		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• නිර්මිත ඉදි කිරීම (conduit සහ under crossing ඉකිරි වැඩ නිම කිරීම)		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	• සියලුම ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• අළුත් හා පවත්නා ඉඩම් හෙක්ටයාර 566ක් සඳහා වාරිමාර්ග ජලය සැපයීම.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• පළමු කිලෝමීටර් 2ක ඇතුලත වගා කිරීම සඳහා ජලය සපයනු ලැබේ.(පෝෂිත ඇළ දෙපස කුඹුරු ඉඩම් සඳහා ජලය ලබා දෙනු ලැබේ)		

වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මකවන වෙනත් ව්‍යාපෘති

1. දැදුරු ඔය ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 13,540	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	කුරුණෑගල, පුත්තලම
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 75 හෙක්ටයාර 10,932
ව්‍යාපෘති කාලය	2005-2022	**ප්‍රතිලාභීන්**	පවුල් 12,500
ප්‍රතිපාදන 2022	රු.මි. 50	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	-
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 13,472.58	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	99.9
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 40.73		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ලබා දීම – 26%		
2023 වසර සඳහා යෝජිත වැඩසටහන	-		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• ගොවි පවුල් 12,500කට අයත් ඉඩම් හෙක්ටයාර 10,932ක් සඳහා දෙකන්නය වගා කිරීමට වාරි ජල පහසුකම් සැපයීම. • කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්කවල පවුල් 100,000ක් සඳහා පානීය ජලය සැපයීම. • මෙගා වොට් 1.5ක ජල විදුලි උත්පාදනය.		

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

1. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන විශේෂ වැඩසටහන් වල ප්‍රගතිය

1.1 වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 3,957.10	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අනුරාධපුර, වවුනියා, මුලතිවු
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා තීව්‍රතාවය**	
ව්‍යාපෘති කාලය	2012 ජනවාරි - 2023 දෙසැම්බර්	**ප්‍රතිලාභීන්**	පවුල් 5,700
ප්‍රතිපාදන 2022	රු.මි. 40.00	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 32
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 2,534.38	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	92.50%
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 37.66		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• මාර්ග ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම - කිලෝමීටර් 30 • වැව් පුනරුත්ථාපනය - වැව් 01 • ඇළ පුනරුත්ථාපනය - කිලෝමීටර් 1.5 • ගොඩනැගිලි ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම - ගොඩනැගිලි 01 • බිම් කොටස් මැනුම් - කැබලි අක්ෂර 744 • ඔප්පු ප්‍රදානය - ප්‍රදාන සහ ඔප්පු 1940ක් සම්පූර්ණ කර ඇත. • ආයතනික සහ ප්‍රජා සංවර්ධන වැඩසටහන - වැඩසටහන් 83ක් අවසන් කර ඇත.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• මාර්ග ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය - කිලෝමීටර් 422 • නල බෝක්කු 393ක් ප්‍රතිසංස්කරණය කරන ලදී. • ඇළ කිලෝමීටර් 81ක් ප්‍රතිසංස්කරණය කර ඇත. • වැව් ප්‍රතිසංස්කරණය සහ ව්‍යුහයන් ඉදිකිරීම/ ප්‍රතිසංස්කරණය කිරීම - වැව් 01ක් සහ ව්‍යුහ 131ක්. • කැබලි අක්ෂර 16,698ක් මැනීම. • ප්‍රදාන සහ ඔප්පු 5,412ක් සම්පූර්ණ කර ඇත. • ආයතනික සහ ප්‍රජා සංවර්ධන වැඩසටහන් 1,498ක් පවත්වන ලදී. • ගොඩනැගිලි 140ක් ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම. • ගොවීන් 5,800ක් සඳහා කෘෂිකර්ම හා පශු සම්පත් ව්‍යාප්ති සේවා		
2023 වසර සඳහා වැඩසටහන	• ව්‍යාපෘතියේ ඉතිරි වැඩ අවසන් කර ව්‍යාපෘතිය නිම කිරීම.		

1.2 රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 1,100.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	බදුල්ල (රිදීමාලියද්ද)
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා තීව්‍රතාවය**	
ව්‍යාපෘති කාලය	2012 ජනවාරි - 2022 දෙසැම්බර්	**ප්‍රතිලාභීන්**	පවුල් 19,127
ප්‍රතිපාදන 2022	රු.මි. 40.00	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	-
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 870.57	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	98%
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 33.99		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• මාර්ග ප්‍රතිසංස්කරණය - කිලෝ මීටර 18.5 • හෙක්ටයාර 3,468ක් තුළ ආනයනික සීමා සහිත බෝග වගා කිරීම සිදු කර ඇත. • ගෙවතු සංවර්ධනය යටතේ ගෙවතු 17,079ක් සංවර්ධනය කර ඇත. • ගොවීන්/ නිලධාරීන් පුහුණු වැඩසටහන් යටතේ වැඩසටහන් 48ක් පවත්වා ඇත. • ආයතනික සහ ප්‍රජා සංවර්ධන වැඩසටහන් 25ක් පවත්වා ඇත. • රුක් රෝපණ වැඩසටහන් 3ක් යටතේ රුක් රෝපණ කටයුතු සිදු කර ඇත. • වැව් 2ක් ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු අවසන් වී ඇත. • ගොඩනැගිලි 1ක් ඉදිකර නඩත්තු කර ඇත.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• වැව් 22ක් ප්‍රතිසංස්කරණය කර ඇත. • එක් ව්‍යුහයක් පුනරුත්ථාපනය කර ඇත. • ඇළ කිලෝමීටර 72.48ක් ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර ඇත. • මාර්ග ප්‍රතිසංස්කරණය - කිලෝ මීටර 108.10 • බෝක්කු 4ක් ප්‍රතිසංස්කරණය කර ඇත • ගොඩනැගිලි 43ක් නිම කර ඇත. • ආනයනික සීමා සහිත බෝග වගා කිරීම - හෙක්ටයාර 1,508 • ගෙවතු 17,079ක ගෙවතු සංවර්ධනය • ගොවීන්/ නිලධාරීන් පුහුණු වැඩසටහන් යටතේ වැඩසටහන් 48ක් පවත්වන ලදී. • සනීපාරක්ෂක පහසුකම් 2,284ක් සපයා ඇත. • ආයතනික සහ ප්‍රජා සංවර්ධන වැඩසටහන් 310ක් පවත්වන ලදී. • රුක් රෝපණ වැඩසටහන් 9ක් පවත්වන ලදී.		

1.3 රඹකැන් ඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 1,086.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අම්පාර (මහඔය/ පදියතලාව)
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා තීව්‍රතාවය**	-
ව්‍යාපෘති කාලය	2012 දෙසැම්බර් - 2023 දෙසැම්බර්	**ප්‍රතිලාභීන්**	පවුල් 15,975
ප්‍රතිපාදන 2022	රු.මි.60.00	**2023 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 43.00
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි.706.64	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	86%
2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි.46.63		
2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ආනයනික සීමා සහිත බෝග වගා කිරීම - හෙක්ටයාර 2,084 • ගෙවතු සංවර්ධනය - උද්‍යාන 13,715ක් • ගොවීන්/ නිලධාරීන් පුහුණු වැඩසටහන් - 60. • මාර්ග ප්‍රතිසංස්කරණය - කිලෝමීටර 35 • වැව් 3ක් ප්‍රතිසංස්කරණය කිරීම. • ගොඩනැගිලි 4ක් ඉදිකිරීම. • ඉඩම් මැනුම් සහ කට්ටි කිරීම් - බිම් කැබලි 600 • බලපත්‍ර නිකුත් කිරීම - බලපත්‍ර 359 • කැබලි අක්ෂර 28ක් සඳහා වන්දි ගෙවන ලදී. • ආයතනික සහ ප්‍රජා සංවර්ධන වැඩසටහන් 78		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• හෙක්ටයාර 2,084ක ආනයනික සීමා සහිත බෝග වගා කිරීම. • ගෙවතු සංවර්ධනය - උද්‍යාන 13,715ක් • ගොවීන්/ නිලධාරීන් පුහුණු වැඩසටහන් - 60 • මාර්ග ප්‍රතිසංස්කරණය කිලෝමීටර 246ක් සම්පූර්ණ කර ඇත. • වැව් 3ක් නිම කර ඇත. • කෙත් ඇළ සහ බෙදුම් ඇළ කිලෝමීටර 1.925ක් සහ අමුණු 2ක් ප්‍රතිසංස්කරණය කිරීම. • ගොඩනැගිලි 79ක් නිම කර ඇත. • ඉඩම් මැනුම් කිරීම සහ කට්ටි කිරීම - කැබලි 2,264ක් සම්පූර්ණ කර ඇත. • අවසර පත්‍ර 2,137 නිකුත් කරන ලදී. • කැබලි අක්ෂර 568ක් සඳහා වන්දි ගෙවා ඇත. • ආයතනික සංවර්ධන වැඩසටහන් 514ක් සම්පූර්ණ කර ඇත. • කුඩා ව්‍යාපාර 51ක් සඳහා වෙළඳපල අවස්ථා ලබාදීම සහ ව්‍යවසායකත්ව සංවර්ධනය (වැඩසටහන් 10ක්) • 50% දායකත්වය යටතේ 41 දෙනෙකු සඳහා යන්ත්‍රෝපකරණ සැපයීම • ළිං 121ක් ඉදි කර පානීය ජල සම්පාදනය • සනීපාරක්ෂක සෞඛ්‍ය සේවා වැඩි දියුණු කිරීම • විදුලි අලි වැට කිලෝමීටර 10ක් නඩත්තු කිරීම • රුක් රෝපණ වැඩසටහන යටතේ පැල 5,000ක් සිටුවා පරිසර වැඩසටහන් 8ක් පවත්වන ලදී.		
2023 වසර සඳහා වැඩසටහන	• ව්‍යාපෘතියේ ඉතිරි වැඩ අවසන් කර ව්‍යාපෘතිය නිම කිරීම.		

2. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ සිදුකරන සංවර්ධන කටයුතු

2.1. කෘෂිකර්මය, පශු සම්පත් සහ ධීවර කටයුතුවල ප්‍රගතිය

කෘෂිකර්මාන්තයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

අංක	ප්‍රධාන සංරචකය	ඉලක්කය (මෙ. ටො) (වාර්ෂික)	ප්‍රගතිය (මෙ.ටො)	%
1	**කෘෂිකර්ම නිෂ්පාදනය**			
1.1	**බීජ - මහවැලි ගොවිපල**			
	බීජ වී	2,832.6	1,443.00	85%
	වෙනත් ක්ෂේත්‍ර බෝග	83.8	15.12	18%
1.2	**බීජ - ගොවීන්**			
	බීජ වී	4,909.5	5,018.50	102%
	වෙනත් ක්ෂේත්‍ර බෝග	1,232.1	1,008.20	82%
1.3	**ආහාර බෝග නිෂ්පාදනය**			
	වී	985,547.0	723,944.00	73%
	වෙනත් ක්ෂේත්‍ර බෝග			
	ලොකු ලූනු	74,792.0	11,358.00	15%
	සෝයා	7,227.0	8,485.90	117%
	උඳු	5,485.0	1,244.00	23%
	කවුපි	2,634.0	1,861.00	71%
	කුරක්කන්	2,479.0	1,366.50	55%
	මුං ඇට	10,121.0	1,319.00	24%
	බඩ ඉරිඟු	83,417.0	20,112.00	24%
	රට කජු	8,436.0	2,388.00	28%
	මිරිස්	64,435.0	10,140.00	16%
	තල	753.0	394.40	52%
	කහ	5,750.0	6,820.00	119%
	ඉඟුරු	3,680.0	4,680.00	127%
1.4	**පළතුරු**			
	කෙසෙල්	182,340.0	152,230.00	83%
	පැපොල්	57,036.0	38,970.00	68%
	පේර	20,750.0	18,020.00	87%
	අනෙකුත් පලතුරු (අඹ, Dragon fruit, අන්නාසි, පැෂන්, තැඹිලි)	35,852.0	74,337.00	207%
1.5	**එළවළු**	233,175.0	212,154.00	91%
2	**කාබනික කලාප සංවර්ධනය - වී**	1,970.0	1,745.80	89%
2.1	මහවැලි කලාප වල කාබනික පොහොර නිෂ්පාදනය - කොම්පෝස්ට්	304,532	27,199.00	9%

2.2 පශු සම්පත් නිෂ්පාදනයේ ප්‍රගතිය සහ පශු සම්පත් හා ධීවර අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම්

	ප්‍රධාන සංරචකය	ඉලක්කය (වාර්ෂික)	ප්‍රගතිය	%
	සත්ත්වපාලන			
1	මිරිදිය මත්ස්‍ය (මෙ.ටො)	14,000	14,397.70	100%
2	කිරි (ලිටර් මිලියන)	50	48.34	96%
3	බිත්තර (මිලියන)	80	61.00	76%
4	විසිතුරු මසුන් (මිලියන)	41	43.55	100%

	ප්‍රධාන ක්‍රියාකාරකම	ඒකකය	ඉලක්කය **2022**	ප්‍රගතිය **31.12.2022**
1.1	**කිරිගව සංවර්ධනය**			
	ගොවිපල සැලසුම් සැකසීම හා කිරි ගොවීන් පුහුණු කිරීම	කිරි ගොවි පවුල්	2,000	1,445
	ගව නිවාස හා උපාංග ලබාදීම	නිවාස හා උපාංග	380	420
1.2	**විසිතුරු මත්ස්‍ය වගාව**			
	අභිජනන ගොවිපල සංවර්ධනය	ගොවීන්	17	12
	මඩ පොකුණු/ නිරෝධායන පොකුණු ලබාදීම/ යටිතල පහසුකම් සංවර්ධනය	ගෘහ	102	97
1.3	**කුකුළු නිෂ්පාදන ප්‍රවර්ධනය**			
	සුළු පරිමාණ ගොවීන් මධ්‍ය පරිමාණයට පුළුල් කිරීම	ගොවි පවුල්	120	120
	මසක් වයසැති පැටවුන් ලබාදීම	වැඩසටහන්	40,536	37,692
	මධ්‍ය පරිමාණ ගොවීන් වාණිජ ඒකක බවට පත් කිරීම	ගොවිපල	37	37
1.4	**මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ප්‍රවර්ධනය**			
	මත්ස්‍ය ඇඟිල්ලන්	මිලියන	32	21.31
	මත්ස්‍ය ඇසිත්තන්	මිලියන	6.00	5.94
	මිරිදිය ඉස්සන්	මිලියන	4	4
	දැල්කූඩු ලබාදීම	කූඩු	9	9

3. වාරි සෞභාග්‍ය වැඩසටහන

වැව් ප්‍රතිසංස්කරණ වැඩසටහනේ ප්‍රගතිය (2022.12.31)

කලාප	2022 සඳහා හඳුනාගත් වැව්	ප්‍රතිපාදන (රු. මී)	පුනරුත්ථාපනය කළ වැව් 2022	
			ඉලක්කය	ප්‍රගතිය
බී	9	4.00	3	1
සී	8	17.80	5	2
ඩී	14	7.73	9	4
ජී	0	0	0	0
එච්	37	16.21	21	20
හුරුළුවැව	1	0.32	1	0
එල්	5	1.70	2	0
වලව	5	8.97	3	1
රඹකැන් ඔය	25	23.10	9	4
ඊ	7	0.20	1	0
එකතුව	**111**	**80.00**	**54**	**32**

4. මහවැලි ආයෝජන කලාප සහ පාරිසරික සංචාරක කලාප සංවර්ධනය

මහවැලි ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම

ප්‍රධාන ක්‍රියාකාරකම	ඒකකය	වාර්ෂික ඉලක්කය	ප්‍රගතිය
ආයෝජන ව්‍යාපෘති සඳහා ආයෝජකයින් තෝරා ගැනීම	ඇගයීමට ලක්කළ අයදුම්කරුවන් සංඛ්‍යාව	200	165
	බැහැර කළ ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර)	100	14.58

5. ආයතන සංවර්ධන අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

	ප්‍රධාන සංරචකය	ඉලක්කය	ප්‍රගතිය	%
1	ව්‍යත්තීය පුහුණු වැඩසටහන් (තරුණයින්)	975	697	71%
2	මහවැලි කලාපවල දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනාගෙන ඔවුන් ජාතික හා ජාත්‍යන්තර මට්ටමට ගෙන ඒම (ක්‍රීඩක ක්‍රීඩිකාවන්)	2,050	2,264	100%
3	මහවැලි සවිය ණය යෝජනා ක්‍රමය යටතේ තෝරාගත් කුඩා පරිමාණ ව්‍යවසායකයින්ට ණය පහසුකම් ලබා දීමෙන් ඔවුන්ගේ ව්‍යාපාර දියුණු කිරීම (ප්‍රතිලාභීන්)	250	367	100%

6. ඉඩම් ලබා දීම

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් ප්‍රදාන නිකුත් කිරීමේ ප්‍රගතිය - 2022.12.31

	කලාප	වාර්ෂික ඉලක්කය	ප්‍රගතිය
1	බී	6,700	4,307
2	සී	7,700	3,975
3	ඩී	300	757
4	ඊ	100	103
5	ජී	1,100	1,717
6	එච්	5,600	5,330
7	එල්	5,000	1,244
8	හුරුළුවැව	1,600	689
9	රඹකැන් ඔය	1,500	717
10	වලව	34,800	4,559
	එකතුව	**64,400**	**23,398**

7. පරිසර සංරක්ෂණය

පරිසර සංරක්ෂණ වැඩසටහනේ ප්‍රගතිය - 2022.12.31

	ප්‍රධාන සංරචක	ඒකකය	ඉලක්කය 2022	ප්‍රගතිය 2022.12.31
1	පැල නිෂ්පාදනය (මහවැලි තවාන්, පාසල් ළමුන් හා ගොවීන් මඟින්)	පැල	661,250	608,795
2	ඉහළ ජලාධාර හා පහළ නිම්න ප්‍රදේශ ආශ්‍රිත රුක්රෝපණය	පැල	197,600	90,599
3	ඉහළ ජලාධාර ප්‍රදේශ ආශ්‍රිත පාංශු සංරක්ෂණ වැඩසටහන	මීටර	20,000	9,449
4	පරිසර අධ්‍යාපන හා ප්‍රවර්ධන	වැඩසටහන්	101	80
5	පාරිසරික බලපෑම් අධ්‍යයනය	ව්‍යාපෘති	5	5
6	ඉහළ ජලාධාර ප්‍රදේශ ආශ්‍රිත ජල තත්ත්ව හා ජල විද්‍යා අධ්‍යයනය	ස්ථාන	27	27
7	පටක රෝපිත පැල නිෂ්පාදනය	පැල	370,000	29,232
8	අලිමිනිස් ගැටුම අවම කිරීම (අලිවෙඩි, එනජයිසර් ආදිය) හා ජීව වැට නඩත්තුව	කි.මී	31.5	28
9	ආක්‍රමණශීලී ආගන්තුක ජලජ ශාක ඉවත්කිරීම	වැව් ගණන/ හෙක්ටයාර	4	4
10	උද්‍යාන අලංකරණය හා කසළ කළමනාකරණය	වැඩසටහන්	3	3
11	හරිත උද්‍යාන පිහිටුවීම	උද්‍යාන	12	1

වාරිමාර්ග කළමනාකරණ අංශය (IMD)

ඒකාබද්ධ වාරිමාර්ග කළමනාකරණ වැඩ සටහන (INMAS) ක්‍රියාත්මක කිරීම සඳහා 1984 වර්ෂයේ දී ආරම්භ කරන ලද වාරිමාර්ග කළමනාකරණ අංශය විසින් හෙක්ටයාර් 400ට වැඩි මහා වාරිමාර්ග බල ප්‍රදේශ 54ක සහභාගිත්ව කළමනාකරණ ක්‍රියාවලිය ශක්තිමත් කරගෙන යනු ලැබේ. මෙම වැඩසටහනේ දැක්ම වනුයේ ගොවීන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීම හා ස්වයං කළමනාකරණය සඳහා, ආත්ම විශ්වාසය පදනම් කරගත් වාරිමාර්ග ජනාවාස ආශ්‍රිත ශක්තිමත් ගොවි ප්‍රජාවක් බිහි කිරීමයි. ගොවි සංවිධාන, රාජ්‍ය හා පෞද්ගලික ආයතන සහ රාජ්‍ය නොවන ආයතන යන පාර්ශවයන්ගේ සහභාගිත්වය සහ දායකත්වය තුළින් මහා වාරිමාර්ග ව්‍යාපාර වල ජල ඒකකයක හා ඉඩම් ඒකකයක ඵලදායීතාවය ඉහළ නංවමින් ඒකාබද්ධ ජල කළමනාකරණය තුළින් ගොවි ජනතාවගේ තිරසර ආර්ථික සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම මෙම වැඩසටහන තුළින් අපේක්ෂා කෙරේ.

මහා වාරිමාර්ග බල ප්‍රදේශවල විධිමත් කළමනාකරණයක් හරහා නිෂ්පාදන ඵලදායීතාව වැඩි කිරීමේ අරමුණෙන් ගොවි සංවිධාන පිහිටුවීම, ශක්තිමත් කිරීම හා සක්‍රීයව පවත්වාගෙන යාම, වාරිමාර්ග උප පද්ධති නඩත්තු හා මෙහෙයුම් කටයුතු වැඩි දියුණු කිරීම, කෘෂි නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පහසුකරණය, වාතාවරණය සැකසීම හා සම්බන්ධීකරණය තුළින් ගොවි ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම මෙම අංශයේ වගකීම වේ.

දැක්ම

"මහා වාරිමාර්ග ආශ්‍රිතව සෞභාග්‍යමත් ගොවි ප්‍රජවක් බිහි කිරීම"

මෙහෙවර

"සංවිධිත ගොවි ප්‍රජාවක් තුළින් සහ යෙදවුම් හා සේවා සැපයුම් ආයතන සම්බන්ධීකරණයෙන් කෘෂිකාර්මික නිෂ්පාදනය හා වාරි ජල ඒකකයක ඵලදායීතාව ඉහළ නැංවීම"

අරමුණු

- වාරිමාර්ග ජල ඒකකයකින් සහ ඉඩම් ඒකකයකින් ලබන ආර්ථික වාසි උපරිම කිරීම
- වාරිමාර්ග ජලය සාධාරණව හා සමානාත්මකව ගොවීන් අතර බෙදා ගැනීම සඳහා පහසුකරණය
- වාරිමාර්ග ආශ්‍රිත සම්පත් කළමනාකරණයට ගොවීන් සහභාගී කරගැනීම සඳහා අවශ්‍ය ආයතනික ව්‍යුහය සකස් කිරීම/ ශක්තිමත් කිරීම/ පවත්වාගෙන යාම
- වාරිමාර්ග පද්ධතිවල මෙහෙයුම් හා නඩත්තු කටයුතු ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාම සඳහා පසුබිම සැකසීම හා පහසුකරණය
- ප්‍රතිලාභීන් හා රජය මෙන්ම පෞද්ගලික ආයතන අතර මනා සම්බන්ධීකරණය තුළින් කෘෂිකාර්මික නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායීතාව ඉහළ නැංවීම
- ගොවි ප්‍රජාවගේ දැනුම හා කුසලතා සංවර්ධනය කිරීම තුළින් සුභවාදී ආකල්ප ඇති කිරීම
- කෘෂිකාර්මික සහාය සේවාවන් ශක්තිමත් කිරීම
- ගොවි පවුල්වල ආර්ථික හා සමාජ සංවර්ධනය

2022 වසර තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

1. ගොවි සංවිධාන ශක්තිමත් කිරීම හා බල ගැන්වීම

මෙම අංශය මගින් කළමනාකරණය කරනු ලබන මහා වාරිමාර්ග ව්‍යාපාර 54 හි ගොවි සංවිධාන 899ක් පිහිටුවා ඇති අතර එම ගොවි සංවිධාන ආයතනික වශයෙන් ශක්තිමත් කර ඒවායේ යහපාලනය සහ විනිවිදභාවය තහවුරු කිරීම හා සක්‍රිය මට්ටමින් පවත්වාගෙන යාම සඳහා විවිධ කාර්යයන් ඉටුකරන ලදී.

උදා : ගොවි සංවිධාන අවසන් ගිණුම් සැකසීම සහ ගිණුම් විගණනය සඳහා යොමු කිරීම, ගොවි සංවිධාන මහ සභා හා මාසික කමිටු රැස්වීම් පැවැත්වීම, ගොවි සංවිධාන විෂය කමිටු පිහිටුවීම, ආදර්ශ ගොවි සංවිධාන ඇති කිරීම, අරමුදල් වර්ධනය.

2. වාරිමාර්ග කළමනාකරණය

ජලය ඇතුළු කෘෂිකාර්මික යෙදවුම් සේවා කලට වෙලාවට සැපයීම තහවුරු කිරීම සඳහා නියමිත වේලාවට පෙර කන්න රැස්වීම් පවත්වා කන්න රැස්වීම් පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකරණය කිරීම, කන්න රැස්වීම් තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පසු විපරම් කිරීම හා වාරිමාර්ග කළමනාකරණ කටයුතු කාර්යක්ෂමව පවත්වා ගෙන යාමට අවශ්‍ය තීරණ ගැනීම සඳහා මාසිකව ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සිදු කරන ලදී.

ඒ අනුව ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් 468 ක් ද, පෙර කන්න රැස්වීම් 10ක් ද, කන්න රැස්වීම් 180ක් ද පවත්වා ඇත.

3. සහභාගීත්ව නඩත්තුව හා ජල කළමනාකරණ වැඩසටහන

මෙම අංශය මගින් කළමනාකරණය කරනු ලබන මහා වාරිමාර්ග බලප්‍රදේශ 54 හි වාරිමාර්ග උප පද්ධතියේ (බෙදුම් ඇළ හා කෙත් ඇළ) මෙහෙයුම් හා නඩත්තු කටයුතු ගොවි සංවිධානවලට භාර දී ඔවුන් මගින් ඉටු කරවා ගනු ලබයි. මෙම කාර්යය ගුණාත්මයෙන් යුක්තව ඉටු කිරීම සඳහා ගොවි සංවිධාන මෙහෙයවීම, මගපෙන්වීම, පහසුකරණය සහ ඒ සඳහා ගොවි සංවිධාන නිලධාරීන්ගේ දැනුම හා කුසලතාවය වර්ධනය කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

ඒ අනුව ඇළ සහ පාර දෙපස තණකොළ කැපීම, කෘෂි මංමාවත් හා දියබස්නා ඇළ නඩත්තුව, නිරන්තර නඩත්තු සැලසුම් සැකසීම සහ යථාවත් කිරීම, රක්ෂිත මායිම් ලකුණු කිරීම, රක්ෂිත සංරක්ෂණය සඳහා ගල්කණු 3,077ක් සහ පැළ 2,600ක් සිටුවීම සිදුකර ඇත.

2022 සිරි දළදා යල් අස්වනු පූජාව වාරිමාර්ග අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගේ සහභාගීත්වයෙන් මෙම අංශය මගින් මෙහෙයවනු ලබන ජාතික ඒකාබද්ධ ගොවි සංවිධානය, මහා වාරිමාර්ග ව්‍යාපාරවල ගොවි සංවිධාන නායකයින් හා ගොවීන් 2000ක පමණ සහභාගීත්වයෙන් 2022 ඔක්තෝම්බර් 27 හා 28 දෙදින ශ්‍රී දළදා මාලිගාවේ දී

හත්වන වරටත් පවත්වන ලදි. දළදා මාලිගාවට අමතරව පුල්ලයාර් කෝවිල, මීරා මක්කම් පල්ලිය, ශාන්ත පාවුළු දෙවිමැදුරට යල් අස්වනු පූජාකිරීම මෙම යල් අස්වනු පූජාවේ විශේෂත්වයකි. සියළු ජාතීන් නියෝජනය කරමින් ගොවීන් සහභාගී වීම හා යල් කන්නයේ වගාකරණ ලද සියළු බෝග වල අස්වැන්නේ අග්‍රඵල පූජා කිරීම මෙම සංස්කෘතික මංගල්‍යයේ තවත් විශේෂත්වයකි.

මෙම වසරේ දී ද මාර්තු 22 දිනට යෙදුණු ලෝක ජල දිනය සැමරීම වෙනුවෙන් වාරි බල ප්‍රදේශ මට්ටමින් ගොවීන්, ගොවි සංවිධාන නායකයින් සහ වාරි බල ප්‍රදේශ තුළ පාසල් සිසුන් සම්බන්ධ කරගෙන ජලයේ වැදගත්කම සහ ජලය කාර්යක්ෂම ලෙස භාවිතා කිරීමට පෙළඹවීම සඳහා වැඩසටහන් ක්‍රියාතමක කරන ලදී.

4. කෘෂි නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායීතාව ඉහළ නැංවීම

මෙම අංශයේ සම්බන්ධීකරණය, මෙහෙයවීම හා පහසුකරණය යටතේ ඒකාබද්ධ මහා වාරිමාර්ග කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලද මහා වාරිමාර්ග ව්‍යාපාර 54හි කෘෂිකාර්මික නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායීතාවය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

විශේෂිත දර්ශක	2021 /22 මහ සහ 2022 යල ප්‍රගතිය			
	ඒකකය	2021 /22 මහ	2022 යල	එකතුව
• වී වගා කළ බිම් ප්‍රමාණය (හෙක්)	හෙක්.	129,446	130,083	**259,529**
• වෙනත් ආහාර බෝග වගාව හා එළවළු වගාව	හෙක්	12,333	13,513	**25,846**
• බහු වාර්ෂික බෝග වගාව (කෙසෙල්, උක්)	හෙක්	4,581	5,266	**9,847**
• වගා කළ මුළු බිම් ප්‍රමාණය	හෙක්	146,360	148,862	**295,222**
• වගා තිව්‍රතාවය%	%	87%	89%	**176%**
• මුළු වී නිෂ්පාදනය	ටොන් මිලියන	0.524	0.514	**1.038**

5. ක්‍රියාත්මක කරනු ලැබූ විශේෂ වැඩසටහන්

- මහා වාරිමාර්ග ව්‍යාපාර බල ප්‍රදේශවල කාබනික පොහොර මෙ.ටො. 24,052 නිෂ්පාදනය කිරීම

  2021/22 මහ සහ 2022 යල කන්න තුළ කාබනික පොහොර භාවිතා කර හෙක්ටයාර 36,019ක් වගා කිරීම (ගොවීන් සංඛ්‍යාව 56,513)

  රිදීබැදිඇල, හක්වටුනාඔය, පදවිය, මහකනදරාව, නුවරවැව, මුතුකණ්ඩිය, රිදියගම, කන්තලේ ව්‍යාපාරවල කාබනික ද්‍රව්‍යයක් ලෙස ග්ලිරිසීඩියා දඬු 11,371ක් වගා කිරීම

- කන්තලේ, කිරිදිඔය, කවුඩුළුවැව, වේලිඔය, නීලබැම්ම, රාජාංගනය, මුරුතවෙල, නුවරවැව, මීඔය, උස්ගල, තබ්බෝව, පරාක්‍රමසමුද්‍රය, ගල්ඔය ව.ඉ., දම්බරාව, මිනිපේ, දේවහුව, බදුළුඔය, බත්මැඩිල්ල, මහවිලච්චිය, නාච්චාදුව, පදවිය, අක්කරපත්තුව, දමන, මින්නේරිය, ගිරිතලේ, හක්වටුනාඔය, රිදීබැදිඇල මහා වාරිමාර්ග ව්‍යාපාරවල අක්කර 28,843ක 3 වන කන්නයේ මුං වගාව ව්‍යාප්ත කිරීම
- කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා කිරි ගවයින් 20, ගවගාල් 16ක්, හෙක්.2.5 ක CO3 තෘණ වගා කිරීම හා බැංකු මගින් මූල්‍ය පහසුකම් ලබා දීමට අවශ්‍ය පහසුකරණය හා සම්බන්ධීකරණය කිරීම.
- මුතුකණ්ඩිය වැවේ ජල පෝෂක ප්‍රදේශයේ වන පැළ 1000 ක් සිටුවීම සහ ගොවි සංවිධානවල දායක්වය ඇතිව වාරිමාර්ග රක්ෂිතවල වන පැළ 8,395 ක් සිටුවීම.
- ගොවි සංවිධාන අරමුදල් වලින් ප්‍රතිලාභීන් 2,084දෙනෙකුට රු. මිලියන 45ක වගා ණය ලබාදීම.

මෙයට අමතරව මෙම අංශය වෙත සහ නේවාසික ව්‍යාපාර කාර්යාල වලට ලැබුණු මහජන පැමිණිලි / දුක් ගැනවිලි 4,291කින් 4,204කට විසඳුම් ලබා දී ඇත.

ගොවි පවුලේ ආදායම් උත්පාදනය වැඩි කිරීම අරමුණු කරගෙන දිස්ත්‍රික්කය තුළ විදාතා මධ්‍යස්ථාන සහ කුඩා කර්මාන්ත අංශය සම්බන්ධ කර ගනිමින් ගොවි සංවිධානවල කාන්තා සාමාජිකයින් ස්වයං රැකියා සඳහා යොමු කිරීමට වැඩසටහන් හඳුන්වාදීම, ක්‍රියාත්මක කිරීම, පුහුණු කිරීම සඳහා සම්බන්ධීකරණය හා පහසුකරණය සිදු කරන ලදි.

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB)

පිහිටුවන ලද වර්ෂය - 1973

දැක්ම

ලෝක තත්ත්වයේ ඉංජිනේරු ආයතනයක් වීම.

මෙහෙවර

මනුෂ්‍ය වර්ගයාගේ ප්‍රශස්ත ශුභ සිද්ධිය සඳහා සම්පත් උපරිම අයුරින් පරිහරණය කිරීම උදෙසා දක්වන ලද දායකත්වය වෙනුවෙන් අගයනු ලැබූ, ඉහළ අභිප්‍රේරණයක් සහිත පුහුණු හා දක්ෂ ශ්‍රම බලකායක් සමඟින් නූතන තාක්ෂණ විධික්‍රම යොදා ගනිමින් ඉංජිනේරුමය කාර්යයන්හි, ගෘහ නිර්මාණ සහ ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයේ විශිෂ්ටත්වය අත්පත් කර ගනිමින් ලෝක මට්ටමේ ඉංජිනේරුමය ආයතනයක් කරා ගමන් කිරීම.

CECB සමූහයෙහි ප්‍රධාන අංශය



CECB හි මූලික ව්‍යාපාර හා ඉංජිනේරු සේවා අංශ

- ජල විදුලිය හා බලශක්තිය
- බලශක්ති සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම
- ගොඩනැඟිලි සහ නාගරික යටිතල පහසුකම්
- වාරිමාර්ග හා ජල සම්පත් සංවර්ධනය
- මාර්ග, දුම්රිය මාර්ග සහ පාලම්
- ගුවන් තොටුපල සංවර්ධනය
- වරාය/වෙරළ සහ සමුද්‍ර කටයුතු
- විදුලි හා යාන්ත්‍රික වැඩ
- ජල සම්පාදන, මලාපවහන සහ ජලාපවහන
- තොරතුරු තාක්ෂණය
- ශක්‍යතා සහ පාරිසරික අධ්‍යයනය සහ ආපදා අවදානම් කළමනාකරණය
- තාක්ෂණික විගණනය/ බලශක්ති විගණනය/ වේලි ආරක්ෂාව
- භූ-තාක්ෂණික විමර්ශනය, සමීක්ෂණය හා රසායනාගාර සේවා

දැනට ක්‍රියාත්මක වන ප්‍රධාන උපදේශන සේවා ව්‍යාපෘති

	උපදේශන සේවා ව්‍යාපෘති	**ඇස්තමේන්තු ගත මුදල (රු. මිලියන)**	**2022.12.31 දිනට අපගේ සේවා සැපයීමේ ප්‍රගතිය%**
1.	ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය (DHQC), අකුරගොඩ	6,728	65%
2.	කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය **(Portcity)** - යටිතල පහසුකම් සහ භූමිනිර්මාණ	564.22	83.1%
3.	ශ්‍රී ලංකා වරාය අධිකාරිය (SLPA) සඳහා යෝජිත සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානය සහ කම්හල් සංකීර්ණය ඉදිකිරීම	1,090	80%
4.	නාවික ජැටිය ඉදිකිරීම, ත්‍රිකුණාමලය	3,429	36%
5	මාහෝ සිට ඕමන්ත දක්වා දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීම	15,800	28%
6	යෝජිත තාක්ෂණික උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය, ගාල්ල සහ කුරුණෑගල	16,172	9.3%
7.	සෞඛ්‍ය අමාත්‍යාංශය සඳහා යෝජිත ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම	5,199	54%
8	ජලවිදුලි ව්‍යාපෘතිය, බ්‍රෝඩ්ලන්ඩ්	16,000	95.2%
9	බොරැල්ල එලියට පෙදෙසේ පිහිටි නේවාසික ගොඩනැගිලි ව්‍යාපෘතිය : නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - කොළඹ නගරය	6,000	80%
10	අධිකරණ සංකීර්ණය, මහාධිකරණ සහ දිසා අධිකරණ සංකීර්ණය, විනිසුරුවරුන්ගේ / අමාත්‍යාංශ කාර්ය මණ්ඩල නිවාස සංකීර්ණය ඉදිකිරීම – අලුත්කඩේ, කොළඹ 12	13,200	39.7%
11.	ශ්‍රී ජයවර්ධනපුර හෙද පීය ගොඩනැගිල්ල ඉදිකිරීම	7,172	68.3%

12	රත්නපුර අධිකරණ සංකීර්ණය ඉදිකිරීම	1,236.7	82%
13.	තැලිසීමියා සහ ඇටමිදුළු බද්ධ කිරීමේ ඒකකය - ශික්ෂණ රෝහල, මහනුවර	857	50%
14	වෛද්‍ය වාට්ටු සංකීර්ණය ii අදියර - කළුතර මහ රෝහල	2,450	30%
15	බදුල්ල පළාත් මහ රෝහලේ මහල් දහයක ගොඩනැගිල්ලක් ඉදිකිරීම.	2,764.88	17%
16	හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම - II අදියර යාපනය	1,224.6	66%
17	ශ්‍රී ජයවර්ධනපුර හෙද පීඨ නවාතැන් ගොඩනැඟිලි අංක 02 ඉදිකිරීම	5,247	50%

දැනට ක්‍රියාත්මක වන ඉදිකිරීම් අංශයේ ව්‍යාපෘති

	ඉදිකිරීම් අංශයේ ව්‍යාපෘති	**ඇස්තමේන්තු ගත මුදල රු. මිලි.**	**2022.12.31 දිනට සේවා සැපයීමේ ප්‍රගතිය %**
1	ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම, සෞඛ්‍ය අමාත්‍යාංශය	5,199	54%
2	රත්නපුර අධිකරණ සංකීර්ණය ඉදිකිරීම	1,303.3	89%
3	අම්පාර දිස්ත්‍රික් මහ රෝහලේ හදිසි අනතුරු සහ හදිසි සත්කාර ඒකකය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම	608.36	33%
4	කරාපිටිය ශික්ෂණ රෝහලේ යෝජිත වකුගඩු රෝග, ඩයලිසිස් සහ බද්ධ කිරීමේ ඒකකයක් ඉදිකිරීම	790	98.6%
5	කරාපිටිය ශික්ෂණ රෝහලේ විශේෂිත ළමා රෝග ඒකකයක් ඉදිකිරීම	1,427.5	26.59%
6	රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහල් දොළහක ගොඩනැගිලි සංකීර්ණය සැලසුම් කිරීම, ඉදිකිරීම, අධීක්ෂණය, පැවරීම, නිම කිරීම සහ නඩත්තු කිරීම	1,091	16.93%
7	කරාපිටිය ශික්ෂණ රෝහලේ මුඛ සෞඛ්‍ය ඒකකය ඉදිකිරීම	997.3	38%
8	හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම -II අදියර යාපනය	1,224.6	60%
9	බදුල්ල පළාත් මහ රෝහලේ මහල් දහයක ගොඩනැගිල්ලක් ඉදිකිරීම	2,764.88	17%
10	බණ්ඩාරවෙල, දියතලාව, හපුතලේ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය	530	65%
11	අනුරාධපුර පූජ්‍ය සෝභිතගම නිවාස 153ක් සහ යටිතල පහසුකම් ඉදිකිරීම	279	0.25%

CECB සඳහා දැනට පවතින අභියෝග

- ස්වයං මූල්‍ය ආයතනයක් ලෙස රාජ්‍ය ආයතනවලින් නොගෙවන ණය හේතුවෙන් සංවිධානය පවත්වාගෙන යාම අපහසුවීම.
  - දිගු කාලීන ණයගැතියන් ණය පියවීම පැහැර හැරීම
- CECB බොහෝ දුරට රජයේ ව්‍යාපෘති මත රඳා පැවතුනද, ඉදිරි වසර සඳහා නව රජයේ ව්‍යාපෘති ඉදිකිරීම අවසන් කිරීම සහ දැනට ක්‍රියාත්මක රජයේ ව්‍යාපෘති රැසක් තාවකාලිකව අත්හිටුවීම.
- CECB සඳහා මසකට රු. මිලියන 150ක සාමාන්‍ය පුනරාවර්තන වියදම් සපුරාලීමට සිදුවීම.
- CECBහි පවතින සම්පත් (මානව, තොරතුරු සහ තාක්ෂණික, භෞතික හා රසායනාගාර සම්පත්) උපරිමයෙන් ප්‍රයෝජනයට ගැනීම සඳහා ප්‍රධාන ව්‍යාපෘති නොමැතිවීම.

CECB විසින් මෙතෙක් ගෙන ඇති පියවර

- වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘති සඳහා සහ වෙනත් රාජ්‍ය ආයතන සඳහා කාර්ය මණ්ඩලය නිදහස් කිරීමට පියවර ගැනීම.
- පිරිවැය පාලනය කිරීම.
- විදේශීය ඉංජිනේරු උපදේශන ව්‍යාපෘති ලබා ගැනීමේ උත්සාහයක යෙදී සිටීම.
- විදේශ රැකියා සඳහා අභ්‍යන්තර කාර්ය මණ්ඩලය ප්‍රවර්ධනය කිරීම (වසර 5ක වැටුප් රහිත නිවාඩු යටතේ).

මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්) සමාගම (CESL)

මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්) සමාගම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශයේ (CECB) පූර්ණ හිමිකාරිත්වය දරණ සමාගමක් වන අතර, 1982 දෙසැම්බර් 17 වන දින සමාගම් පනත යටතේ සීමිත වගකීම් සමාගමක් ලෙස සංස්ථාගත කර 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ 2009 නොවැම්බර් මාසයේ දී නැවත ලියාපදිංචි කර ඇත.

මෙම කාලසීමාව තුළ ඉදිකිරීම් සේවා සඳහා ඇති වූ ඉහළ ඉල්ලුම නිසා ඇති වූ අවස්ථාව ප්‍රයෝජනයට ගැනීම සඳහා 2011 වර්ෂය ආරම්භයේ දී මෙම ආයතනය සක්‍රීය ලෙස මෙහෙයුම් ආරම්භ කරන ලදී. ගොඩනැඟිලි, මාර්ග, පාලම්, වාරිමාර්ග ව්‍යුහයන් සහ වෙනත් විශේෂ ව්‍යාපෘති ඉදිකිරීම මත මූලික ව්‍යාපාරය කේන්ද්‍රගත වී ඇත. සිය ව්‍යාපෘති සඳහා කොන්ක්‍රීට් හා ඇස්ෆාල්ට් නිෂ්පාදනය කිරීමෙහි ද සමාගම නිරතව සිටී.

මෙමඟින් රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ සේවාදායකයන්ට සේවා ලබාදෙයි.

2022 වසරේ ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති

- සිදු කරමින් පවතින මුළු ව්‍යාපෘති - 36

මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්) සමාගම විසින් සිදු කරමින් පවතින ප්‍රධාන ව්‍යාපෘති (රු. මිලියන 500ට වැඩි)

විස්තරය/ ව්‍යාපෘතියේ නම	මුල් කොන්ත්‍රත් මුදල (රු.මි.)	ප්‍රගතිය (%)
1. වයඹ විශ්ව විද්‍යාල නගර සංවර්ධන ව්‍යාපෘති යටතේ ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ කුලියාපිටිය පරිශ්‍රයේ යෝජිත ගොඩනැඟිලි සංකීර්ණය ඉදිකිරීම	1,712	30.94
2. මහනුවර ශික්ෂණ රෝහලේ ඇටමිදුළු බද්ධ කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීම	745	45.70
3. හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකකය (අදියර II) ඉදිකිරීම - යාපනය රෝහල	1,058	65.06
4. යාපනයේ යෝජිත නගර ශාලාව ඉදිකිරීම	1,625	67.16
5. රත්නපුර අධිකරණ සංකීර්ණය ඉදිකිරීම	2,018	59.58
6. රුහුණු විශ්ව විද්‍යාලය, කරාපිටිය, ගාල්ල, වෛද්‍ය පීඨය සඳහා වන දෙමහල් ගොඩනැගිලි සංකීර්ණය සැලසුම් කිරීම, ඉදිකිරීම, අධීක්ෂණය, නිම කිරීම සහ නඩත්තු කිරීම.	1,091	33.23
7. ගාල්ල කරාපිටිය, රුහුණු විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා කරාපිටිය ශික්ෂණ රෝහලේ මහාචාර්යවරුන්ගේ නව දස මහල් වාට්ටු සංකීර්ණය සැලසුම් කිරීම, ඉදිකිරීම, අධීක්ෂණය, නිම කිරීම සහ නඩත්තු කිරීම.	1,138	51.92
8. කොළඹ 12 ශ්‍රේෂ්ඨාධිකරණ සංකීර්ණය ප්‍රතිසංස්කරණය කිරීම	909	57.72

වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනය කොත්මලේ (KITI)

කොත්මලේ වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනය වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය යටතේ 2012 වර්ෂයේදී ස්ථාපනය කරන ලද අතර, වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අවශ්‍ය කරන ඉංජිනේරු සහකාරවරුන් සඳහා තුන් අවුරුදු වාරි තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව පවත්වනු ලබයි.

මීට අමතරව දේශීය හා ජාත්‍යන්තර මට්ටමේ නේවාසික පුහුණු පාඨමාලා පැවැත්වීම ද මෙමඟින් සිදු කරයි.

මේ වන විට වාරිමාර්ග අමාත්‍යාංශය යටතට අයත් මෙම ආයතනය තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ නියමන්ට අනුව NVQ 06 මට්ටමේ පූර්ණ කාලීන හා සේවාස්ථ පුහුණු පාඨමාලාවන් ද පවත්වමින් රටතුළ ඉහළ කීර්තිනාමයක් ගොඩනඟා ගෙන ඇත.

දැක්ම

ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව ජල කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනය හා කුසලතා සංවර්ධනය සිදුකරන ආයතන අතර ප්‍රමුඛයා වීම.

මෙහෙවර

රාජ්‍ය හා පෞද්ගලික අංශයන් සඳහා වෙනස්වන තාක්ෂණික හා සමාජීය අවශ්‍යතාවයන්ට සරිලන ලෙස තරුණ ප්‍රජාවගේ දැනුම, ආකල්ප හා කුසලතා ප්‍රවර්ධනය කිරීම.

ප්‍රධාන කාර්යයන්

i. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ නියමයන්ට අනුව නිතිපතා පුහුණු පාඨමාලා පැවැත්වීම.

ii. වාර්ෂිකව ISO 9001:2008 තත්ත්ව කළමනාකරණ පද්ධති වැඩිදියුණු කිරීම හා යාවත්කාලීන කිරීම.

iii. විවිධත්වයෙන් යුතුව රටේ පවතින අවශ්‍යතාවයන් සපිරෙන පරිදි සේවාස්ථ පුහුණු පාඨමාලා පැවැත්වීම.

iv. ඉදිරි වසර දෙක තුළ ISO 14001:2015 ට අනුව පරිසර තත්ත්ව කළමනාකරණ පද්ධති වැඩිදියුණු කිරීම.

v. සෑම වසරකම ඉදිකිරීම් හා ඉංජිනේරුමය කුසලතාවන් සංවර්ධනය වන පරිදි සේවාස්ථ පුහුණු පාඨමාලාවන් පැවැත්වීම.

vi. ඉදිරි වර්ෂ 03 තුළ ජල සම්පත් කළමනාකරණයට සමගාමී ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ වැඩමුළු, සමුළු පැවැත්වීම.

vii. පවතින අවශ්‍යතාවයන් සපුරාලීමට රාජ්‍ය හා පෞද්ගලික දෙපාර්ශවයේම සහභාගීත්වය යොදා ගැනීම.

viii. පුහුණුලාභීන් තුළ වෙළඳපොල හා සාමාජීය වශයෙන් සුදුසු විනය ගොඩනැගීම.

පුහුණු පාඨමාලා ප්‍රගතිය

2022 වර්ෂය

පවත්වන ලද වැඩසටහන් ගණන	-	21
පුහුණුලාභීන් ගණන	-	1,386

- පුහුණු පාඨමාලා පිළිබඳ විස්තර ඇමුණුම 01හි දක්වා ඇත.

2023 වර්ෂය සඳහා අපේක්ෂිත වැඩසටහන

පැවැත්වීමට අපේක්ෂිත වැඩසටහන් ගණන	-	64
අපේක්ෂිත පුහුණුලාභීන් ගණන	-	2,799

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව (ECSL)

ක්‍රියාකාරකම්

i. ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීමය තත්ත්වය පවත්වාගෙන යාම සහ මෙහෙයවීම.

ii. ඉංජිනේරු වෘත්තිකයන් එක් එක් කාණ්ඩ වල ලියාපදිංචි කිරීම.

iii. ඉංජිනේරු වෘත්තිකයන්ගේ ගුණාත්මකභාවය සහ ප්‍රමිතිය ඉහළ නැංවීමට අදාලව කටයුතු කිරීම.

ප්‍රගතිය

i. ඉංජිනේරු සභාව සඳහා වූ මානව සම්පත් ප්‍රතිපත්ති හා ක්‍රමවේද අත්පොත සකස් කර අවසන් කර ඇත.

ii. ඉංජිනේරු සභාව සඳහා පරිපාලන හා මූල්‍ය කටයුතු සඳහා අත්පොත සකස් කර අවසන් කර ඇත.

iii. ඉංජිනේරු තාක්ෂණවේදීන් ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය සමාලෝචනය කර ලියාපදිංචි විය හැකි ක්ෂේත්‍ර කිහිපයක් අලුතින් එකතු කරන ලදී.

iv. වරලත් ඉංජිනේරු, ආශ්‍රිත ඉංජිනේරු හා අනුබද්ධ ඉංජිනේරු යන කාණ්ඩවල ලියාපදිංචි කිරීමට අදාළව පවතින ගැටලු හඳුනාගැනීම හා ඒවාට විසඳුම් සෙවීම සඳහා ස්ථාවර කමිටුවක් පත්කරගන්නා ලදී.

v. සංස්ථාගත ඉංජිනේරු හා ඉංජිනේරු ඩිප්ලෝමා යන කාණ්ඩවල ලියාපදිංචි කිරීමට අදාළව පවතින ගැටලු හඳුනා ගැනීමට හා ඒවාට විසඳුම් සෙවීම සඳහා ද ස්ථාවර කමිටුවක් පත්කරගන්නා ලදී.

vi. ඉංජිනේරු වෘත්තිකයින් ලියාපදිංචි කිරීමේදී එම ක්‍රියාවලියේ ප්‍රගතිය අදාල ඉංජිනේරු වෘත්තිකයාගේ ජංගම දුරකතනය වෙත කෙටි පණිවිඩයක් (SMS) මගින් දැනුම්දීම සඳහා නියමු ව්‍යාපෘතියක් ආරම්භකර ඇත.

vii. ඉංජිනේරු තාක්ෂණ ශිල්පීන් වෙබ් අඩවිය මගින් සොයා ගැනීමට හැකි ක්‍රමවේදයක් ඉංජිනේරු සභාවේ වෙබ් අඩවියට එක්කරන ලදී.

viii. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක PED 12/2003 සහ අදාළ රජයේ ආයතන වෙත 2021 නොවැම්බර් 16 දාතමින් නිකුත්කර ඇති රාජ්‍ය ව්‍යවසායයන්ගේ ආයතනික පරිපාලනය සඳහා වූ මාර්ගෝපදේශ අත්පොත (Guidance on Corporate Governance for State Owned Enterprises handbook) අනුව ඉදිරි වර්ෂ 5 (2022-2026) සඳහා ආයතනික සැලැස්මක් (Corporate Plan) පිළියෙල කරන ලදී.

ix. ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ලියාපදිංචි වරලත් ඉංජිනේරුවන් සම්බන්ධයෙන් මහජනතාව විසින් දැනගතයුතු කරුණු ඇතුළත් දැන්වීමක් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් වෙන වෙනම සකස්කර සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පත්වල ප්‍රසිද්ධ දැන්වීම් පළකරන ලදී.

x. ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ විනය පරීක්ෂණ කාර්ය පටිපාටිය, අංක 2298/27 හා 21 සැප්තැම්බර් 2022 දින දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කරන ලදී.

xi. ත්‍රිවිධ හමුදාවල ඉංජිනේරුමය කාර්යයන්හි නියැලී සිටින නිලධාරීන්හට ඉංජිනේරු සභාවේ ලියාපදිංචි වීම සඳහා පැනනැගී තිබෙන ගැටළු සම්බන්ධයෙන් ත්‍රිවිධ හමුදාවල නියෝජිත පිරිසක් සමඟ සාකච්ඡාවක් පවත්වන ලදී.

xii. යෝජිත ගොඩනැගිලි සේවා ඉංජිනේරු හා තාක්ෂණික ආයතනය සම්බන්ධයෙන් ඉංජිනේරු සභාවේ නිරීක්ෂණ හා සැලකිලිමත් විය යුතු කරුණු ඇතුළත් ලිපියක් අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යොමු කරන ලදී.

xiii. ඉංජිනේරු සභාවේ ලියාපදිංචි වීමට පවතින ගැටලු සම්බන්ධයෙන් බ්‍රිතාන්‍ය ඉංජිනේරු ආයතනවල ශ්‍රී ලංකා ශාඛාවන්හි නියෝජිතයින්, ශ්‍රී ලංකා නාවික ඉංජිනේරු සංගමය සහ ශ්‍රී ලංකා මෝටර් රථ ඉංජිනේරුවන්ගේ සංගමය සමඟ සාකච්ඡා පවත්වන ලදී.

xiv. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන ඒජන්සිය (CIDA) හා අදාළ කටයුතු සම්බන්ධයෙන් එම ආයතනය හා සමීපව කටයුතු කරගෙන යනු ලැබේ.

xv. වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය (CECB) හා ලංකා විදුලිබල පුද්ගලික සමාගම (LECO) යන ආයතනවල කාර්මික ශිල්පීන් ලියාපදිංචි කිරීම ආරම්භ කරන ලදී.

xvi. 2022 දෙසැම්බර් 31 දින දක්වා කාණ්ඩ අනුව ලියාපදිංචි කර ඇති ගණන.

වරලත් ඉංජිනේරු	-	5,318
ආශ්‍රිත ඉංජිනේරු	-	9,901
අනුබද්ධ ඉංජිනේරු	-	101
සංස්ථාගත ඉංජිනේරු	-	474
ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්	-	1,715
ඉංජිනේරු කාර්මික	-	213
මුළු ගණන	-	17,722

දැනට කෙරෙමින් පවතින කටයුතු

i. විෂමාචාර ක්‍රියා සඳහා වන විනයානුකූල ක්‍රියාමාර්ග හා අභියාචනා මණ්ඩලය සඳහා වන නීති සම්පාදනය කර අවසන්කර ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය සහිතව ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත්කිරීම සඳහා වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යොමුකර ඇත.

ii. විදේශීය ඉංජිනේරුවරුන් ලියාපදිංචි කිරීම සඳහා වූ ක්‍රියාපටිපාටිය ආයෝජන මණ්ඩලය සමඟ එක්වී සකස්කර ඇති අතර එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ.

iii. ඉංජිනේරු වෘත්තිකයන්ගේ කාණ්ඩ 6 සඳහා වූ කාර්යයන්, වගකීම් හා නිපුණතාවන් පිළියෙල කර අවසන් කිරීම.

iv. IESL, IIESL හා TVEC ආයතනවල ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් පවතින ගැටළු නිරාකරණය කිරීම.

v. ඉංජිනේරු සභාව වගඋත්තරකරු කරමින් පවරා ඇති නඩු 9ක් (ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු 3ක් හා අභියාචනාධිකරණයේ නඩු 6ක්) සම්බන්ධයෙන් අවශ්‍යවන නීතිමය කටයුතු කරගෙන යාම.

මහවැලි උපදේශක සේවා කාර්යාංශය (MCB)

මහවැලි උපදේශක සේවා කාර්යාංශය පුද්ගලික සමාගම, වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර, රජයේ සහ පෞද්ගලික අංශයේ ව්‍යාපෘති සම්බන්ධයෙන් වසර 23ක පළපුරුද්දක් ඇත.

මෙමඟින් ශක්‍යතා අධ්‍යයනය, සවිස්තරාත්මක සැලසුම්, පාරිසරික බලපෑම් තක්සේරු කිරීම්, සමාජ ආර්ථික සමීක්ෂණ සහ උපදේශන කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් කටයුතු කිරීම මෙන්ම ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘති සඳහා නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලසුම් සකස් කරයි.

උපදේශන කටයුතු වලට අමතරව, වාරිමාර්ග අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, සෞඛ්‍ය අමාත්‍යාංශය යනාදිය යටතේ මහවැලි උපදේශන කාර්යාංශය විශාල ඉදිකිරීම් ව්‍යාපෘති සිදු කර ඇත.

2022 වසරෙහි ක්‍රියාත්මක වූ උපදේශක සේවා ව්‍යාපෘති වල ප්‍රගතිය (2022.12.31 දිනට)

- මාවනැල්ල යෝජිත යටිමහන ජලාශ ව්‍යාපෘතිය සඳහා පාරිසරික බලපෑම් තක්සේරුව - 90%
- යෝජිත ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය සඳහා පාරිසරික බලපෑම් තක්සේරුව - 75%
- අම්පාර දිස්ත්‍රික්කයේ යෝජිත ගල්ගේ කණ්ඩිය ව්‍යාපෘතියෙහි මූලික පාරිසරික ඇගයීම - 60%

2.1.2. අභියෝග

- වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති සඳහා අභියෝග රැසකට මුහුණ දීමට සිදු වූ වසරක් ලෙස 2022 වර්ෂය හැඳින්විය හැකිය. ප්‍රමාණවත් පරිදි අක්මුදල් නොලැබීම, ඉදිකිරීම් සඳහා අවැසි, ඉන්ධන සහ පුපුරණ ද්‍රව්‍ය සපයා ගැනීමෙහි ගැටළු මෙන්ම ඉදිකිරීම් ද්‍රව්‍ය වල මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ යාම හේතුවෙන් ඇස්තමේන්තුගත පිරිවැය ඉක්මවායාම ආදී ගැටළු මෙහිදී කැපී පෙනෙන අභියෝග ලෙස පෙන්වා දිය හැකිය.

- ශ්‍රී ලංකාව මුහුණ දී ඇති ආර්ථික අර්බුදය හමුවේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සහාය ලබා ගැනීම තවදුරටත් ප්‍රමාද වීම තුළ විදේශ මූල්‍ය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක ව්‍යාපෘතීන්හි ප්‍රගතිය කෙරෙහි විශාල බලපෑමක් එල්ල විය. මෑත කාලීනව ක්‍රියාත්මක විශාලතම ජල සම්පත් සංවර්ධන වැඩසටහන වන මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහනෙහි ඉතිරි වැඩ කොටස් අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වීමෙන් ඒ හරහා අපේක්ෂිත ප්‍රතිලාභ ළඟා කරගැනීම ප්‍රමාද වීමත් මෙහිදී වාරිමාර්ග අමාත්‍යාංශය මුහුණ දුන් ප්‍රබල අභියෝගයකි. එමෙන්ම මුන්දෙණි ආරු ගංඟා නිම්න සංවර්ධන ව්‍යාපෘතිය, කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය වැනි ව්‍යාපෘතීන් සඳහා විදේශ අරමුදල් සපයා ගැනීම ද මේ හේතුවෙන් තවදුරටත් ප්‍රමාද වී ඇත.

- ආර්ථික අර්බුද වාතාවරණය හමුවේ ජාතික සංවර්ධන ප්‍රමුඛතාවයන්හි සිදු වූ වෙනස්කම් හේතුවෙන් වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති සැලසුම් රැසක වෙනස්කම් සිදු කිරීමට සිදු විය. වාරි සෞභාග්‍ය වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ කුඩා වැව් අමුණු පුනරුත්ථාපන ව්‍යාපෘතියේ 2022 වර්ෂය තුළ ආරම්භකරන ලද කටයුතු නිම කිරීමෙන් පසු ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිතය. එලෙසම ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතියෙහි ශක්‍යතා අධ්‍යයනය සහ පාරිසරික බලපෑම් අගයුම් අවසන් කිරීමෙන් අනතුරුව 2023 වර්ෂයේ මුල් කාර්තුව තුළ ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමට සැලසුම් කර ඇත.

2.1.3. ඉදිරි ඉලක්ක

	වැඩසටහන / ව්‍යාපෘතිය	2023 ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි.)	2022 වර්ෂයේ සමස්ථ ප්‍රගතිය	2023 වර්ෂයේ අපේක්ෂිත සමස්ථ භෞතික ප්‍රගතිය	2023 ඉලක්ක
01.	මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP)	43,000.00	35.4%	57%	• පහත කොන්ත්‍රාත් පැකේජවල ගෙවීම් කටයුතු අවසන් කිරීම - ප්‍රධාන ඇළේ (MLBCRP-NCB 1) කි.මී 0.0 සිට කි.මී 30 +140 දක්වා පුනරුත්ථාපනය කිරීම - ප්‍රධාන ඇළේ (MLBCRP-NCB 3) කි.මී. 49+820 සිට කි.මී.63+650 දක්වා දක්වා පුනරුත්ථාපනය කිරීම. - ප්‍රධාන ඇළේ (MLBCRP-NCB 5) අරිය වාන් දොරටු නවීකරණය කිරීම. • ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ජීවනෝපාය කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම. • 2022-2023 මහ කන්නය සඳහා MOP පොහොර මෙට්‍රික් ටොන් 41,800ක් ගොවීන් වෙත බෙදා හැරීම අවසන් කිරීම. • මහවැලි කලාපයේ බී, සී, ඩී සහ ජී කලාපයන්හි කෘෂිකාර්මික ඵලදායිතා වැඩිදියුණු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
i.	මිණිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය	1,856.00	92%	100%	• MLBCR-ICB 1 - වම් ඉවුර සහ දකුණු ඉවුරු ඇළ මාර්ග සඳහා ජල පාලනය සහ මිනුම් පහසුකම් ඇතුළුව මිණිපේ අමුණ එසවීම ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම. • මෙම ව්‍යාපෘතිය යටතේ 21 කණුව අසල වේරගන්තොට - රන්දෙණිගල මාර්ගයේ (B474) බලපෑමට ලක් වූ මාර්ග දිගුව ඉහළ නැංවීම. • රන්ටැඹේ ල.වි.ම. කඳවුරේ බලපෑමට ලක්වූ පොම්පාගාරය සහ නල පද්ධතිය නැවත ස්ථානගත කිරීම • දැනට ප්‍රසම්පාදන අදියරයේ පවතින MLBCRP-NCB-6 කොන්ත්‍රාත් පැකේජය ප්‍රදානය කිරීම හා ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම.

	වැඩසටහන / ව්‍යාපෘතිය	2023 ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මී.)	2022 වර්ෂයේ සමස්ථ ප්‍රගතිය	2023 වර්ෂයේ අපේක්ෂිත සමස්ථ භෞතික ප්‍රගතිය	2023 ඉලක්ක
ii.	වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය	9,223.00	36%	70%	• NWPCP-ICB-2 නැබඩගහවත්ත සිට මහකිතුල පිවිසුම් උමඟ දක්වා ප්‍රධාන ඇළ ඉදිකිරීම් කටයුතු සිදුකිරීම (කි.මී. 5+250 සිට කි.මී.22+300) • ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති NWPCP-NCB-1 වෑමැඩිල්ල වම් ඉවුරු ඇළ නැබඩගහවත්ත දක්වා වැඩිදියුණු කිරීම (කි.මී. 0+000 සිට කි.මී. 5+250) සහ නව වාන් ඇළ ඉදිකිරීම (කි.මී.0+000 සිට කි.මී.0+600) කොන්ත්‍රාත් පැකේජයේ ගෙවීම් කටයුතු අවසන් කිරීම. • වනජීවී කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම • ඉඩම් අත්පත් කර ගැනීම් සඳහා වන්දි ගෙවීම් සිදු කිරීම සහ ජීවනෝපාය සැලැස්ම ක්‍රියාත්මක කිරීම.
iii.	උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය	27067.50	25%	71%	• UEC-ICB-2A- ඉහළ ඇළහැර ඇළෙහි කි.මී.27+509 සිට කි.මී.55+600 දක්වා උමඟ ඉදිකිරීම. • UEC-ICB/2B - ඉහළ ඇළහැර ඇළ, කළු ගඟ, මොරගහකන්ද යා කරන කි. මී. 8.8 උමඟ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම. (කි.මී 0+100 සිට 08+830 කි.මී.) • වනජීවී කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම • ඉඩම් අත්පත් කර ගැනීම් සඳහා වන්දි ගෙවීම් සිදු කිරීම සහ ජීවනෝපාය සැලැස්ම ක්‍රියාත්මක කිරීම.
02.	උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය	3,600.00	97.39%	100%	• 2022 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියේ මූලස්ථායී වැඩ නිම කිරීමට සැලසුම් කර තිබූ නමුත් දැනට රට තුල පවතින විදේශීය හා දේශීය මුදල් ලබා ගැනීමට ඇති සීමාවන්, සමහර අමුදුව්‍ය වල පවතින හිඟය, ගෝලීය කොවිඩ් 19 නිසා ඇති වූ බලපෑම හේතුවෙන් නියමිත පරිදි ව්‍යාපෘතියේ ඉදිකිරීම් අවසන් කිරීමට අපහසු වී ඇත.

	වැඩසටහන / ව්‍යාපෘතිය	2023 ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි.)	2022 වර්ෂයේ සමස්ථ ප්‍රගතිය	2023 වර්ෂයේ අපේක්ෂිත සමස්ථ භෞතික ප්‍රගතිය	2023 ඉලක්ක
					ඒ අනුව ඉදිරි වර්ෂයේ ජුනි මස අවසානය දක්වා මූලස්ථායී වැඩ සඳහා කාලය දීර්ඝ කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂා කෙරේ. ඉන්පසුව, දෝෂ නිවැරදි කිරීමේ කාලය(Defect Notification Period) ක්‍රියාත්මකවේ (අවුරුද්දක්). • ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කටයුතු අවසන් කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ජල විදුලිය නිපදවීම හා පහළ නිම්නය සඳහා ජලය මුදා හැරීම. • ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු ව්‍යාපෘතිය කොන්ත්‍රාත්කරුගෙන් පවරාගෙන අදාල ආයතන (CEB, MASL) වෙත පැවරීමට කටයුතු කිරීම. • දෝෂ නිවැරදි කිරීමේ කාලය තුළදී අඩුපාඩු අනාවරණය වුවහොත්, කොන්ත්‍රාත්කරු විසින් නිවැරදි කිරීමේ කටයුතු සිදු කිරීම. • කොන්ත්‍රාත්කරුගේ බිල්පත් ගෙවීම. • ව්‍යාපෘතිය සඳහා අත්පත් කර ගත් ඉඩම් අතරින් ඉතිරිව ඇති ඉඩම් සඳහා ඉඩම් / කෘෂිකාර්මික ඉඩම්/ වන්දි මුදල් ලබා දී එම කටයුතු අවසන් කිරීම. • ප්‍රධාන උමගේ ජල කාන්දුව නිසා පූර්ණ හා අර්ධ හානි වූ නිවාස හා වගා හානි වූ ඉඩම් අතරින් ඉතිරිව ඇති පුද්ගලයින්ට ඉඩම් / වන්දි මුදල් / පානීය ජලය ලබාදීමේ ක්‍රියාවලිය සිදු කිරීම. • ව්‍යාපෘතිය වසා දැමීම සම්බන්ධ අනෙකුත් වැඩ.
03.	මොරගහකන්ද සහ කළුගඟ ජලාශ ව්‍යාපෘතිය	2,250.00	99.37%	100%	• ඉඩම් අත්පත් කර ගැනීම හා නැවත පදිංචි කිරීමේ කටයුතු මැදිරිගිරිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයෙහි ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ගෙවීමත්, ලග්ගල, පල්ලේගම, නාඋල සහ කන්තලේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල වන්දි ගෙවීමත් සිදුකිරීම.

	වැඩසටහන / ව්‍යාපෘතිය	2023 ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි.)	2022 වර්ෂයේ සමස්ථ ප්‍රගතිය	2023 වර්ෂයේ අපේක්ෂිත සමස්ථ භෞතික ප්‍රගතිය	2023 ඉලක්ක
					• විකල්ප ඉඩම් - වැල්ලෙවෙල හා ගුරුවෙල කොට්ඨාශවල ගොඩ ඉඩම් 212ක් සහ වාරි ඉඩම් 122ක් ලෙස විකල්ප ඉඩම් හාරදීමට ඇත. <u>පහළ නිම්න සංවර්ධනය</u> - අලිවැට ඉදි කිරීම (ගුරුවෙල, රණමුරේ) - තොරතුරු මධ්‍යස්ථානයේ ඉතිරි ඉදිකිරීම් කටයුතු - බෙදුම් ඇළ සහ කෙත් ඇළ ඉදිකරීම (මැදිරිගිරිය)
04.	දේශගුණික බලපෑම් අවම කිරීමේ බහුඅදියර වැඩසටහන (CResMPA)	2,025.00	4.6%	57%	• කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ජල කාලගුණ විද්‍යා පද්ධතිය සැලසුම් කිරීම, තාක්ෂණික පිරිවිතර සකස් කිරීම, පිරිවැය සහ ටෙන්ඩර් ලේඛන සැකසීම සඳහා උපදේශක සමාගමක් බඳවා ගැනීම සඳහා කොන්ත්‍රාත් සහ යෝජනා කැඳවීමේ ලේඛණ පිළියෙළ කිරීම. • කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවහි ජල කාලගුණ විද්‍යා පද්ධතිය සැපයුම, ස්ථාපනය, ක්‍රියාත්මක කිරීම සහ ධාරිතාව සංවර්ධනය කිරීම සඳහා උපදේශකයෙකු බඳවා ගැනීම • වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙහි කාලගුණ, ගංවතුර සහ නායයාම් සම්බන්ධ මෙහෙයුම් මැදිරි ප්‍රතිසංස්කරණය කිරීම සහ ඵලදායී බලපෑම් මත පදනම් වූ බහු උපද්‍රව පුරෝකථනය කිරීම සහ පූර්ව අනතුරු ඇඟවීම සඳහා උපකරණ මිලදීගැනීම සහ උපකරණ සැපයීම • අඹතලේ ලවණතා බාධකය ඉදිකිරීම සඳහා සවිස්තරාත්මක සැලසුම් සහ පාරිසරික බලපෑම් තක්සේරුව පිළියෙළ කිරීම සහ ලවණතා බාධක ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කිරීම

	වැඩසටහන / ව්‍යාපෘතිය	2023 ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි.)	2022 වර්ෂයේ සමස්ථ ප්‍රගතිය	2023 වර්ෂයේ අපේක්ෂිත සමස්ථ භෞතික ප්‍රගතිය	2023 ඉලක්ක
					• වී ඔය ඉදිකිරීම සඳහා සවිස්තරාත්මක සැලසුම් අවසන් කිරීම, සම්පූර්ණ සමාජ බලපෑම් සමීක්ෂණය, පෙව විවිධත්ව සමීක්ෂණය සහ වී ඔය ජලාශය සඳහා නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සහ පාරිසරික බලපෑම් ඇගයීම සකස් කිරීම ආරම්භ කිරීම. • පවතින ආර්ථික අර්බුදයෙන් පීඩාවට පත් වූ අවදානම් සහිත ප්‍රජාවන් සඳහා සෘජු ප්‍රතිලාභ සහ කෙටි කාලීන රැකියා උත්පාදනය සහතික කිරීම සඳහා ප්‍රධාන, මධ්‍යම සහ සුළු වාරිමාර්ග යෝජනා ක්‍රමවල හදිසි සහ තීරණාත්මක පුනරුත්ථාපන කටයුතු ක්‍රියාත්මක කිරීම
05.	ඒකාබද්ධ ජල කළමනාකරණ ප්‍රවේශයක් තුළින් ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ කුඩා ඉඩම් හිමි ගොවීන්ගේ දේශගුණික විපර්යාසවලට මුහුණදීමේ ශක්තිය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (වැවිගම් පුබුදුව - CRIWMP)	2,930.00	58%	85%	• නව ග්‍රාමීය වාරි පද්ධති 25 ක සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කිරීම • ග්‍රාමීය වාරි පද්ධති 113 ක උඩුගං සංවර්ධනය • ග්‍රාමීය වාරි පද්ධති 183 ක යටිගං සංවර්ධනය • ගොවිජන සේවා මධ්‍යස්ථාන 48ක් දේශීය දැනුම් මධ්‍යස්ථාන ලෙස ශක්තිමත් කිරීම (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපකරණ ලබා දීමෙන්) • දේශගුණික සුහුරු කෘෂිකර්ම වැඩසටහන ක්‍රියාත්මක කිරීම ආහාර සුරක්ෂිතතා ගෙවතු 100ක්; වාණිජ පරිමාණ දේශගුණික සුහුරු ගොවිතැන් ඒකක 650ක්; ගෙවතු 350ක පාරිසරික සහතිකකරණය; වැව් 35ක ජල කළමනාකරණ නිරූපණ මොඩල; වැව් 35ක මත්ස්‍ය වගාව; එළුවන් ඇතිකිරීමේ ඒකක - 70; උතුරු මැද පළාතෙහි කුකුළු අභිජනනාගාරය; වාණිජ එළවළු නිෂ්පාදන ඒකක 50; කෘෂිකර්ම නිලධාරීන් 200ක ධාරිතා සංවර්ධනය; බීජ බැංකු 7ක් ස්ථාපනය • ආහාර සුරක්ෂිතතාවය නහා සිටුවීම සඳහා වූ විශේෂ කඩිනම් කෘෂිකර්ම වැඩසටහන (දිස්ත්‍රික්ක 07 ක) ක්‍රියාත්මක කිරීම.

	වැඩසටහන / ව්‍යාපෘතිය	2023 ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මී.)	2022 වර්ෂයේ සමස්ථ ප්‍රගතිය	2023 වර්ෂයේ අපේක්ෂිත සමස්ථ භෞතික ප්‍රගතිය	2023 ඉලක්ක
					• නල එලීමේ ව්‍යාපෘති 12ක් සම්පූර්ණ කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට සහය වීම. • ප්‍රජා ජල සම්පාදනය සඳහා ජල පෙරහන් ඒකක 12ක් ස්ථාපනය • ග්‍රාමීය පාසල් සහ රෝහල් ආශ්‍රිතව කුඩා පරිමාණ ජල පෙරහන් ඒකක 29ක් ස්ථාපනය • දැනට ලබා දී ඇති වැසි ජලය එක් රැස් කිරීමේ ඒකක 973ක් වහල මත සවි කිරීම • දැනට කෘෂි කාලගුණික උපකරණ සවි කර ඇති ස්ථාන වල දත්ත රැස් කිරීම සහ ජල කළමනාකරණ උපදේශන බෙදා හැරීම • දැනට සංවර්ධන කටයුතු නිමා කරන ලද වැව් වල වැව් ජල මාපක 140ක් ජල ප්‍රවාහ මිනුම් ඒකක 440ක් සහ මේ සඳහා ශ්‍රේණිගත කිරීම් වක්‍ර 515ක් ස්ථාපනය • ආපදා ප්‍රතිචාර සහ පෙර සූදානම යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
06.	තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය	500.00	14%	100%	• පෙර සවි පාලම සවි කිරීම ඇතුළු මාර්ගයේ ඉතිරි කි.මී. 07ක ඉදිකිරීම. • ව්‍යාපෘතිය තාවකාලිකව නැවැත්වීම.
07.	පහළ මල්වතු ඔය බහුකාර්ය ජලාශ ව්‍යාපෘතිය	550.00	4.28%	6.68%	• වේල්ල ඉදිකිරීම • නැවත පදිංචි කිරීමේ ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය • අලිවැට ඉදිකිරීම. • ඉඩම් අත්පත් කරගැනීම සහ වන්දි ගෙවීම් කටයුතු • තන්තිරිමලේ නව නගරය සැලසුම් කිරීම අවසන් කිරීම සහ ඒ අනුව යටිතල පහසුකම් සංවර්ධනය

	වැඩසටහන / ව්‍යාපෘතිය	2023 ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි.)	2022 වර්ෂයේ සමස්ථ ප්‍රගතිය	2023 වර්ෂයේ අපේක්ෂිත සමස්ථ භෞතික ප්‍රගතිය	2023 ඉලක්ක
08.	ගිං - නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය - අදියර 1 (පූර්ණ ශක්‍යතා අධ්‍යයනය හා පරිසර බලපෑම් ඇගයීම)	250.00	65%	100%	• පාරිසරික බලපෑම් ඇගයීම් අධ්‍යයනය සම්පූර්ණ කිරීම සහ 2022 වසරේදී ඉතිරි වූ වැඩ කොටස් අවසන් කිරීම.
09.	මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධනය	650.00	2.41%	3.57%	• මාදුරුඔය දකුණු ඉවුර ප්‍රධාන ඇළේ කි.මී. 2.2ක ඉදිකිරීම් නිම කිරීම. • කීනානි සහ මීමින්නාගොල්ල වැව් සඳහා වූ ඇතුළුමං හා පිටමං ව්‍යුහ ඉදි කිරීම් කටයුතු නිම කිරීම. • කීනානි වැවෙහි පිටවාන් ව්‍යුහය ඉදි කිරීම. • කීනානි වැවෙහි වේල්ලෙහි ඉදි කිරීම් ආරම්භ කිරීම. • ව්‍යාපෘති ප්‍රදේශයට ඇතුළුවන මාර්ගයේ කි.මී. 1.9ක කාපට් කිරීම.
10.	කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතිය	100.00	2.7%	7%	• වේල්ල සැලසුම් කිරීම • වේල්ලේ වාන නිර්මාණය • සොරොව්ව සැලසුම් කිරීම • වැලිඇළ අමුණ සිට කිරිඉබ්බන්වැව දක්වා ඇති පෝෂක ඇළෙහි ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම
11.	ඒකාබද්ධ ජලාධාර හා ජලසම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)	3,000.00	0.5%	12.85%	පහත සඳහන් පරිදි වැඩ, භාණ්ඩ සහ උපදේශන ආශ්‍රිත ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් ක්‍රියාකාරකම්: ➢ උතුරු පළාත් සභාව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව - කොන්ත්‍රාත් පැකේජ 5ක් ➢ නැගෙනහිර පළාත් සභාව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව - කොන්ත්‍රාත් පැකේජ 8ක් ➢ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය - කොන්ත්‍රාත් පැකේජ 1ක්

	වැඩසටහන / ව්‍යාපෘතිය	2023 ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි.)	2022 වර්ෂයේ සමස්ථ ප්‍රගතිය	2023 වර්ෂයේ අපේක්ෂිත සමස්ථ භෞතික ප්‍රගතිය	2023 ඉලක්ක
					➢ වාරිමාර්ග දෙපාර්තමේන්තුව - කොන්ත්‍රාත් පැකේජ 8ක් ➢ ඇළ මාර්ග සහ වේලි ප්‍රතිසංස්කරණ උපදේශන සේවා - පැකේජ 17 ➢ උපදේශන නොවන සේවා- පැකේජ 02 ➢ භාණ්ඩ - පැකේජ 5
12.	නාච්චාදුව මහා වාරිමාර්ග ව්‍යාපාරයේ ගොවිපල ඉඩම් ප්‍රතිසංවර්ධනය කිරීමේ අධ්‍යයනය සඳහා වූ නියමු ව්‍යාපෘතිය	50.00	40%	66%	• ඇළ මාර්ග වල කොන්ක්‍රීට් ඇතිරීම, ට්‍රැක්ටර් පැන්නුම්, ජල හැරවුම් නිර්මිත හා ඊට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය • මෙහෙයුම්, නඩත්තු හා ආයතනික සංවර්ධන කටයුතු • ඉඩම්, ජලය හා අස්වනු කාර්යක්ෂමතාවය ඉහළ දැමීමට අදාළ කටයුතු හා පසුවිපරම් ක්‍රියාවලිය
13.	බැරක්ප්ලේන් වැව සංවර්ධන ව්‍යාපෘතිය	30.00	26%	100%	• අධික මුල් සහිත ජලජ වල් පැලෑටි උදුරා දැමීම සහ ඉවත් කිරීම • පෝෂක ඇළෙහි රොන්මඩ ඉවත් කිරීම • පෝෂක (සැපයුම්) ඇළෙහි ප්‍රතිසංස්කරණ කටුයුතු කිරීම • ජලාපවහන ඇතුල්වීම් ඉදිකිරීම. • **2023 වසර තුළ ව්‍යාපෘතිය නිමවේ**
14.	පැලවත්ත ලංකා සීනි සමාගමේ පර්යන්ත ප්‍රදේශ ජනාවාස භූමියෙහි වාරි සංවර්ධන සැලැස්ම	30.00	80%	100%	• තුන්මුල්ල වැව සහ මීපල වැව ඉදිකිරීම

- උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ කටයුතු 2023 වර්ෂය තුළ නිමකර මෙගාවොට 120 විදුලි ජනනයක් ජාතික විදුලිබල පද්ධතියට එක් කිරීම ඇතුලු ව්‍යාපෘතියේ ප්‍රතිලාභ ළඟා කර දීම වාරිමාර්ග අමාත්‍යාංශයේ ප්‍රධානම ඉලක්කය වේ.

- මහාපරිමාණ ව්‍යාපෘතීන් නැවත-ක්‍රමෝපායනය කිරීමේ හා වේගවත් කිරීමේ බලතල සහිත කමිටුවෙහි නිර්දේශ අනුව පහළ මල්වතුඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා හරිත දේශගුණ අරමුදල (GCF) මගින් මූල්‍ය ප්‍රදානයන් ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ පරිසර අමාත්‍යාංශය හා සම්බන්ධව සිදු කිරීම ද වාරිමාර්ග අමාත්‍යාංශයේ ඉදිරි ඉලක්කයක් වේ.

- මෙරට ප්‍රධාන වේලි වල ආරක්ෂාව තහවුරු කිරීම සහ එම කටයුතු විධිමත්ව නියාමනය කිරීමට අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කිරීමේ අරමුණින් 2022 වර්ෂයේ ලබා දෙන ලද අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වේලි ආරක්ෂණ නියාමන ඒකකයක් වාරිමාර්ග අමාත්‍යාංශය තුළ ස්ථාපනය කිරීමට සැලසුම් කර ඇත.

- නව ගංවතුර අවදානම් කළමනාකරණය කිරීමේ පනතක් ස්ථාපනය කිරීම සහ වාරිමාර්ග ආඥාපනතට අවශ්‍ය සංශෝධන සිදු කිරීම සඳහා අවශ්‍ය කටයුතු නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සමග 2023 වර්ෂය තුළ සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

- රජයේ ඉඩම් ආඥා පනත යටතේ වාරිමාර්ග රක්ෂිත සීමාවලට අදාළ නියෝග ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය කටයුතු 2023 වර්ෂය තුළ ඉඩම් අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණයෙන් සිදු කිරීමට අපේක්ෂිතය.

.....

අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රමසම්පාදන)

සැලසුම් හා මෙහෙයුම් අංශය

ජී.එච්. මාලනී පියදාස
අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රමසම්පාදන)
වාරිමාර්ග අමාත්‍යාංශය
අංක 11, ජාවත්ත අතුරුස්ස පාර,
කොළඹ 05.

.....

ලේකම්

වාරිමාර්ග අමාත්‍යාංශය

ඒ.ඩී.සී. ජයලාල්
ලේකම්
වාරිමාර්ග අමාත්‍යාංශය
අංක 50[illegible] මාවත,

03. පරිච්ඡේදය - 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ - එල්

2022.12.31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය (2022)		ඡේදය	තත්‍ය (2022)	2021	
-	**ආදායම් ලැබීම්**		59,974,294	-	
	ආදායම් බදු	**1**	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	59,974,294	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		**59,974,294**	-	
-	**ආදායම් නොවන ලැබීම්**				
-	භාණ්ඩාගාර අග්‍රිම		10,127,303,770	12,257,331,000	ඒසීඒ-3
-	තැන්පතු		1,558,852,762	34,385,133	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		20,429,028	15,535,771	ඒසීඒ-5/5(අ)
-	වෙනත් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**11,706,585,560**	**12,307,251,904**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**11,766,599,854**	**12,307,251,904**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	276,616,354	
8,938,922	**ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ) - (ඈ)**		**11,766,599,854**	**12,030,635,549**	
2,756,474	**අඩුකළා : වියදම්**				
-	**පුනරාවර්තන වියදම්**		-		
	වැටුප්, වේතන සහ අනෙකුත්				
337,740,612	සේවක ප්‍රතිලාභ	**5**	331,526,098	243,448,427	
132,798,388	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	121,820,765	79,624,757	ඒසීඒ-2(ii)
3,190,060,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	3,126,882,322	33,909,228	
-	පොළී ගෙවීම්	**8**			
401,000	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	168,845	253,267	
3,661,000,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**3,580,398,029**	**357,235,679**	
	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය				
59,345,000	හා වැඩිදියුණු කිරීම්	**10**	31,859,761	16,958,410	
17,100,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	13,683,012	22,912,888	
21,725,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	15,980,144,344	1,242,090,000	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
9,555,000	හැකියා වර්ධනය	**14**	7,693,769	6,504,544	
38,198,000,000	වෙනත් මූලධන වියදම්	**15**	29,783,719,167	29,792,674,096	
60,009,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**45,817,100,054**	**31,081,139,938**	
	තැන්පතු ගෙවීම්		1,559,445,276	20,584,268	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		24,421,672	13,803,302	ඒසීඒ-5/5(අ)
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		1,583,866,948	34,387,570	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**50,981,365,031**	**31,472,763,189**	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ=(ඉ-එ)		**(39,214,805,177)**	**(19,442,127,639)**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**(39,214,805,178)**	**(19,442,127,637)**	
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය				

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2021.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ඒසීඒ - පී

	සටහන	කණ්ඩායම 2,022 රු.	2,021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	20,669,473,891	18,223,625,532
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	42,497,667	38,505,023
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		20,711,971,558	18,262,130,555
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		18,144,393	14,369,242
දේපළ පිරියත හා උපකරණ සංචිතය		20,669,473,891	18,223,625,532
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ප්‍රංගම වගකීම්			
හැන්පතු ගිණුම්	ඒසීඒ-4	24,353,274	24,135,781
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		20,711,971,558	18,262,130,555

පිටු අංක.....සිට ..... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ..... සිට ..... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යාකාරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2023/02/28

ඩබ්.ඩී.ඩී. ජයලාල්
ලේකම්
රාජාරග අමාත්‍යාංශය
ඉල. 73, ඩී.ඒ. ජයා මාවත,
කොළඹ 10

.....
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 2023.02.28

පී. ඒ. ඩී. එම්. ඩී. පොන්වීර
ප්‍රධාන ගණකාධිකාරි
වාරිමාර්ග අමාත්‍යාංශය
අංක 11, ජාවත්ත පාර,
කොළඹ 05.

3

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ - සී

2022.12.31 දිනෙන් අවසන් කල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	2022 (රු.)	තත්‍ය 2021 (රු.)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්		
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර		
ලාභ		
ආදායම් නොවන ලැබීම්		
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	121,019,478	53,189,037
අග්‍රිම ලැබීම්	10,127,303,770	12,257,331,000
අත්තිකාරම් අයකර ගැනීම්	29,367,950	12,378,464
තැන්පතු ලැබීම්	1,546,761,535	34,385,133
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**11,824,452,734**	**12,357,283,633**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	383,414,462	319,548,812
සහනාධාර සහ මාරුකිරීම්	32,890,405	30,414,228
වෙනත් ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම	79,781,217	5,889,786
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	276,616,354
අත්තිකාරම් ගෙවීම්	27,178,145	13,803,302
තැන්පතු ගෙවීම්	1,559,127,446	20,584,268
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**2,082,391,675**	**666,856,750**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**9,742,061,059**	**11,690,426,884**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භූමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
අත්තිකාරම් අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	9,742,061,059	11,690,426,884
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**-**	11,690,426,884
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(9,742,061,059)**	**(11,690,426,884)**
	2021 (රු.)	
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්	-	-
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්	-	-
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල් වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) - (ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

<u>වාර්තාකිරීමේ පදනම</u>

1. වාර්තාකරණ කාලපරිච්ඡේදය

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2. මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3. ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6. මුදල් හා මුදල් සමාන දෑ

2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව එම තොරතුරු මූල්‍ය ප්‍රකාශවල අදාළ පරිදි ඇතුළත් කර ගත හැක. එසේම ‘‘වාර්තාකරණ පදනම’’ යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2003.08.00	ජල විදුලිය විකිණීම	1,250,000.00	1,350,000.00	59,974.29	4.44%
1002.01.01	නිවාස කුලී	-	-	86,268.58	-
2002.01.01	ණය පොලී	-	-	1,055.67	-
2002.02.0.99	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	-	-	2,117.35	-
2003.0.99.00	රජයේ ආදායම	-	-	20,234.18	-
2004.01.00	වැ.අ.ද.	-	-	14,236.52	-

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	3,661,000.00	3,661,000.00	3,580,398.02	97%
ප්‍රාග්ධන	60,009,000.00	60,009,000.00	45,817,100.05	76%

3.7. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණු	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
	130	නව සංවර්ධන නිලධාරීන්ගේ වැටුප් ගෙවීම සඳහා	129,766.44		129,766.44	
	118	ආසියානු සංවර්ධන බැංකුවේ ණය ආධාර යටතේ 2022/23 මහ කන්නය සඳහා ආනයනය කරනු ලබන මියුරේට් ඔෆ් පොටෑෂ් මෙ.ටො 42,000 ක් සඳහා ලංකා බැංකුව මගින් නිකුත් කරන ලද ණයවර ලිපි සඳහා වැය කල බැංකු ගාස්තු වාරිමාර්ග අමාත්‍යාංශය වෙත ගෙවීම	15,388.85		15,388.85	
	253	විශ්‍රාම යන නිලධාරීන්ගේ ණය ශේෂ පියවීම	722.57	0	722.57	

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. 000

වත්කම් කේතය	කේත විස්තරය	**2022.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**2022.12.31** දිනය මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	60,322.95	60,322.95		
9152	යන්ත්‍රෝපකරණ	407,940.04	407,940.04		
9153	ඉඩම්	19,076,592.79	19,076,592.79		
9154	අස්පෘශ්‍ය වත්කම්	189.00	311.44		
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණකාධිපතිවරයාගේ වාර්තාව ඇමුණුම IV ලෙස අමුණා ඇත.

04. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	100% - 90%	75% - 89%	50% - 74%	05% - 49%
මොරගහකන්ද සිට හුරුලුවැව, මාන්නක්කට්ටිය, ඒරුවැව සහ මහකනදරාව දක්වා උතුරු මැද පළාත් ඇළ (ඉහල ඇළහැර ඇළ) නිම කිරීම				✓
වයඹ පළාත් ඇළ ව්‍යාපෘතිය නිම කිරීම				✓
මිනිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය නිම කිරීම	✓			
උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය නිම කිරීම	✓			
වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සහ ජල ඵලදායීතාව ඉහල නැංවීමේ ව්‍යාපෘතිය නිම කිරීම**		✓		
භූගත ජල විමංසන ජාලයක් ස්ථාපනය කිරීමේ නියමු ව්‍යාපෘතිය නිමකිරීම	✓			
ඒකාබද්ධ ජල කළමනාකරණ ප්‍රවේශයක් තුළින් ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ කුඩා ඉඩම් හිමි ගොවීන්ගේ දේශගුණික විපර්යාසවලට මුහුණදීමේ ශක්තිය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (වැව්ගම් පුබුදුව - CRIWMP)			✓	
තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය නිම කිරීම				✓
පහළ මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතිය නිම කිරීම				✓
ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය නිම කිරීම				✓

** 2022 වර්ෂය අවසානයේ ව්‍යාපෘතිය නිමකර ඇත.

05. පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය (%)		
			0 - 49	50 - 74	75 - 100
අරමුණු: මතුපිට ජලය හා භූගත ජලය සංවර්ධනය සංරක්ෂණය සහ කළමනාකරණය	**ඉලක්ක 01:** වසර 2030වන විට කෘෂිකාර්මික ඉඩම් සඳහා ජල භාවිතයේ කාර්යක්ෂමතාවය 47% සිට 52% දක්වා වැඩිකිරීම	**දර්ශක 01:** වාරිමාර්ග පද්ධති වල කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම, නව තාක්ෂණය භාවිතයෙන් කෘෂිකාර්මාන්ත සඳහා භාවිතා වන ජල පරිභෝජනය අවම කිරීම	✓		
	ඉලක්ක 02: වසර 2030වන විට ප්‍රධාන මධ්‍යම ප්‍රමාණයේ ජලාශ වල ධාරිතාවය ඝන මීටර් මිලියන 6,645 සිට ඝන මීටර් මිලියන7,245 දක්වා වැඩි කිරීම	**දර්ශක 02:** ඵලදායී භාවිතයකින් තොරව ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා යන ජල ප්‍රමාණය අඩු කිරීම		✓	
	ඉලක්ක 03: වසර 2030වන විට ප්‍රධාන හා මධ්‍යම ජලාශ යටතේ වගා කරන භූමියේ වගා තීව්‍රතාවය දැනට පවතින 1.6 සිට 1.65 දක්වා වැඩි කිරීම	**දර්ශක 03:** ජල සම්පත් සංවර්ධනය, සංරක්ෂණය සහ වගා පාලනය සඳහා ඒකාබද්ධ ජල කළමනාකරණ ප්‍රවේශය මඟින් ජනතාව බල ගැන්වීම		✓	
	ඉලක්ක 04: වසර 2030වන විට ගංවතුර මඟින් බෝග හානිය 50% කින් අඩු කිරීම	**දර්ශක 04:** ජලාධාර කළමනාකරණය සහ ජලයේ ගුණාත්මක භාවය වැඩි කිරීම සඳහා ආයතනික ව්‍යුහයන් ස්ථාපිත කිරීම	✓		
	ඉලක්ක 05: ශ්‍රී ලංකාවේ පානීය, කෘෂිකර්මික, කාර්මික හා වෙනත් කාර්යයන් සඳහා ව්‍යතිරේකයක් ලෙස භූගත ජලයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක පැවැත්ම තහවුරු කිරීම.	**දර්ශක05:** ජල සම්පත් වඩාත් හොඳින් කළමනාකරණය මඟින් වාරි, පානීය හා ගෘහස්ථ ජල ඉල්ලුමට ව්‍යතිරේකයක් සැපයීම	✓		

	ඉලක්ක 06: පුර්ණ ජල සම්පත් කළමනාකරණයක් උදෙසා භූගත ජල කළමනාකරණ යාන්ත්‍රණයක් සකස් කිරීම	**දර්ශක 06:** ශ්‍රී ලංකාව තුළ ජල සංචිත වැඩි දියුණු කිරීම, ගණනය, සංරක්ෂණය, භාවිතා කිරීම සහ සංවර්ධනය.	✓		
	ඉලක්ක 07: ගොවි ප්‍රජාව සංවිධානය හා සම්බන්ධීකරණය මඟින් ඒකක ජල ප්‍රමාණයකින් කරනු ලබන කෘෂි කාර්මික නිෂ්පාදන වල ඵලදායිතාවය වැඩි දියුණු කිරීම	**දර්ශක 07:** වර්ෂා ජලය භාවිතයෙන් බිම් සකස් කිරීම හා වාරි ජලය භාවිතය අවම කිරීම මඟින් යල කන්නයට අක්කරයකට අඩි 4.4 හා මහ කන්නයට අක්කරයකට අඩි 3.9 දක්වා වාරි ජල භාවිතය අඩු කර ගැනීම.	✓		

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

- ඉදිරි වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතීන් සැලසුම්කරණයේදී ජල ඵලදායීතාව ඉහළ නැංවීමේ තාක්ෂණික ක්‍රම සැලකිල්ලට ගනු ඇත.

- වාරිමාර්ග පද්ධති හා ගංගාවන්හි රක්ෂිත විධිමත් පරිදි නිර්ණය කොට ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීමේ වැඩපිළිවෙලක් වාරිමාර්ග අමාත්‍යාංශය මඟින් ආරම්භ කර ඇත.

- වත්මන් ආර්ථික අර්බුදය හමුවේ විදේශාධාර මත ක්‍රියාත්මක ව්‍යාපෘතීන් ආරම්භ කිරීමට ප්‍රමාද වීමත්, නියමිත පරිදි අක්මුදල් නොලැබීමත් යන හේතූන් මත 2022 වසර තුළ සැලසුම්ගත ඉලක්ක වෙත ලඟා වීම දුෂ්කර විය.

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු/ (අතිරික්ත) **
ජ්‍යෙෂ්ඨ	42	25	17
තෘතීයික	05	02	03
ද්විතීයික	86	110	25
ප්‍රාථමික	47	28	19

6.2. ** ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය බෙහෙවින් බලපාන අතර, මානව සම්පත් හිඟය ආයතනයේ කටයුතු විධිමත්ව හා ඵලදායීව සිදු කිරීම සඳහා ගැටළුවක්ව පවතී.

6.3. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම්/ ලබාගත් දැනුම *
			දේශීය	විදේශීය		
කාර්යාල ලිපි ලිවීම හා රාජකාරි ලිපි ලිවීම	05	දින 01	25000		දේශීය	හොඳයි
රැකියා අවශ්‍යතා සඳහා ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව (CEEP) – ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (පළමු කණ්ඩායම)	05	වසර 01	375000		දේශීය	ඵලදායීවේ
ප්‍රධාන අභ්‍යන්තර විගණකරුවන්/ අභ්‍යන්තර විගණකරුවන් සඳහා වන පුහුණු වැඩමුළුව	01	දින 01	-		දේශීය	ආයතනයේ අභ්‍යන්තර විගණන කටයුතු කාර්යක්ෂම කිරීමට උපකාරී විය

*ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න

එමගින් ආයතනයේ ඵලදායීතාව වැඩි දියුණු කර ගත හැක.

07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අනුකූල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අනුකූල නොවේ		
1.6	වෙනත්	අනුකූල නොවේ		
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/ 2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.9	භාණ්ඩ පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල නොවේ	ව්‍යාපෘති හා අනෙකුත් ආයතනවලින් තොරතුරු ගෙන්වා පරීක්ෂා කර පිළිතුරු ඉදිරිපත් කිරීමට යම් කාලයක් ගත වේ.	

6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	නිකුත් කළ විගණන වාර්තා වලින් 75%කට පමණ මාසයක කාලයක් තුළ පිළිතුරු සපයා නොමැත.	පිළිතුරු ගෙන්වා ගැනීමට - සිහි කැඳවීම් ලිපි යැවීම - විගණන හා කළ. කමිටු මගින් දැනුවත් කිරීම
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උපවගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණක වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ	-	-
8	**වත්කම් කළමනාකරණ කමිටු**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ	-	-
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්	අනුකූල වේ	-	-

	කර තිබීම			
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ	-	-
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ	-	-
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ	-	-
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙනයාම	අනුකූල වේ	-	-
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	QR ක්‍රමය හේතුවෙන් ඉන්ධන පරීක්ෂාව සඳහා ප්‍රමාණවත් ඉන්ධන ලබා ගැනීමට නොහැකි වීම.	-
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ	-	-
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-

11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ	-	-
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල වේ	-	-
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ	-	-
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම		වර්ෂයකට වැඩි කාලයක් සිට පැවත එන ඇතැම් ණය ශේෂ මේ වන විට අය කර ගනිමින් පවතින අතර ඉතිරි ණය ශේෂ ද අය කර ගැනීමට කටයුතු කරමින් පවතී.	-
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ	-	-
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-

14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ	-	-
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ	-	-
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල නොවේ	-	-
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ	-	-
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ	-	-
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-

17.2	ආයතනය පිළිබඳව තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ	-	-
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍ය මණ්ඩලය නැවත ප්‍රතිස්ථාපනය වීම හේතු කොට ගෙන විෂය පථය වෙනස් වීම මෙන්ම මහ ජනතාව වෙත ඉටුකළ යුතු කාර්යයන් වෙනසකට භාජනය වුණි.	එකී කාර්යයන් වඩාත් පහසු කර ලීමට දැනටමත් විද්වත් මණ්ඩලයකින් යුතු කමිටුවක් පත් කොට ඇති අතර ඉන් අනතුරුව පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි සම්පාදනය කරන බව කාරුණිකව සටහන් කරමි
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම			
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		

19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

2022

Work Done – In-Service Programme

Course No	Course Description	Duration	Beneficiaries	Allocation (Rs.Mn)
1	Annual Survey Camp – BCAS Campus	7 days	59 Nos	894,917.50
2	Capacity Development Programme - IMD	2 days	34 Nos	271,818.75
3	Annual Survey Camp - University of Moratuwa (1&2)	5 days	84 Nos	1,212,654.00
4	Training Programme on "Training of Trainers on Training Methodology" – Group 03 (Phase 2)	5 days	29 Nos	195,000.00
				390,000.00
				195,000.00
5	Survey Camp for Higher National Diploma in Civil Engineering Students	7 days	87 Nos	1,113,840.00
6	World Water Day programme KTTI	1 days	150 Nos	104,672.86
7	Training Programme on "Training of Trainers on Training Methodology"- Group 2 (2nd Phase)	2 days	20 Nos	KITI
8	Productivity Improvement & Capacity Development Training Programme for Climate Resilient Integrated Water Management Project (CRIWM)	3 days	53 Nos	368,267.25
9	Institute of Technology - University of Moratuwa Survey Camp Group 1	5 days	118 Nos	574,975.00
10	Survey Camp for Higher National Diploma in Civil Engineering Students	7 days	106 Nos	1,159,925.00
11	Survey Camp for SEI campus - Nugegoda	3 days	53 Nos	483,800.00
12	Workshop on Technical writing	2 days	37 Nos	60,000.00
13	COAST Conservation	3 days	105 Nos	553,900.00
14	World Water Day programme - MASL	1 days	40 Nos	43,000.00
15	Leadership and Personality Building	2 days	25 Nos	95,000.00
16	Celebrating Family Programme	2 days	102 Nos	590,000.00
	Impact Leaders	2 days	25 Nos	150,300.00
17	Workshop on Technical Writing (Group 2)	3 days	23 Nos	60,000.00
18	Quality Assurance in Civil Engineering Constructions Department of Agriculture	4 days	34 Nos	383,650.00
19	VCDC Training Programme	2 days	39 Nos	214,980.00
20	Celebrating Family Programme	3 days	123 Nos	737,700.00
21	GIS	5 days	40 Nos	566,865.00
22	Institute of Technology - University of Moratuwa Survey Camp Group 1	4 days	111 Nos	805,500.00
TOTAL				**11,225,765.36**

වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති

நீர்ப்பாசன அமைச்சின் ஊடாக நடைமுறைப்படுத்தப்படும் கருத்திட்டங்கள்

Projects Implemented under the Ministry of Irrigation

1. මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන/ மகாவலி நீர் பாதுகாப்பு முதலீட்டு நிகழ்ச்சித் திட்டம்/ Mahaweli Water Security Investment Program (MIWSIP)





වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය/ வட மேல் மாகாண கால்வாய் கருத்திட்டம்/ North Western Province Canal Project (NWPCP)





උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය/ வட மத்திய மாகாண கால்வாய்/ North Central Province Canal Project (NCPCP)







මිණිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය / மினிபே இடக் கரை கால்வாய் மறு சீரமைப்பு / Minipe Left Bank Canal Rehabilitation Project (MLBCRP)

2. උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය/ உமா ஓய பல் நோக்கு அபிவிருத்தி கருத்திட்டம்/ Uma Oya Multipurpose Development Project



පුහුල්පොල වේල්ල/ புஹுல்பொல அணைக்கட்டு/ Puhulpola Dam



ඩයරබා ජලාශය/ டயரபா அணைக்கட்டு/ Dyaraba Dam



ඉහළ පීඩන උමග/ மேல் அழுத்த சுரங்கப்பாதை/ Upper Pressure Tunnel (UPT)



සම්බන්ධිත උමඟ - පිවිසුම/ இணைப்பு சுரங்கப்பாதை /Link Tunnel Intake



පෙරඇර උමඟ - පිවිසුම / பெற அரா சுரங்கப்பாதை / Headrace Tunnel (HRT) Intake



භූගත බලාගාරය / நிலத்தடி மின் நிலையம் /Underground power house



රන්දෙණිය ස්විච් අංගනය / **ரன்தெனிய சுவிச் முற்றம்** / Randeniya Switch Yard



විදුලි සම්ප්‍රේෂණ මග/ **மின் பரிமாற்ற வழி** / Transmission Line

3. මොරගහකන්ද කළුගඟ ජලාශය ව්‍යාපෘතිය/மொரகஹகந்த களு கங்கை நீர்த்தேக்க கருத்திட்டம்/ Moragahakanda Kaluganga Reservoir Project



මොරගහකන්ද ජලාශය/ மொரகஹகந்த நீர்த்தேக்கம்/ Moragahakanda Reservoir



කළුගඟ ජලාශය/ களு கங்கை நீர்த்தேக்கம்/ Kaluganga Reservoir





ගුරුවෙල නැවත පදිංචි කිරීමේ ප්‍රදේශය/ **குருவெல முள்குடியேற்ற பிரதேசம்**/ Guruwela resettlement area

4. ඵලදායිතා ප්‍රවර්ධන හා වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය/ வினைத் திறனை மேலுயர்த்தும் மற்றும் நீர்ப்பாசன தொகுதிகளின் திறனை மேம்படுத்தும் கருத்திட்டம்/ Productivity Enhancement and Irrigation System Efficiency Improvement Project (PEISEIP)





පැරෂුට් තැටි බෙදා හැරීම සහ පිටියේ තැබීම - මහනුවර දිස්ත්‍රික්කය/ பாராசூட் தட்டுக்களை விநியோகித்தல் மற்றும் களத்தில் வைப்பது - கண்டி மாவட்டம்/ Distributing Parachute Trays and Placing them on field – Kandy District

5. දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය/ கால நிலை மாற்றங்களுக்கு இயைபாக்கமடைவதற்கான ஒருங்கிணைந்த நீர் முகாமைத்துவ கருத்திட்டம்/ Climate Resilient Integrated Water Management Project (CRIWMP)





වැව් ප්‍රතිසංස්කරණය : ඇතාබැඳිවැව එල්ලංගා පද්ධතිය සහ කුඹුක් වැව එල්ලංගා පද්ධතිය - ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය / குளம் புனரமைப்பு : அதபெந்திவெவ அருவி மற்றும் குபுக் வெவா அருவி - திருகோணமலை மாவட்டம்/ Tank Rehabilitation : Athabendiwewa cascade & Kumbuk wewa cascade - Trincomalee district





බීජ සහ කොළ පොහොර සඳහා සන්හෙම් වගාව - පෙරියකට්ටු වැව - පෙරියමඩු ගොවිජන සේවා මධ්‍යස්ථානය / விதை மற்றும் பசுந்தாள் உரத்திற்கான சன்ஹெம் சாகுபடி: பெரியகட்டு குளம், பம்பைமடு ASC / Sun hemp cultivation seed and green Manure: Periyakattu tank , Pampeimadu ASC





ග්‍රාමීය ගෙවතු වගාව - වවුනියාව දිස්ත්‍රික්කය / கிராமிய வீட்டுத்தோட்டம் - வவுனியா மாவட்டம் / Rural Home gardens – Vavuniya





ආඩියාපුලියන්කුම ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘතිය - වවුනියාව දිස්ත්‍රික්කය/ **ஆடியன்குளம் கிராமிய நீர் விநியோக திட்டம் - வவுனியா மாவட்டம்** / Andiyapuliyankulam Rural Water Supply System (RWSS)

6. තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය / தல்பிட்டிகல நீர்த்தேக்க கருத்திட்டம் / Thalpitigala Reservoir Project



බේලි පාළම / **பெய்லி பாலம் / Bailey Bridge**



වේල්ල ප්‍රවේශ මාර්ගය / **அணை அணுகல் சாலை / Dam Access Road**

7. පහළ මල්වතු ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය / தாழ் மல்வத்து ஓய பல்நோக்கு அபிவிருத்தி கருத்திட்டம் / Lower Malwathu Oya Multi Sector Development Project





RB සොරොව්ව ඉදිකිරීම / **RB மதகு கட்டுதல்** / Construction of RB Sluice Works







ආදර්ශ ගොවිපල ඉදිකිරීම / **மாதிரி பண்ணை கட்டுமானம்** / Construction of Model Farm



පිටවාන මූලික ඉදිකිරීම් සඳහා කැණීම් කටයුතු / **கசிவுப்பாதை அடித்தள கட்டுமான பணிகளுக்காக** தோண்டுதல் / Excavation for Spillway Foundation Construction Works



නැවත පදිංචි කිරීමේ ප්‍රදේශය සංවර්ධනය / **மீள் குடியேற்ற பகுதியின் வளர்ச்சி** / Development of Resettlement Area

8. මල්වතු ඔය, මාදුරු ඔය සහ කුඹුක්කන් ඔය ගංගා ද්‍රෝණි ආශ්‍රිතව භූගත ජල විමංඝන ජාලයක් ස්ථාපිත කිරීමේ නියමු ව්‍යාපෘතිය / **மல் வது ஓய, மாதுரு ஓய மற்றும் கும்புக்கன் ஓய ஆற்றுப் படுக்கையுடன் தொடர்புடையதாக நிலக் கீழ் நீர் கண்காணிப்பு வலையமைப்பொன்றை நிலை நாட்டும் முதல் நிலை கருத்திட்டம் / Pilot Project on Establishment of Groundwater Monitoring Network in Malwathu Oya, Maduru Oya & Kumbukkan Oya River Basins**



පරීක්ෂණ ළිං කැණීම/ **கண்காணிப்பு கிணறு தோண்டுதல்**/ Drilling of Monitoring well



සම්පූර්ණ කරන ලද වැසි මාපකය සමඟ පරීක්ෂණ ළිං අඩවිය / **மழை மானியுடன் கூடிய கண்காணிப்பு கிணறு தளம்**/ Completed Monitoring Well Site with Rain Gauge

9. නුවරඑළියේ බැරැක්තැන්න වැව ප්‍රතිසංස්කරණය කිරීම/ **நுவரெலியா பெரெக்தென்ன குளத்தை மறு சீரமைத்தல்/ Restoration of Barrack Plain Tank in Nuwara Eliya**





වැවේ රොන්මඩ කැණීම සහ ඉවත් කිරීම/ **குளத்தில் உள்ள வண்டல் மண்ணை தோண்டி அகற்றுதல்**/ Excavation & removal of silt in tank

10. ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය / ஒருங்கிணைந்த நீரேந்து மற்றும் நீர்வளங்கள் முகாமைத்துவ கருத்திட்டம் / Integrated Watershed and Water Resource Management Project (IWWRMP)



වලව දකුණු ඉවුර ප්‍රධාන ඇළ ඔස්සේ පාරිසරික වැඩිදියුණු කිරීම් සහ වෙන් කිරීම් සලකුණු කිරීම / வலவ தெற்கரை பிரதான அலை வழியாக சுற்றுச்சூழல் மேம்படுத்தல்கள் மற்றும் இடங்கள் அடையாளமிடல் / Ecological Improvements and Marking Reservation along Walawa RB Main Canal



කල්මඩු යෝජනා ක්‍රමයේ ප්‍රධාන වැඩ ප්‍රතිසංස්කරණය කිරීම /கல்மடு பரிந்துரைக் கழகத்தின் முதன்மை வணிகப்பிரசுரம் / Rehabilitation of Kalmadu Scheme Headworks



පිරමන්තලාරු යෝජනා ක්‍රමය යටතේ පහළ නිම්න ප්‍රදේශය පුනරුත්ථාපනය කිරීම /பிறமந்தலாறு திட்டத்தின் கீழ் தாழ் பிரதேச புணரமைப்பு / Rehabilitation of downstream under piramanthalaru scheme



Siphon ඇතුළත ජලය ඉවත් කිරීම සහ රොන්මඩ ඉවත් කිරීම - රක්වාන ගඟ / Siphon நீர் அகற்றல் மற்றும் களிமண் அகற்றல் - ரக்கவான ஆறு / Desiliting & Dewatering work on progress inside the siphon - Rakwana Ganaga

11. මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය/ மாதுரு ஓய வலக் கரை அபிவிருத்திக் கருத்திட்டம் /Maduru Oya Right Bank Development





ප්‍රධාන ඇල ඉදිකිරීම්/ பிரதான கால்வாய் கட்டுமானம்/ Construction of Main Canal





ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම **/ அணுகல் பாதை நிர்மாணிப்பு /** Construction of Access Road





'වාන සහ පිටවාන ඉදිකිරීම **/ நுழைவாயில் மற்றும் வெளிவாயில் கட்டுமானம் /** Construction of Inlet & Outlet

12. පැලවත්ත ලංකා සීනි සමාගමේ පර්යන්ත ප්‍රදේශ ජනාවාස භූමියෙහි වාරි සංවර්ධන සැලැස්ම/ பெலவத்த லங்கா சீனி நிறுவனத்தின் தங்குமிடப் பிரதேசத்தின் குடியேற்ற நிலத்தின் பாசன செயற்பாடுகளை மேம்படுத்தும் திட்டம்/ Peripheral area of settlers in Pelawatta Sugar Plantation area





මීපලේ වැව ඉදිකිරීම**/** மீபே குளம் நிர்மாணிப்பு / Construction of Meepale wewa

13. නාච්චාදුව මහා වාරිමාර්ග ව්‍යාපාරයේ ගොවිපල ඉඩම් ප්‍රතිසංවර්ධනය කිරීමේ අධ්‍යයනය සඳහා වූ නියමු ව්‍යාපෘතිය / **நாச்சாதுவ பாரிய நீர்ப்பாசன கருத்திட்டத்தின் கீழான பண்ணைக் காணிகளை மீள் விருத்தி செய்யும் ஆராய்ச்சி தொடர்பான முன்னோடு கருத்திட்டம் / Pilot Farm Land Consolidation Study Project in Nachchaduwa major Irrigation Schemes**



පාර ඉදිකිරීම / பாதை நிர்மாணிப்பு / Construction of roads



ලියැදි සකස් කිරීම / அடுக்குகள் நிர்மாணிப்பு / Preparing plots





ලෙසර්ලෙවල් කිරීම/ லேசர் லெவல் செய்தல்/ Laser levelling

14. වාරි සෞභාග්‍ය වැඩ සටහන / **நீர்ப்பாசன செழுமை நிகழ்ச்சித்திட்டம் / Wari Saubhagya Programme**



කොරලගහ වැව ඉදිකිරීම / கோரலகஹ ஏரியின் கட்டுமானம் / Construction of Koragahawala Wewa



බෙරු වැව / பேரு ஏரி /Beru wewa




කුඩාගල්වල වැව / குடகல்வல ஏரி/ Kudagalwala Tank




දළුක් පැලැස්ස වැව / தலுக்பலஸ்ஸ ஏரி/ Dalukpelessa Wewa




ගොඩන්රාළලාගේ වැව / கோடன்ரலாலா ஏரி/ Godanralalage Wewa




වේලංගහ වෙල / வெலங்கஹவெல / Welangahawela

ක්‍රියාත්මක ආයතන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති / වැඩසටහන්
செயற்படும் நிறுவனத்தின் ஊடாக நடைமுறைப்படுத்தப்படும் கருத்திட்டங்கள்
Projects / Programmes Implemented under the Implementing Institutions

වාරිමාර්ග දෙපාර්තමේන්තුව
நீர்ப்பாசன திணைக்களம்
Irrigation Department

1. යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය/ யான் ஓயா நீர்த்தேக்கத் திட்டம்/ Yan Oya Reservoir Project



ඉස්සන් වැව විභේදන නිර්මිතය ඉදිකිරීම / இசான் வாவி பிளவு அமைப்பு / Issanwewa bifurcation structure



ඉස්සන් වැව වැව් බැම්ම සහ ප්‍රධාන ඇල මාර්ගය / இசான் வாவி குளக்கட்டு மற்றும் பிரதான கால்வாய் / Issanwewa tank bund and MC canal filling



ඉස්සන් වැව D2 ඇල මාර්ගය / இசான் வாவி D2 கால்வாய் / Issanwewa D2 Canal



ඉස්සන් වැව ප්‍රධාන ඇල මාර්ගය / இசன் வாவி பிரதான கால்வாய் / Issanwewa Main Canal

2. පහළ ඌව මධ්‍ය හා සුළු පරිමාණ සංවර්ධන ව්‍යාපෘතිය/ கீழ் ஊவா திட்டம் / Lower Uva Project





දෙබර ආර පෝෂිත ඇල ඉදි කිරීම/ டெபரா அரா ஊட்டி கால்வாய் அமைத்தல்/ Construction of Debara ara feeder canal

3. මහගෝන වැව ව්‍යාපෘතිය/ மஹாகோண வாவி திட்டம்/ Mahagona Wewa Project





FC 01 ඇලේ ඉදිකිරීම් / FC 01 கால்வாய் கட்டுமானம் / Construction of FC 01

දකුණු ඇළෙහි ඉදිකිරීම් / வலது கால்வாய் கட்டுமானம் / Construction of RB Canal

4. ඇල්ල වැව ජලාශය/ எல்ல வாவி நீர்த்தேக்கம்/ Ella Wewa Reservoir





සෑදල වේල්ල ඉදි කිරීම / சேதல அணை கட்டுதல் / Construction of Saddle Dam

සොරොව්ව ඉදි කිරීම් කටයුතු/ மதகு கட்டுமானம்/ Sluice Construction

5. කුඹුක්කන්ඔය ජලාශ ව්‍යාපෘතිය/ கும்புக்கன் ஓயா நீர்த்தேக்கம்/ Kumbukkan Oya Reservoir Project



නුගමන්ඩිය අමුණෙහි භූ විද්‍යා විමර්ශන කටයුතු සිදුකිරීම / நுகமண்டியா அணைக்கட்டில் புவியியல் ஆய்வுகள் / Geological Investigations in Nugamandiya Anicut



ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය ඉදිකිරීම / திட்ட இயக்குநர் அலுவலகம் கட்டுதல் / Construction of Project Director's Office

6. මුන්දෙනි ආරු ගංහාද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය (රූගම් කිතුල්)/ முன்தெனி ஆறு ஆற்று வடிநீர் மேம்பாட்டுத் திட்டம் (ருகம் கிதுல்)/ Mundeni Aru River Basin Development Project (Rugam-Kithul)



සමාජ සමීක්ෂණ සිදුකිරීම / சமூக ஆய்வு மேற்கொள்ளல் / Social Survey



PMU සහ PIU සඳහා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම / PMU மற்றும் PIU அலுவலக கட்டிடம் கட்டுதல் / Construction of office building for the PMU and PIU

7. ගොඩිගමුව ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම/ கொடிகமுவ தொட்டியின் வளர்ச்சி மற்றும் மேம்பாடுகள்/ Development & Improvements to Godigamuwa Tank



අමුණ ඉදිකිරීම /அணைக்கட்டு கட்டுமானம்/ Anicut construction



වාන ඉදිකිරීම / கசிவு கட்டுமானம் / Construction of Spill

8. මොණරාගල දිස්ත්‍රික්කයේ කඩිනම් වාරි සංවර්ධන ව්‍යාපෘතිය (වෙල්ලස්ස නවෝදය)/ **மொனராகலை மாவட்டத்தில் துரிதப்படுத்தப்பட்ட நீர்ப்பாசன அபிவிருத்தி கருத்திட்டமவெல்லஸ்ஸ) நவோதயா/ Accelerated Irrigation Development Project in Monaragala District (Wellassa Navodaya)**





උරුඵල වැව ඉදිකිරීම / **ஊரா உல தொட்டியின் கட்டுமானம் /** Construction of Uraula Tank

9. කැළණි ගඟ ආරක්ෂණ බැම්ම ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය / **களனி நதி அணைக்கட்டு பாதுகாப்பு / Kelani River Bund Protection Project**



සුලු ගංවතුර ආරක්ෂණ ව්‍යූහය වැඩිදියුණු කිරීම **/ களனி வடக்கு கட்டு மறுசீரமைப்பு** / Improvements to MFP Structures



කැළණි උතුරු බැම්ම වැඩිදියුණු කිරීම / **வடக்கு கரை புனரமைப்பு /** Kelani North Bund Rehabilitation

10. කැළණි, මුන්දෙනි ආරු, කළු, නිල්වලා හා ගිං ගංගා ද්‍රෝණි වල ගංවතුර වැලැක්වීමේ ව්‍යාපෘතිය/ **களனி, முண்டேனியாறு, களு, நில்வல மற்றும் ஜின் கங்கைப் படுகைகளில் வெள்ளத் தணிப்புத் திட்டங்கள்/ Flood Mitigtion Projects in Kelani , Mundeniaru, Kalu, Nilwala & Gin Ganga basin**



මාගල්ලෙගොඩ පොම්පාගාරය වැඩිදියුණුකිරීම **/** மகல்லேகொட பம்ப் ஹவுஸ் - மேம்பாடு பணிகள் / Improvements work - Magallegoda Pump House



තලගහගොඩ පොම්පාගාරය වැඩිදියුණුකිරීම **/** தல்கஹகொட பம்ப் ஹவுஸ் மேம்பாடு பணிகள் / Improvements work - Thalgahagoda Pump House

11. කුඩාවිලච්චිය ජලාශය ප්‍රතිසංස්කරණය කිරීම/ **குடவிலச்சிய நீர்த்தேக்கத் திட்டம்/ Kudawilachchiya Reservoir Project**



බෝක්කු ඉදිකිරීම / **கால்வாய் அமைத்தல்** / Construction of box culvert



වලන්තලියාව වැවෙහි පිටවාන් දොරටු ඉදිකිරීම / **வலந்தலியாவ குளத்தின் கசிவு கதவுகள் அமைத்தல்** / Spill gates of Walanthaliyawa Tank

12. උමා ඔය පහළ නිම්න සංවර්ධනය / **உமா ஓய பல்நோக்கு அபிவிருத்தி / Uma Oya Downstream Development**



අලිකොට ආර හරස් ඇළ / **அலிகோட்டா அரா பரிமாற்ற கால்வாய்** / Alikota Ara Transfer Canal



දිය මං පාලම / **தண்ணீர் பாலம்** / Koonwelana Aqueduct

13. හිඹිලියාකඩ වාරි යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය / ஹிம்பிலியகட நீர்ப்பாசன உட்கட்டமைப்பு அபிவிருத்தி திட்டம் / **Himbiliyakada Irrigation Infrastructure Development Project**



වත්තේගෙදර වැවේ කටයුතු / **வத்தேகெதர ஏரியின் செயற்பாடுகள்**/ Grouting of Waththegedara Tank



වත්තේගෙදර වැව් සොරොව්ව ඉදිකිරීම / **வத்தேகெதர மதகு கட்டுதல்**/ Wattegedara Suilce

14. විලකණ්ඩිය ජලාශ ව්‍යාපෘතිය/ விலகண்டிய நீர்த்தேக்கம்/ Wilakandiya Reservoir Project



ප්‍රධාන ඇළෙහි ඉදි කිරීම/ பிரதான கால்வாய் கட்டுமானம் / Construction of Main canal



නිර්මිත ඉදිකිරීම / கட்டமைப்புகள் கட்டுமானம் / Construction of Structures

15. මහගල්ගමුව පෝෂිත ඇළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය/ மஹகல்கமுவ குளத்தை மேம்படுத்துதல்/ Augmentation of Mahagalgamuwa Tank





නිර්මිත ඉදිකිරීම / கட்டமைப்பின் கட்டுமானம் / Construction of Structures

වාරිමාර්ග කළමනාකරණ අංශය
நீர்ப்பாசன முகாமைத்துவ பிரிவு
Irrigation Management Division

නිරන්තර නඩත්තු වැඩසටහන / நீர்ப்பாசன துணை அமைப்பின் வழக்கமான பராமரிப்பு / Regular maintenance of Irrigation sub system



රාජාංගනය ව්‍යාපාරය /ராஜாங்கனை திட்டம்/ Rajanganaya Project



මී ඔය ව්‍යාපාරය /மீ ஓயா திட்டம் / Mee Oya Project

කෘෂි නිෂ්පාදනය / விவசாய உற்பத்தி / Agricultural Production



බඩඉරිගු වගාව - හුරුළුවැව ව්‍යාපාරය /**சோள உற்பத்தி – ஹுருலு வெவா திட்டம்** / Maize cultivation - Hurulu Wewa Project



වී වගාව - නුවර වැව ව්‍යාපාරය /**நெல் உற்பத்தி – நுவர வெவா திட்டம்** / Paddy Cultivation – Nuwara Wewa Project

සිරි දළදා යල් අස්වනු පූජාව”/ “**ஸ்ரீ தலதா யல் அஸ்வானு பூஜை**” / “*Siri Daladha Yal Aswanu Pujawa*”





ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
இலங்கை மகாவலி அதிகாரசபை
Mahaweli Authority of Sri Lanka













පශු සම්පත් හා කෘෂිකර්මාන්තයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය / **கால்நடை மற்றும் விவசாயத்தில் முக்கிய நடவடிக்கைகளின் முன்னேற்றம்** / Progress of Major Live Stock and Agricultural Activities

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය
மத்திய பொறியியல் ஆலோசனைப் பணியகம்
Central Engineering Consultancy Bureau (CECB)





බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි ව්‍යාපෘතිය / பிராட்லேண்ட்ஸ் நீர்மின் திட்டம்/ Broadlands hydropower project

මධ්‍යම ඉංජිනේරු සේවා පෞද්ගලික සමාගම
மத்திய பொறியியல் சேவைகள் தனியார் நிறுவனம்
Central Engineering Services (Pvt) Ltd



රත්නපුර අධිකරණ සංකීර්ණය ඉදිකිරීම / இரத்தினபுரியில் நீதிமன்ற வளாகம் கட்டுதல்/ Construction of Court Complex at Rathnapura



රත්නපුර මහ රෝහලේ රේඛීය ඇක්සලරේටර් කාමරය සහ විකිරණ චිකිත්සක දෙපාර්තමේන්තුව / இரத்தினபுரி பொது வைத்தியசாலையின் லீனியர் ஆக்சிலரேட்டர் அறை மற்றும் கதிரியக்க சிகிச்சைப்பிரிவு / Linear Accelerator Room & Radiotherapy Department at General Hospital, Rathnapura

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. අයිඩබඑම/ඒ/එමඅයි/එෆ්ඒ/2022

මබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 ජූනි 30 දින



ලේකම්

වාරිමාර්ග අමාත්‍යාංශය

වාරිමාර්ග අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එම්.ඩි.සුදර්ෂණී අමරතුංග
ජ්‍යේෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත : අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

අංක 306/72, පොළුදුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொலுதுவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. අයිඩබ්එම/ඒ/එමඅයි/එස්ඒ/2022 මෙම අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 ජූනි දින

වාරිමාර්ග අමාත්‍යාංශය
සැලසුම් හා මෙහෙයුම්
07 JUL 2023
ලාවත්ත.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
වාරිමාර්ග අමාත්‍යාංශය

ශීර්ෂය 198 - වාරිමාර්ග අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 198 - වාරිමාර්ග අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වාරිමාර්ග අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වාරිමාර්ග අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

CamScanner

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර, ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරවිකිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) විගණනය කළ සිය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණ අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නොතිබුණි.

විගණන නිරීක්ෂණය	මෙම වාර්තාවේ ඡේදයට යොමුව
මූල්‍ය නොවන වත්කම් ආරම්භක ශේෂ සටහන් කිරීමේදී වත්කම් ගිණුම් 4 ක එකතු වටිනාකම රු.1,321,253,268ක් ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ හා නොගැලපීම හේතුවෙන් වත්කම් ගිණුම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.	1.6.2 මූල්‍ය නොවන වත්කම්

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) මූල්‍ය නොවන වත්කම් ආරම්භක ශේෂය සටහන් කිරීමේදී කාර්යාල ගොඩනැගිලි ශේෂය රු.2,571,665 කින්, ප්‍රවාහන උපකරණ ශේෂය රු.48,500,000 කින්, යන්ත්‍රෝපකරණ හා උපකරණ ශේෂය රු.20,406,680 කින් හා ඉඩම් ශේෂය රු.1,249,774,923 කින්, ලෙස එකතු වටිනාකම රු. 1.321,253,268 කින් වැඩියෙන් දක්වා තිබුණි. මෙහිදී ආරම්භක ශේෂයට සිදු කරන ලද ගැළපීම් පිළිබඳ විස්තරද විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) ඵලදායීතා ප්‍රවර්ධන හා වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 1,706.81 ක පිරිවැයක් දරා තිබූ අතර එම පිරිවැය ප්‍රාග්ධනගත කර නොතිබුණි.

(ඇ) රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීම සම්බන්ධව නිකුත්කල 2017 ජූනි 28 දිනැති අංක 01/2017 දරන චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවත් වැය විෂය අංක 2506 - යටිතල පහසුකම් සංවර්ධනය යටතේ ඉකුත් වසර දෙක තුළ රු. 57,064,188,815 ක් වැයකර සංවර්ධනය කරන ලද දේපල නිශ්චිත ලෙස හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමනාකරණය

අමාත්‍යාංශය සඳහා රු.මිලියන 63,670 ක් ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන ඇලසා තිබුණු අතර ඒ යටතේ රු. මිලියන 45,594 ක් වැය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් සැලසුම්කර වරින් වර ප්‍රතිපාදන ඉල්ලුම් කර තිබුණද මහා භාණ්ඩාගාරය රු. මිලියන 10,127 ක් පමණක් නිදහස් කර තිබුණි. ඒ අනුව අයවැය මගින් අනුමත කර තිබුණු ව්‍යාපෘති සැලසුම් කළ පරිදි ඉටු කිරීම සඳහා පුරෝකතනය කළ අග්‍රිම අවශ්‍යතාවයෙන් සියයට 16 ක් පමණක් නිදහස් කර තිබුණි.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

(අ) 2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/2017 හි 02(ඇ) ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂයට අදාළ ගෙවීම් එම මුදල් වර්ෂයේ දී නිදහස් කළ යුතු අතර, කිසිදු බැරකමක් ඊළඟ වර්ෂය තුළ නිරවුල් කිරීමේ අරමුණ ඇතිව ඉදිරියට ගෙන නොයා යුතු බවට වූ උපදෙස් පිළිබඳ නොයලකා 2022 දෙසැම්බර් 31 දිනට වැය ශීර්ෂ 13 කට අදාළව රු.1,915,869,976 ක් වූ බැරකම් වලට එළඹ තිබුණි.

(ආ) 2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/2017 ප්‍රකාරව, කටයුතු කර නොතිබීම හේතුවෙන් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන වල බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ සටහන (iii) හි 2022 දෙසැම්බර් 31 දිනට බැරකම් ශේෂය රු. 1,915,868,976 ක් වුවද රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ පොත් අනුව එදිනට ශේෂය රු.1,885,490,468 ක් විය. ඒ අනුව රු. 30,379,508ක වෙනසක් විය.

(ඇ) මූල්‍ය ප්‍රකාශන වල සඳහන් බැඳීම් හා බැරකම් ප්‍රකාශනයේ ව්‍යාපෘති 03 ක් යටතේ බැඳීම් එකතු වටිනාකම රු. 914,562,937 ක් ලෙස දක්වා තිබුණද රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ පොත් අනුව එම බැඳීම් වටිනාකම රු.909,779,881 ක් විය. ඒ අනුව රු. 4,783,056 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) මූල්‍ය ප්‍රකාශනවල සඳහන් බැඳීම් හා බැරකම් ප්‍රකාශනයේ ව්‍යාපෘති 03ක් යටතේ බැරකම් එකතු වටිනාකම රු. 142,155,040ක් ලෙස දක්වා තිබුණද රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු පොත් අනුව එම බැරකම් වටිනාකම රු. 174,514,246 ක් විය. ඒ අනුව රු. 32,359,206 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) මොරගහකන්ද ජලාශයේ ප්‍රධාන බැම්ම ඉදිකිරීම ව්‍යාපෘතියේ විදුලි උත්පාදන යන්ත්‍ර හතරක් සවිකිරීම වෙනුවෙන් ඇමෙරිකානු ඩොලර් 10,937,960ක් විවලත්‍ය ගගවීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත 2016 නොවැම්බර් 29 දිනැති අංක 16/2513/704/067 දරන අමාත්‍ය තීරණය අනුව ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසුව ප්‍රධාන බැම්ම හා එහි විදුලිබල පද්ධතිය වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ පාලනය කර, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විදුලි බලය නිපදවිය යුතු අතර, නිෂ්පාදිත විදුලිය ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයට අලෙවිකර ලබා ගන්නා මුදලින් ව්‍යාපෘතිය සඳහා ලබාගත් ණය මුදල ආපසු ගෙවිය යුතුවේ. එසේ වුවද නිෂ්පාදිත විදුලිය අලෙවිකිරීම සඳහා ගිවිසුමකට එළඹීමට හෝ අදාළ ණය මුදල ගෙවීමේ වගකීම අමාත්‍යාංශයේ බැඳීම් හා බැරකම් ප්‍රකාශනයේ හෙළිදරව් කර නොතිබුණි.

2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.8 ඡේදය ප්‍රකාරව විගණන විමසුම් 4 කට පිළිතුරු ලබා දී නොතිබුණි.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 394 සහ 396(ඇ)	2022 දෙසැම්බර් 31 දිනට මාස 06 කට වැඩි කලක් ගත වූ බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් 114 ක එකතු වටිනාකම රු.186,375,770 ක් ආදායමට ගෙන නොතිබුණි.
(ආ) 2019 ජූනි 27 දිනැති අංක 05/2019 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03(ඉ) ඡේදය	සේවය හැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් එකතුව රු.316,172ක ණය මුදලක් අය විය යුතුව තිබුණු අතර ඉන් එක් නිලධාරියකුගෙන් අය විය යුතු රු.73,062ක් වූ ණය මුදල වර්ෂ 05කටත් වඩා පැරණි විය. එම ණය මුදල් ඇපකරුවන්ගෙන් අයකර ගත යුතු වුවත් ඒ සඳහා පියවර ගෙන නොතිබුණි.
(ඇ) 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍ර ලේඛයේ 1.1.7 ඡේදය	වර්ෂ 5 කට වැඩි කාලයක් තිස්සේ හඳුනානොගත් රු.434,066 ක ණයගැති ශේෂ 2023 මැයි වන විටත් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

(අ) වර්ෂය අවසාන දිනට මුදල් පොතේ පැවති ශේෂය මහා භාණ්ඩාගාරය වෙතට ප්‍රේෂණය කළ යුතු වුවද 2022 දෙසැම්බර් 31 දිනට දේශීය අරමුදල් යොදවා ක්‍රියාත්මක කළ කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතියට අදාලව ලංකා බැංකුවේ අංක 8755007 දරන බැංකු ගිණුමේ පැවති රු. 855,849 ක් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලසුම් කිරීම

(අ) මහවැලි කලාප ආශ්‍රිත ඇළවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ශීර්ෂය 428

අංක PED/RED/01/01/2020/02 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි මාර්ගෝපදේශ ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළයුතු වුවත්, රාජ්‍ය අමාත්‍යාංශය වෙත වාර්ෂික ඇස්තමේන්තුවෙන් වෙන්කරන ලද එකතුව රු. 1,535,900,000ක් වූ ප්‍රාග්ධන ප්‍රතිපාදන වෙනුවෙන් එම ආකෘතිය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මෙහිද වාර්ෂික ඇස්තමේන්තුවෙන් අංක 428-02-03-01-2201 වැය විෂයයට රු.මිලියන 275.81 ක් සහ 428-01-02-2001,2002,2003 සහ 2401 වැය විෂයයන්ට රු.මිලියන 2.9 ක් වශයෙන් වෙන් කර තිබුණු ප්‍රාග්ධන ප්‍රතිපාදන යොදවා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන් ඇතුළත් කර නොතිබුණි.

3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

(අ) බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය

ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සභාපතිවරයා සහ China Machinery Engineering Corporation සමාගමේ සභාපතිවරයා අතර 2013 මැයි 15 වන දින එළඹ තිබූ කොන්ත්‍රාත් ගිවිසුම අනුව ඇ.ඩො. මිලියන 229.5 ක වටිනාකමකින් යුත් උක්ත ව්‍යාපෘතිය 2014–2017 කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක කර අවසන් කිරීමට නියමිතව තිබුණි. එම ව්‍යාපෘතියේ මූලික ජල මූලාශ්‍රය වූ බස්නාගොඩ ජලාශය ඉදිකිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමග ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, 2016 මාර්තු 22 හා 2019 ජූනි 12 යන දිනයන් හිදී අවබෝධතා ගිවිසුම් දෙකකට එළඹ තිබුණි. මෙම ව්‍යාපෘතියට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) විසින් ලබාදුන් නිර්දේශ අනුව අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ ප්‍රසම්පාදන කමිටුව (CAPC) විසින් බස්නාගොඩ ජලාශයේ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.2,347,406,831 කට චීනයේ සිනෝහයිඩ්‍රෝ සමාගම (Sinohydro Corporation Limited) වෙත ප්‍රදානය කිරීම සඳහා නිර්දේශ ලබා දී තිබුණි. ඒ සඳහා ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ජලාශය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් විසින් උක්ත සමාගම සමඟ 2019 ජූනි 13 වන දින රු.2,394,354,968 ක (රු.46,948,137ක ජාතිය ගොඩනැගීමේ බදු ඇතුළත්ව) වටිනාකමකින් යුත් ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPC) කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. පහත නිරීක්ෂණ කෙරේ.

(i) මෙහිදී නිලධාරීන් හයදෙනෙකුගෙන් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) කොන්ත්‍රාත්තුව සඳහා අවම මිල ඉදිරිපත් කර තිබූ ක්‍රොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ රු.මිලියන 2,093 ක ලංසුව රු. මිලියන 2,347ක් ලෙස නිවැරදි විය යුතු බවට ගණනය කොට තිබුණි. එහිදී ඉංජිනේරු ඇස්තමේන්තුවේ අයිතම අංක 05 යටතේ මූලික වැඩ සඳහා (Preliminaries) කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර තිබූ රු.මිලියන 99.689 ක වියදමට රු. 254,062,080 ක අමතර වටිනාකමක් එකතු කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) කටයුතු කර තිබුණි. එසේ වුවද කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කළ මිල ගණන් තුළ අයිතම අංක 4 යටතේ ස්ථාපනය කිරීම, ඉදිකිරීම සහ වෙනත් සේවාවන් (Installation/ Construction and other Services) ලෙස රු.254,062,080 ක් දක්වා තිබූ අතර ඒ පිළිබඳ නොසලකා තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) අයිතම අංක 5 සඳහාද සාවද්‍ය ලෙස රු.254,062,080 ක් එකතු කර ඉදිරිපත් කළ ලංසුවට වඩා රු. 254,062,080 ක් වැඩියෙන් ක්‍රොන්ත්‍රාත්තුව පැවරීමට නිර්දේශ කර තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සිදුකර තිබූ උක්ත සංශෝධනය ඉංජිනේරු ප්‍රසම්පාදන හා ඉදිකිරීම් කොන්ත්‍රාත් ප්‍රසම්පාදන ලේඛනයේ මූලික නිර්ණායකයන්ට පටහැනි වූ අතර එහිදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1(v) වගන්තිය අනුව ලංසුකරුගෙන් ලිඛිතව පැහැදිලි කිරීම් ලබා නොගෙන රු. 254,062,080 කින් කොන්ත්‍රාත් වටිනාකම වැඩි කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබුණි. එහිදී ප්‍රසම්පාදන අස්පීත්වය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.2.6.1(v) ප්‍රකාරව කටයුතු නොකිරීමෙන් මාර්ගෝපදේශ 2.6 යටතේ පැවරි ඇති වගකීම් නිසිලෙස ඉටු කරද නොතිබුණි.

(ii) උක්ත රු.254,062,080 කින් වැඩිකරන ලද වටිනාකමට කොන්ත්‍රාත්තුව පිරිනැමීම හා ඒ මත පදනම්ව අත්තිකාරම් ගණනය කර ගෙවීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු වෙත 2019 වර්ෂයේදී සංවලනා අත්තිකාරම් ලෙස (Mobilization advance) රු. 50,812,416 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(iii) වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කොන්ත්‍රාත්කරු සමඟ 2019 ජූනි 13 වන දින එළඹ තිබූ කොන්ත්‍රාත් ගිවිසුමෙහි iv වන කොටසෙහි ඇතුළත් විශේෂිත කොන්දේසි (Particular Conditions Of Contract) අනුව වාරිමාර්ග අමාත්‍යාංශ ගල්කම් දැනුවත් කිරීමකින් තොරව හා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ ප්‍රසම්පාදන කමිටුව (CAPC) විසින් අනුමත කරතිබූ කොන්ත්‍රාත් ගිවිසුම, අනුමැතියකින් තොරව වෙනස් කර ගෙවීම් සහතික කිරීමට හාවිත කොට තිබුණි. ඒ අනුව විධිමත් අධිකාරී බලයකින් තොරව 2020 සිට 2022 දක්වා අතුරු ගෙවීම් (Interim Payments) 11 ක් මගින් රු.401,165,861 කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි වලට පටහැනිව ගෙවා තිබුණි.

(iv) ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPC) කොන්ත්‍රාත් වලට අදාළ First Edition 1999 (ISBN2 – 88432 -0220 -9) පොදු මාර්ගෝපදේශයේ 14.2 උප වගන්තිය ප්‍රකාරව අත්තිකාරම් ගෙවීම් නැවත අයකර ගැනීම මුළු කොන්ත්‍රාත් වටිනාකමින් 30% සම්පූර්ණ කිරීමෙන් පසුව

සිදුකරනු ලබන බවට වූ විශේෂ කොන්දේසියට සමාගාමීව 14.4 උප වගන්තියෙහි වූ ගෙවීම් ලේඛනයට (Schedule of Payment) අදාළ විශේෂ කොන්දේසි ඇතුළත් කර නිබුණද ඒ පිලිබඳ නොසලකා ගෙවීම් කිරීම හේතුවෙන් 2022 ඔක්තෝම්බර් 31 දිනට ව්‍යාපෘතියේ භෞතික කාර්යසාධනය සියයට 17.09 ක් ව පැවතියදී මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 36 ක් ගෙවා තිබුණි.

(v) ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු වන Chaina Machinery Engineering Corporation විසින් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අතිරේක සමානාධිකාරිවරයා අමතන ලද අංක CMEC/ATTANA/20120730/007 හා 2012 ජූලි 30 දිනැති ලිපිය මගින් ප්‍රධාන කොන්ත්‍රාත්තුවට අතිරේකව සිදුකරනු ලබන කාර්යන්හි (Indirect Works) සමස්ත වගකීම සෘජුවම ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත පැවරෙන බවත් උප කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්යන් ඉටුකිරීමේ ප්‍රමාදයන් නිසා දැරීමට සිදුවන අමතර පිරිවැය (delay of time completion and any extra cost) හේතුවෙන් ප්‍රධාන කොන්ත්‍රාත්කරුගේ කාර්යන්ට සිදුවන අහිතකර බලපෑම් සම්බන්ධයෙන් වන කිසිදු වගකීමක් එම සමාගම වෙත භාරපැවරෙන බවත්, එකී ප්‍රමාදයන් සඳහා කාලය දීර්ඝ කිරීම් ලබා ගැනීමට හා ඒ සඳහා වන අතිරේක පිරිවැය ලබාගැනීමට තම සමාගමට අයිතියක් පවතින බවත් දැනුම් දී තිබුණි. ව්‍යාපෘතිය 2017 වසරේ නිම කල යුතු වුවද එම කාල සීමාව තුළ ජල මූලාශ්‍රයේ ඉදිකිරීම් කටයුතු නිමකිරීම ප්‍රායෝගිකව කල නොහැකිව තිබියදී ඒ පිළිබඳ සැලකිලිමත් වීමෙන් තොරව 2016 මාර්තු 12 දින වාරිමාර්ග දෙපාර්තමේන්තුව ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමඟ පළමු අවබෝධතා ගිවිසුමට (MOU) එළඹ තිබුණි. එහිදී දෙපාර්තමේන්තුව විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් තොරව අදාළ උප කොන්ත්‍රාත්තුව භාර ගෙන තිබූ අතර එහි වැඩ කටයුතු මේ දක්වා නිම කර නොතිබුණි. මේ හේතුවෙන් ප්‍රධාන කොන්ත්‍රාත්කරුට කාලය දීර්ඝ කර ගැනීමට සහ අතිරේක පිරිවැය සඳහා හිමිකමක් පැවතීම හා එහි වගකීම උප කොන්ත්‍රාත්කරු ලෙස දෙපාර්තමේන්තුව වෙත විතැන් කිරීමේ හැකියාවක් පැවතුණද ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සහ මණ්ඩලයේ සභාපති 2019 ජූනි මස 12 දින දෙවන අවබෝධතා ගිවිසුමට එළඹෙන අවස්ථාව වන විටත් ප්‍රධාන කොන්ත්‍රාත් ගිවිසුමේ කාලය අවසන් වී තිබුණි.

(ආ) මහා/මධ්‍යම පරිමාන ව්‍යාපෘති පිලිබඳ දස අවුරුදු සැලැස්ම.

(i) මෙම දස අවුරුදු සංවර්ධන සැළැස්ම අනුව මහගල්ගමුව වැව ප්‍රගුණවත් කිරීම, පහළ මල්වතු ඔය ජලාශය ඉදිකිරීම, රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධනය, කිවුල් ඔය ජලාශය, කවුඩුල්ල වම් ඉවුර ප්‍රධාන ඇළ දම්සෝපුර වැව දක්වා දිර්ඝ කිරීම, රඹකැන් ඔය ඒකාබද්ධ සංවර්ධනය සහ මහවැලි බී කලාපය මදුරු ඔය දකුණු ඉවුර සංවර්ධනය යන ව්‍යාපෘති ව්‍යාපෘති 7 ක ශක්‍යතා අධ්‍යනයන් නිමකිරීමෙන් අනතුරුව 2012-2017 කාලසීමාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන

සැළසීමට 2011 සැප්තැම්බර් 28 දිනැති අංක 11/1851/508/034 දරන අමාත්‍යමණ්ඩල තීරණය මගින් අනුමැතිය ලැබී තිබුණි. එම ව්‍යාපෘති 7 ට අදාළව රු. මිලියන 76,043 ක් වූ මුළු පිරිවැය ඇස්තමේන්තු යටතේ 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 6,528 ක් වැය කර තිබූ නමුත් එකී ව්‍යාපෘති අතරින් එක් ව්‍යාපෘතියක්වත් මේ දක්වා සම්පූර්ණයෙන් නිම කර නොතිබූ අතර ව්‍යාපෘති 3 කට අදාලව නිම කිරීමේ ප්‍රතිශතය 1 ත් 5 ත් අතර විය. එකී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මගින් නව කුඹුරු හෙක්ටයාර් 68,000 කට පමණ වාරි ජලය සැපයීමට හැකිවන අතර, දැනට වගාකරනු ලබන ඉඩම් හෙක්ටයාර් 203,000 ක් සඳහා යල මහ දෙකන්නයේම ජලය සැපයීම සහ මෙ.වෙ. 200 ක විදුලි බලය නිෂ්පාදන අරමුණු කර තිබුනද එකී ප්‍රතිඵලය ජාතික ආර්ථික එක් වී නොතිබුණි.

(ii) උක්ත අමාත්‍යමණ්ඩල තීරණය අනුව වාරිමාර්ග ක්ෂේත්‍රයේ අනාගත සංවර්ධන කටයුතු ඉහත සංවර්ධන සැලැස්මට අනුකූලව සකස්කළ යුතු බවට තීරණය කර තිබූ නමුත් එම සැළැස්ම තුළ ඇතුළත් නොවූ කුඩාවිලච්චිය ජලාශ ප්‍රතිසංස්කරණය, ඵලදායිතා ප්‍රවර්ධන හා වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතා වැඩි දියුණු කිරීම (PEISEIP), තල්පිටිගල ජලාශය, ගිං නිල්වලා හැරවුම, ඇදමටගල්ල වැව ප්‍රතිසංස්කරණය, හිඹිලියාකඩ වත්තේ ගෙදර වාරිමාර්ග යටිතල පහසුකම් සංවර්ධනය කිරීම නම් වූ යන ව්‍යාපෘති 6 ක් රු. මිලියන 74,423.4 ක ඇස්තමේන්තු වටිනාකමක් යටතේ 2014 වර්ෂයෙන් පසු ආරම්භකර 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 6,902.44 ක පිරිවැයක් දරා තිබුණි. එකී ව්‍යාපෘති අතරින් එක් ව්‍යාපෘතියක්වත් මේ දක්වා සම්පූර්ණයෙන් නිම කර නොතිබූ අතර ව්‍යාපෘති 5 කට අදාලව නිම කිරීමේ ප්‍රතිශතය 0.06 ත් 13.16 ත් අතර විය.

3.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

(අ) භූගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීම

වකුගඩු රෝගය විශාල වශයෙන් ව්‍යාප්ත වී ඇති අනුරාධපුරය සහ පොළොන්නරුව වැනි තෝරා ගත් දිස්ත්‍රික්ක කිහිපයක නියමු ව්‍යාපෘතියක් ලෙස භූගත ජල විමංසන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා පිරිවැය යුරෝ 20,629,921.18 ශ්‍රීලංකා රුපියල් රු.මිලියන 3,628.39 ක් වන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට වාරිමාර්ග හා ජල සම්පත් අමාත්‍යාංශ ලේකම් විසින් 2017 ඔක්තෝබර් 03 දින ගිවිසුමකට එළඹ තිබුණි. ව්‍යාපෘතියේ පිරිවැය වූ යුරෝ 20,629,921.18 හෙවත් රු. මිලියන 3,628.39 ක වටිනාකමින් සියයට 85 ක් හෙවත් යුරෝ 17,535,433 ණය මුදලක් නෙදර්ලන්තයේ රේබෝ බැංකුවෙන් මාසිකව (Rabo Bank) EURIBOR + 1.45% වූ සහන පොලී අනුපාතයක් මත සහන ගෙවීම් කාලයක් සහිතව ශ්‍රී ලංකා රජය විසින් ලබා ගෙන තිබුණි. ශ්‍රී ලංකා රජය විසින් දැරිය යුතු ඉතිරි සියයට 15 වන යුරෝ 3,094,488.18 ක මුදල ලංකාවේ හැටන් නැෂනල් බැංකුව වෙතින් (Hatton National Bank) වසර 3 ක සහන කාලයක් සහිතව 2025 දෙවන අර්ධ වර්ෂයේ සිට වසර 15 කින් ගෙවා නිම කල යුතු ණය මුදලක් ලෙස ශ්‍රී ලංකා රජය විසින් ලබා ගෙන තිබුණි.

පහත දක්වා ඇති කරුණු අනුව ව්‍යාපෘතිය සඳහා දරන ලද පිරිවැයට ප්‍රමාණවත් පරිදි ප්‍රතිලාභ ලබා ගැනීමෙන් තොරව ඉදිරි වසර 15 ක් තුළ ණය ගෙවීමට රජයට සිදු වී තිබුණි.

(i) වසර 3 ක් වූ ව්‍යාපෘති කාලය වසර 2 කින් දීර්ඝ කිරීමෙන් පසු 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ කටයුතු නිම කර තිබූ නමුත් ව්‍යාපෘතිය යටතේ ඉදිකළ යුතුව පැවති අත්‍යවශ්‍ය අංගයක් වූ දත්ත මධ්‍යස්ථානය ඉදිකර නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතියේ මූලික අරමුණු හා අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගත නොහැකි වී තිබීම.

(ii) ව්‍යාපෘති ගිවිසුම අනුව යුරෝ 3,094,488.18 ක් වූ සියයට 15ක වැඩ අත්තිකාරම් මුදල ව්‍යාපෘතිය ආරම්භයේම ශ්‍රී ලංකා රජය විසින් ගෙවිය යුතු බවට වූ කොන්දේසි ඇතුළත්ව පැවති හෙයින් එම මුදලට සමාන වටිනාකමකින් වූ ලංකාවේ හැටන් නැෂනල් බැංකුව වෙතින් (Hatton National Bank) ලබා ගෙන අදාළ අත්තිකාරම් මුදල ගෙවා තිබුණි. ඒ තුළ දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වූ පිරිවැයද ඇතුළත්ව පැවතුණි.

(iii) ව්‍යාපෘතිය සඳහා වූ ප්‍රතිපාදනයන්ගෙන් යුරෝ 433,228.15 ක් ඉතිරිව තිබීම හා එම වටිනාකමද ඇතුළත්ව ශ්‍රී ලංකා රජය විසින් අත්තිකාරම් මුදල් ගෙවා තිබීම. ඒ අනුව යුරෝ 509,687 කට අදාළ වැඩකටයුතු කොන්ත්‍රාත්කරු විසින් ඉටුකර නොතිබීම පිළිබඳ මහාභාණ්ඩාගාරය දැනුවත් කර නොතිබුණි. ඒ හේතුවෙන් සම්පූර්ණ ණය මුදලට අදාළ වාරිකය වූ යුරෝ 876,771.65 බැගින් 2021 සැප්.23 හා 2022 මාර්තු 23 යන දිනයන්හිදී මහා භාණ්ඩාගාරය විසින් ගෙවා තිබීම.

(iv) අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ තාක්ෂණ ඇගයීම් කමිටුව ව්‍යාපෘතියේ BOQ අයිතමයන් වෙන් වෙන් වශයෙන් අධීක්ෂණයට ලක් කර නිර්දේශ ඉදිරිපත් කර තිබුණි. එහිදී BOQ අයිතම අංක 33 ප්‍රකාරව භූගත ජලයේ නයිට්‍රේට් සාන්ද්‍රණය මැනීම සඳහා යොදා ගන්නා Nitrate Sensor 30 ක් සහ BOQ අයිතම 29 ප්‍රකාරව භූ ගත ජල මට්ටම හා උෂ්ණත්වය මනින උපකරණ (Cera – Driver 10 meter) 90 ක් සවි කිරීමට නිර්දේශ කර තිබුණි. එසේ වුවද ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ අංක PD/GWMNP/2021/39 හා 2021 ජනවාරි 25 දිනැති ලිපිය මගින් BOQ අයිතම 33 හි ඇතුළත් උපකරණ 30 සහ BOQ අයිතම 29 හි ඇතුලත් උපකරණ 90 ඉවත් කොට ඒ වෙනුවට භූගත ජල මට්ටම, උෂ්ණත්වය හා විද්‍යුත් සන්නායකතාවය මනිනු ලබන (CTD – Driver 10 meter) උපකරණ 120 ක් සවිකිරීමට කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා කර ඉංජිනේරු ඇස්තමේන්තු සංශෝධනය කර තිබුණි. ඒ සඳහා අදාළ කමිටුවේ අනුමැතිය ලබාගෙන නොතිබීම.

(v) ව්‍යාපෘතියේ කටයුතු 2022.12.31 දිනට අවසන් කර තිබූ නමුත් ව්‍යාපෘතිය මගින්, භූගත ජල පර්යේෂණ සඳහා වූ අධීක්ෂණික උපකරණ සවි කොට ඉදිකරන ලද නළලිං 190 ක් හා ඊට අදාළ නඩත්තු උපකරණ විධිමත් පරිදි ජල සම්පත් මණ්ඩලයට පැවරීම, වැඩ අවසන් කිරීම් වාර්තා නිකුත් කිරීම, ගිණුම් පියවීම හා 2022 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම.

ව්‍යාපෘතිය විධිමත්ව අවසන් කර අදාළ ලේඛන ජල සම්පත් මණ්ඩලය වෙත විධිමත්ව පවරා දීම සිදුකර නොතිබීම.

3.1.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

(අ) මහාපරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණය හා කඩිනම් කිරීමේ (RAMP) කමිටුවේ නිර්දේශ ප්‍රකාරව අග්‍රාමාත්‍ය ලේකම්වරයා විසින් 2023 ජනවාරි 13 දින වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම්වරයා වෙත ඉදිරිපත් කර තිබූ ලිපිය අනුව වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කර තිබූ ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 333,569 ක් හා ඇ.ඩො.මිලියන 690 ක් වූ ව්‍යාපෘති 9 ක් 2023 වර්ෂයේ සිට ක්‍රියාත්මක නොකිරීමට තීරණය කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 203,159 පිරිවැයක් දරා තිබූ මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පැවති දුර්වල කළමනාකරණය හේතුවෙන් සැලසුම් කල පරිදි නිම කිරිමකින් තොරව අත්හැර දැමීමට සිදුව තිබුණි. පහත දැක්වෙන පරිදි ඒ අතරින් ව්‍යාපෘති 7 ක ප්‍රගතිය සියයට 0 සිට සියයට 13.16ක් වූ අවම මට්ටමක විය.

ව්‍යාපෘතිය	ආරම්භකල වර්ෂය	නිම කිරීමට අපේක්ෂා කල වර්ෂය	කාලය දීර්ඝ කිරීම	ප්‍රමාද කාලය වසර	ඇස්තමේන්තු වටිනාකම (රු.මිලියන)	දරා ඇති පිරිවැය 2022.12.31 දිනට (රු.මිලියන)	නිම කිරීමේ ප්‍රතිශතය (%)
ගිං නිල්වලා හැරවීමේ ව්‍යාපෘතිය	2014	2017	2023	6	ඇ.ඩො.මි.690	4,090	4.5
උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය	2010	2015	2023	8	80,447	77,578.99	97.39
තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය	2014	2018	2024	5	31,484	585.3	13
කුඹුක්කන් ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය	2016	2022	2026	1	32,397	417.19	1.96
මුත්මදනි ආරු ගංගා නිම්න සංවර්ධන ව්‍යාපෘතිය	2021	2027	2028	0	24,141	347.23	2.29
කිඹුල් ඔය සංවර්ධන ව්‍යාපෘතිය	2012	2016	2022	6	6,000	364.64	0
මොරගහකන්ද කළුගඟ කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතිය	2007	2017	2022	5	117,700	117,115.55	99.37
පහළ මල්වතු ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය	2016	2023	2025	0	22,900	953.33	4.28
ඵලදායීතා ප්‍රවර්ධනය සහ වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතාව කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය	2017	2021	2025	2	18,500	1706.81	13.16
					333,569	203,159	

(ආ) තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය

මේ සඳහා ඉදිරිපත්කර තිබූ අංක 14/1281/508/015/ටීබීආර් දරන අමාත්‍යමණ්ඩල සංදේශය සඳහා 2014 සැප්තැම්බර් 18 දින ලැබී තිබූ අනුමැතිය අනුව ආරම්භ කර තිබූ මෙම ව්‍යාපෘතියේ කටයුතු, උමාඔය ව්‍යාපෘතිය සඳහා ඇති වූ ජනතා විරෝධය මත ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. ව්‍යාපෘතිය සඳහා 2017 දෙසැම්බර් මස චීනයේ EXIM බැංකුව සමඟ ණය ගිවිසුමක් අත්සන් කර තිබූ අතර ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කර තිබුණද ණය ගිවිසුම ක්‍රියාත්මක නොවීම මත 2019 වර්ෂයේ කොන්ත්‍රාත් සමාගම ව්‍යාපෘතිය අතරමඟ නවතා ක්ෂේත්‍රයෙන් ඉවත් වී තිබුණි.

ශ්‍රී ලංකා ජන රජයේ මූල්‍ය ප්‍රතිපාදන මත 2020 වර්ෂයේදී නැවත ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමෙන් පසු මේ දක්වා රු.මි.610 ක් වැය කර තිබුණි. ව්‍යාපෘතිය නවතා දැමීමට තීරණය කිරීම හේතුවෙන් මූලික අරමුණු යටතේ හඳුනාගෙන තිබූ ආර්ථික වාසි සැළසුම්ගත පරිදි ලබා ගැනීමට නොහැකි වී ඇති අතර ව්‍යාපෘතිය සඳහා මෙතෙක් දරා ඇති පිරිවැයෙන් මේ දක්වා ජාතික ආර්ථිකයට කිසිදු දායකත්වයක් ලැබී නොතිබුණි.

(ඇ) දෙමටගල්ල හා කුඩාවිලච්චිය වැව් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය

මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුඩාවිලච්චිය වැව සහ පලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දෙමටගල වැව ප්‍රතිස්ථාපනය කිරීම සඳහා 2019 මැයි 29 දිනැති අංක අමප/19/1341/118/014 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී තිබුණි.

(i) ග්‍රාමීය වැව් 32 ක් යටතේ හෙක්ටයාර් 550 ක් වගා කිරීම ඇතුළු ප්‍රතිලාභ රැසක් අරමුණු කර ගනිමින් දෙමටගල වැව ප්‍රතිස්ථාපනය මෙන්ම පෝෂක ඇළක් ද සමඟින් හැවන් ඇල්ල අමුණ ප්‍රතිසංස්කරණය ආරම්භකර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා වසර 3ක් තුල රුපියල් මිලියන 1.43 ක් දැරීමෙන් අනතුරුව ව්‍යාපෘතිය නවතා දැමීමට තීරණය කිරීම හේතුවෙන් මූලික අරමුණු යටතේ හඳුනාගෙන තිබූ ආර්ථික වාසි සැළසුම්කළ පරිදි ලබා ගැනීමට නොහැකි වී තිබුණු අතර මෙතෙක් දරා ඇති පිරිවැයෙන් මේ දක්වා ජාතික ආර්ථිකයට කිසිදු දායකත්වයක් ලැබී නොතිබුණි.

(ii) අමාත්‍ය මණ්ඩලයේ තීරණයක් මත ප්‍රතිලාභ රැසක් අරමුණු කර ගනිමින් 2019 වසරේ ආරම්භ කළ කුඩාවිලච්චිය ජලාශ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය සඳහා වසරකදී රු.මිලියන 120.55ක් දැරීමෙන් අනතුරුව නවතා දැමීමට තීරණය කිරීම හේතුවෙන් මූලික අරමුණු යටතේ හඳුනාගෙන තිබූ ආර්ථික, සමාජයීය, පාරිසරික වශයෙන් වූ වාසි සැලසුම්ගත පරිදි ලබා ගැනීමට නොහැකිව තිබුණි.

(ඈ) ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව් ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මඟින් 2021 වර්ෂයේ රු. මිලියන 4.25 ක්ද, 2022 වර්ෂයේ රු. මිලියන 4.06 ක්ද වශයෙන් රු. මිලියන 8.31ක වියදමක් දරා තිබුණු භෞතික ප්‍රගතිය සියයට 50 ක් දක්වා වූ කොන්ත්‍රාත් 42ක් සමාලෝචිත වර්ෂය අවසානයට අවලංගු කර තිබුණි. එකතුව රු. මිලියන 236.55ක ප්‍රතිපාදන වෙන්කර තිබූ කොන්ත්‍රාත්තු 29ක්ද,

ප්‍රතිපාදන වටිනාකම දක්වා නොතිබූ කොන්ත්‍රාත්තු 03 ක්ද ක්‍රියාත්මක නොකර අවලංගු කර තිබූ අතර, අවලංගු කිරීමට තුඩු දුන් හේතු ප්‍රගති වාර්තාවට ඇතුළත් කර නොතිබුණි.

(ඉ) ඇහැටුගස්වැව, වැලි ආර අමුණේ සිට කිරිඉබ්බන්වැව දක්වා වූ 2.7 KM ක පෝෂිත ඇළමාර්ගය ඉදිකිරීම.

ඇහැටුගස්වැව ඒකකයේ වැලි ආර අමුණේ සිට කිරිඉබ්බන්වැව දක්වා දිවෙන 2.7 KM ක දුර ප්‍රමාණයකින් යුක්ත පෝෂිත ඇළමාර්ගය ඉදිකිරීම 2018 අගෝස්තු මස පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකුට රු.මිලියන 3.4 කට පවරා තිබුණි. එම ඇළ මාර්ගයේ ඉදිකිරීම් කටයුතු වලින් සියයට 60 ක් පමණ අවසන්ව පැවතියදී අතරමග නවතා දමා තිබුණද කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. අදාළ ඇළ මාර්ගයේ ඉතිරි කොටස ඉදිකිරීම සෘජුශ්‍රම ක්‍රමය යටතේ 2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණු නමුත් මේ දක්වා නිමකර නොතිබුණි. මේ හේතුවෙන් අදාළ පිරිවැය අනාවරණ තත්ත්වයට පත්වීමට අමතරව ඇළ පතුලේ වලවල් වල ජලය රැඳී තිබීම හේතුවෙන් සෞඛ්‍ය හා පාරිසරික ගැටලු නිර්මාණය වී තිබීම, ඇහැටුගස්වැව ගම්මානය හරහා ඇළ මාර්ගය දිවීම හේතුවෙන් පදිංචිකාරුවන්ගේ ඉඩම් දෙකඩ වී තිබීම, නිසි ශක්‍යතා අධ්‍යනයකින් හා සැලසුම් කිරීමකින් තොරව ක්‍රියාත්මක කර තිබීම හේතුවෙන් ඇළෙහි ඇතැම් ස්ථානයන්හි ගැඹුර අඩි 30 පමණ වීම, එවැනි ස්ථාන ආවරණය කිරීම සඳහා කටයුතු කර නොතිබීම හේතුවෙන් ජන ජීවිතයට තර්ජන එල්ලවී තිබීම යන සමාජ හා පාරිසරික ගැටළු නිර්මාණය වී තිබුණි.

3.1.5 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

(අ) උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

ව්‍යාපෘතිය 2008 වර්ෂයේ ආරම්භ කර වසර 07 කින් එනම් 2015 නොවැම්බර් 15 දින නිම කිරීමට මූලිකව අපේක්ෂා කර තිබුණ ද අවස්ථා 8 කදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2021 ජූනි 30 දක්වා කාලය දීර්ඝ කර තිබුණි. ඉරාන ෆරාබ් සමාගම 2008 අප්‍රේල් 28 දින ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPC) කොන්ත්‍රාත් ක්‍රමය යටතේ කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණු අතර සංශෝධිත මුළු පිරිවැය ඇස්තමේන්තුව ඇමරිකානු ඩොලර් මිලියන 529.06 ක් හෙවත් රුපියල් මිලියන 74,325.75ක් විය. උක්ත ගිවිසුම යටතේ 2023 අප්‍රේල් 30 දිනට ඇමරිකානු ඩොලර් මිලියන 502.697ක වැඩ සහනික කොට ගෙවා තිබුණි. ව්‍යාපෘතිය සඳහා අරමුදල් ඉරාන අපනයන සංවර්ධන බැංකුව මගින් මූල්‍යනය කිරීමට යටත්ව තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කොන්ත්‍රාත්කරු තෝරාගෙන තිබුණද, 2013 වර්ෂයේදී ඉරානය වෙත පනවන ලද ආර්ථික සම්බාධක හේතුවෙන් ඉරාන අපනයන සංවර්ධන බැංකුව විසින් ණය මුදල අත්හිටුවා තිබුණි. පහත සඳහන් නිරීක්ෂණ කෙරේ.

(i) ඒ අනුව ඇමරිකානු ඩොලර් මිලියන 50 ක් හෙවත් රු. මිලියන 6,522.85ක් විදේශීය ණය ගිවිසුම මගින් මූල්‍යනයෙන් අනතුරුව ව්‍යාපෘතියේ මේ දක්වා පිරිවැය වූ ඇමරිකානු ඩොලර් මිලියන 437.11 ක් හෙවත් රු. මිලියන 71,056.14 ක් ශ්‍රී ලංකා රජයේ අරමුදල් වලින් මූල්‍යකරණය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය දේශීය අරමුදල් මගින් ඉදිරියට ගෙන යාම පිළිබඳ තීරණය කිරීමේදී ජාත්‍යන්තර තරඟකාරී මිල ගණන් කැඳවීම තුළින් ශ්‍රී ලංකා රජයට ලබාගත හැකිව තිබූ තරඟකාරී වාසි පිළිබඳ තක්සේරු කිරීමක් සිදුකර අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර නොතිබුණි.

(ii) 2023 මැයි 15 දින වන විට ව්‍යාපෘතියේ ප්‍රමාද කාලය වසර 7 කුත් මාස 6 ක් වී තිබුණු අතර උක්ත ප්‍රමාදය හේතුවෙන් ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කර තිබූ ප්‍රතිලාභ අත් කර ගැනීමට නොහැකි වී තිබුණි. එහිදී විදුලි බල ජනන පද්ධතියට මෙගාවොට් 120 ක විදුලි බලයක් එකතු කිරීම තුළින් දිනකට විදුලිබල මණ්ඩලයට රු. මිලියන 55 කට නොවැඩි මුදලක් ඉතිරිවන බව ගණන් බලා තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය වසර 7 1/2 ක් ප්‍රමාදවීම තුළින් සිදුව තිබූ පාඩුව රු. මිලියන 150,562 ක් වී තිබුණි.

(iii) උක්ත ප්‍රමාදය සඳහා කොන්ත්‍රාත්කරු වෙත විධිමත් පරිදි කාලය දීර්ඝ කර ගැනීමට අවස්ථාව සළකා තිබූ නමුත් එම කාල සීමාව තුළ අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබීම මගින් සේවා යෝජක වන ශ්‍රී ලංකා ජනරජයට සිදුවී ඇති පාඩුව ගණනය කොට EPC කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාර කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමේ හැකියාව පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි. ව්‍යාපෘතියට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ 66 ක් ඉදිරිපත් කර තිබූ නමුත් එම කිසිදු අවස්ථාවකදී ඒ පිළිබඳ අමාත්‍යමණ්ඩලය දැනුවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iv) කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා අවශ්‍ය ඉඩම් සඳහා ප්‍රවිෂ්ටවීමේ අයිතිය ලබා දීමේ ප්‍රමාදය, නිම කළ වැඩ සඳහා ඉදිරිපත් කළ බිල්පත් ගෙවීමේ ප්‍රමාදය සහ ඉදිකිරීම් වැඩබිම සඳහා ලබා දිය යුතුව තිබූ දත්ත ලබා දීමේ ප්‍රමාදය වැනි කරුණු 05 ක් සඳහා කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාද ගාස්තු හිමිකම වශයෙන් ඇමරිකානු ඩොලර් 181,337,171 ක ප්‍රමාද ගාස්තුවක් රජයෙන් ඉල්ලා තිබුණි. අමාත්‍ය මණ්ඩලය විසින් මේ පිළිබඳ සොයා බලා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස සාකච්ඡා සම්මුති කමිටුවක් පත් කර තිබූ අතර එම කමිටු වාර්තාව මගින් කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාද ගාස්තු හිමිකම වශයෙන් ඇමරිකානු ඩොලර් 19,517,082 ක මුදලක් නිර්දේශ කර තිබුණි. ඒ සඳහා 2021 ඔක්තෝබර් 31 දින ඉදිරිපත් කර තිබූ අංක IR/2021/62 දරන අමාත්‍යමණ්ඩල සංදේශය තුළ සාකච්ඡා සම්මුති කමිටුව විසින් නිර්දේශිත ප්‍රමාද ගාස්තු හිමිකම වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 38,612ක් දක්වා තිබුණි. එහිදී, ඉරාන රජයට පනවා තිබූ ආර්ථික සම්බාධක හා වෙනත් අනපේක්ෂිත දුෂ්කරතා හේතුවෙන් කොන්ත්‍රාත්කරු මුහුණ දෙනු ලබන මූල්‍යමය බාධාවන් සඳහා සානුකම්පිත හේතු මත අමාත්‍ය මණ්ඩලයේ කැමැත්ත පරිදි

කොන්ත්‍රාත්කරුට ගෙවීම සඳහා සලකා බැලීමට සම්මුති සාකච්ඡා කමිටුව විසින් නිර්දේශ කර තිබූ ඇමරිකානු ඩොලර් 19,094,795 ක් ද එකතු කර කමිටුව විසින් නිර්දේශිත වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 38.612 ක් වශයෙන් අර්ථ දක්වා අමාත්‍යාංශ්ඩලය පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබුණි.

(v) අමාත්‍ය මණ්ඩලය විසින් පත් කර තිබූ සාමාජිකයන් 07 දෙදෙනෙකුගෙන් යුතු සම්මුති සාකච්ඡා කමිටුව සඳහා ව්‍යාපෘතිය ආරම්භයේ සිටම එම ක්‍රියාවලියට සම්බන්ධ වූ හා ඒ සම්බන්ධව පූර්ණ අවබෝධයෙන් යුතු නිලධාරීන් ඇතුළත් කර නොතිබීම හා ව්‍යාපෘතියට සෘජුව සම්බන්ධ නොවූ නිලධාරි කණ්ඩායමක් කමිටුව සඳහා පත්කර තිබීම නිරීක්ෂණය විය. කමිටුව විසින් අත්‍යවශ්‍ය පාර්ශව සමඟ ප්‍රමාණවත් සන්නිවේදනයක් සිදුකර නොතිබීම, ව්‍යාපෘතියේ කටයුතු මූලික ගිවිසුම්ගත කාලයට සමාන කාලයකින් ප්‍රමාද වී තිබියදී ඒ මගින් ශ්‍රී ලංකා ජනරජයට සිදුවී ඇති පාඩුව EPC කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව අයකර ගැනීමේ හැකියාව පිළිබඳ කිසිදු සැලකිල්ලක් දක්වා නොතිබීම, කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමේදී "රජය වෙත අමතර වියදමකින් තොරව දීර්ඝ කරන ලද කාල සීමාව තුළ සියලු ඉදි කිරීම් නිම කර ව්‍යාපෘතිය විධිමත්ව රජය වෙත භාර දීම" යන කොන්දේසිය පනවා තිබූ නමුත් එම කොන්දේසිය පිළිබඳව සැලකිල්ලක් දක්වා නොතිබීම, කමිටු නිර්දේශය තුළ සානුකම්පිත හේතූන් මත අමාත්‍ය මණ්ඩලය කැමතිනම්, ඇමරිකානු ඩොලර් 19,094,795ක අමතර ගාස්තුවක් ගෙවීමට නිශ්චිත නොවූ හා වෘත්තීමය භාවිතයෙන් තොර නිර්දේශ ඇතුළත් කොට තිබීම යන කරුණු හේතුවෙන් කමිටු නිර්දේශය සර්වග්‍රාහී කරුණු ආවරණයක් සිදු කර ඇති බවට සෑහීමකට පත්විය නොහැකි විය.

(vi) 2015 නොවැම්බර් 15 දින සිට 2023 ජූනි 30 දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කර තිබූ අවාර කොන්ත්‍රාත් ගිවිසුමේ 8.7 වගන්තිය ප්‍රකාරව දිනකට කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 0.01 ක් වශයෙන් උපරිමය සියයට 5 ක් දක්වා ප්‍රමාද ගාස්තු ලෙස ඇමරිකානු ඩොලර් මිලියන 26.453 ක් අයකළ හැකිව තිබුණද එම ප්‍රමාද ගාස්තු අය කරගෙන නොතිබුණු අතර ප්‍රමාද ගාස්තු ලෙස කොන්ත්‍රාත්කරුගෙන් ඇමරිකානු ඩොලර් 6,631,364 ක් පමණක් අයකරගෙන තිබුණි

(vii) එසේ වුවද අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි ඉන් ඇමරිකානු ඩොලර් 5,305,091 ක් ආපසු ගෙවා තිබුණි. උක්ත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමේදී EPC කොන්ත්‍රාත් ගිවිසුමේ ප්‍රතිපාදන අනුව අය කරන ලද ප්‍රමාද ගාස්තු ආපසු ගෙවීම තුළින් දීර්ඝ කළ කාලසීමාවට අදාළ අතිරේක වියදම් සඳහා කොන්ත්‍රාත්කරුට හිමිකම් පෑමට හැකියාව ලැබෙන බව හා ඉන් ඇතිවන බැඳීමේ බලපෑම පිළිබඳව අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර නොතිබුණි.

(viii) ව්‍යාපෘතියේ ප්‍රධාන උමඟෙහි ඇති වූ ජල කාන්දුව සඳහා වන්දි වශයෙන් කොන්ත්‍රාත්කරු විසින් අදාළ රක්ෂණ සමාගමෙන් ඇමරිකානු ඩොලර් 8,155,981 ක වන්දියක් ලබාගෙන තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් චින්දිත පාර්ශව වෙත ගෙවිය යුතු වන්දි වෙනුවෙන් 2021 අගෝස්තු 31 වන විට රජයේ මුදලින් රු.මිලියන.1,931.34 ක් ගෙවා තිබූ අතර රජයෙන් ගෙවූ වන්දි මුදල් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගත යුතු බවට 2019 මැයි 22 දින ගිණුම් කාරක සභාව විසින් නියෝග කර තිබුණද ඉන් රු. මිලියන 1,124.62 ක් විගණිත දින වූ 2023 අප්‍රේල් 30 වනවිටත් අය කර ගෙන නොතිබුණි.

3.1.6 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

(අ) වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කර තිබුණු සංවර්ධන ව්‍යාපෘති වලට අදාළ ඉඩම් අත්පත් කර ගැනීමේ, වන්දි මුදල් ප්‍රදානය කිරීමේ හා නැවත පදිංචි කිරීමේ කටයුතු සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කෙරේ.

(i) අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ යාන්ඔය, උමාඔය, මොරගහකන්ද ව්‍යාපෘතීන් හි ඉඩම් අත්පත් කරගැනීම සඳහා 2012-2023 කාල සීමාව තුළ රු.මිලියන 9,457.66 ක් වැය කර තිබූ අතර වන්දි ගෙවීමට ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත අරමුදල් නිදහස් කර තිබුණද විවිධ හේතු මත වන්දි ගෙවීම් අවසන් වී නොතිබූ අතර ඉඩම් පවරා ගැනීමද ඊට සමගාමීව ප්‍රමාද වී තිබුණි. එම එක් එක් ව්‍යාපෘතියේ ඉඩම් කොටස් පවරා ගැනීම, ව්‍යාපෘතියේ කටයුතු සඳහා ඒවා භාවිතකළ ආකාරය හා අත්පත්කර ගැනීමේ ක්‍රියාවලියේ එක් එක් පියවරයන්ට අදාළ තොරතුරු නිශ්චිතව හඳුනාගත හැකි වන පරිදි ලේඛනයක් සකස්කර, යාවත්කාලීන කරන ලද පරිගණකගත තොරතුරු පද්ධතියක් පවත්වා ගෙනගොස් නොතිබුණි.

(ii) ඉඩම් ආඥා පනතේ 38 (අ) හා 44 වගන්ති මඟින් නියමකර ඇති පටිපාටීන් අනුගමනය කර වන්දි ගෙවීම් සිදු කර ඇති ඉඩම් රජය සතු බවට ලියාපදිංචි කර නොතිබුණි.

(iii) යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය යටතේ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා රු. මිලියන 4,294 ක පිරිවැයක් දරා තිබුණු අතර මූලික සැලැස්ම අනුව 2019 වසරේ නිම කලයුතු වන්දි ගෙවීම් හා ඉඩම් පවරාගැනීමේ කටයුතු වසර 4 කින් ප්‍රමාද වී තිබුණි. ජලාශය යටතේ පූර්ණ වන්දි ගෙවිය යුතු ඉඩම් කට්ටි 3644 කින් ඉඩම් කට්ටි 311 ක් සඳහා ද, වම් ඉවුර යටතේ පූර්ණ වන්දි ගෙවිය යුතු ඉඩම් කට්ටි 536 ක් සඳහා ද ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුඹුරු ඉඩම් කට්ටි 42 ක් සඳහා ද තවදුරටත් වන්දි ගෙවිය යුතුව තිබුණි. වන්දි ගෙවීම් කල ඉඩම් විධිමත්ව පවරා ගෙන ගිණුම් ගත කිරීම් අවසන් කර නොතිබුණි.

(iv) උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වන්දි ගෙවීම් සඳහා දරා ඇති පිරිවැය රු. මිලියන 1,491.30 ක් වූ අතර 2015 වසරේ අදාළ කාර්ය නිමකළ යුතුවිය. වැලිමඩ, ඌවපරණගම, ඇල්ල, හාලිඇල, වැල්ලවාය යන ප්‍රාදේශීය ලේකම්කොට්ඨාස සඳහා ඉඩම්

කට්ටි 1786 ක් වන්දි ගෙවීම සඳහා හඳුනාගන තිබූ නමුත් ඉන් ඉඩම් කට්ටි 1586 ක් සඳහා පමණක් වන්දි ගෙවා තිබුණි. වන්දි ගෙවීම් කල ඉඩම් විධිමත්ව පවරා ගෙන ගිණුම් ගත කිරීම් අවසන් කර නොතිබුණි. වන්දි ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් රු.මි.163.85 ක් පොලී වශයෙන් ගෙවා තිබුණි.

(ආ) මොරගහකන්ද කළුගඟ කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉඩම් පවරා ගැනීම, වන්දි මුදල් ප්‍රදානය කිරීම සහ නැවත පදිංචි කිරීම සම්බන්ධව පහත නිරීක්ෂණ කෙරේ.

(i) 2009 ජූනි 10 දිනැති අංක 09/1013/315/050 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය තුල මොරගහකන්ද ජලාශයට දේපල අත්පත් කරගැනීම හේතුවෙන් ඉවත් කල පවුල් සංඛ්‍යාව 1572 ක් ලෙස සඳහන් කර තිබුණි. ව්‍යාපෘති කාර්යාලය විසින් 2022 වර්ෂයේ සකස් කර තිබූ වාර්ථා අනුව පහත දැක්වෙන පරිදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 5 තුළ 2022 වර්ෂය අවසානයට ගොඩ ඉඩම් හෙක්ටයාර් 3154 ක් හා මඩ ඉඩම් හෙක්ටයාර් 679 ක් වශයෙන් මහාක්ටයාර් 3833 ක් වූ ඉඩම් කට්ටි 16125 ක් පවරා ගැනීම අවශ්‍යවෙන් රු. මිලියන 9457 ක් වන්දි වශයෙන් ගෙවා ඇති බව සඳහන් වේ. ගෙවීම් වාර්ථා අනුව 2022 වර්ෂය අවසානයට ඉඩම් හෙක්ටයාර් 4450.93 ක් 16125 ක් පවරා ගැනීම වෙනුවෙන් රු. මිලියන 11196.48 ක් වන්දි වශයෙන් ගෙවා ඇති බව සඳහන් වේ. ඒ අනුව එක් එක් වාර්ථාවන් හි විවිධ සංඛ්‍යා දක්වා තිබුණි.

	ගෙවීම් වාර්ථා අනුව		ඉඩම් අංශයේ වාර්ථා අනුව		
ප්‍රා.ලේ. කොට්ඨාශය	පවරාගෙන ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර්	ගෙවා ඇති වන්දි මුදල රු. මිලියන	පවරාගෙන ඇති ඉඩම් ප්‍රමානය හෙක්ටයාර්	පවරාගෙන ඇති ඉඩම් කට්ටි සංඛ්‍යාව	ගෙවා ඇති වන්දි මුදල රු.මිලියන
ලග්ගල	2,931.19	11,196.48	2,572,35	7,112	4,467.87
නාවුල	1,208.36		1,261,10	8,200	4,857.04
මැදිරිගිරිය	87.70		-	441	129.06
කන්තලේ	5.08		-	258	-
ඇලහැර	218.60		-	105	3.15
එකතුව	4,450.93		3,833.45	16,125	9,457.66

(ii) 2015 ජූලි 20 දිනැති අංක අමප/ 15/1145/604/011 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව නැවත පදිංචි කිරීමේ කටයුතු සඳහා හපුගස්පිටිය, ඕපල්ගල , නාවුල, කළු ගඟ ජලාශය යටතේ සංවර්ධනය කර ඇති ඉඩම් වශයෙන් ඉඩම් අක්කර 573 ක් පවරා ගැනීමට අනුමැතිය දී තිබූ නමුත් ඒවා පවරා ගෙන නොතිබුණි.

(iii) මොරගහකන්ද කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතියෙහි නැවත පදිංචි කිරීමේ සැලැස්මේ 5.1.5 ඡේදය අනුව මොරගහකන්ද ව්‍යාපෘතියේ බලපෑමට ලක්වූ පවුල් 302 ක් මැදිරිගිරිය D කලාපයේ පදිංචි කිරීමට යෝජනා කර එම කලාපය තුළ නබඩවැව, දහම්වැව හා බණ්ඩාරවැව ලෙස නව ගම්මාන 3 ක් හා බිසෝපුර ලෙස ප්‍රාදේශීය මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමටත් එම ගම්මාන තුළ ඉඩම් හෙක්ටයාර් 2,072 ක් ගොවි බිම් කට්ටි 2,680 ක් ලෙස හා ඉඩම් හෙක්ටයාර් 914 ක් ගෙවතු ඉඩම් කට්ටි 3,350 ක් ලෙස සංවර්ධනය කර අදාළ පවුල් වෙත බෙදාදීමටත් හඳුනා ගෙන තිබුණි. එහිදී මොරගහකන්ද කළුගඟ ජලාශ ව්‍යාපෘතියේ පහළ නිම්න සංවර්ධන කාර්යයන් යටතේ 2009 සිට 2022 වර්ෂය දක්වා රු.මිලියන 4,446.263 ක් වැය කර තිබුණි.

එයින් ඉඩම් කට්ටි 7ක් පමනක් මොරගහකන්ද කළුගඟ ජලාශ ඉදිකිරීමේදී අවතැන් වූ පවුල් වෙත බෙදා දී තිබුණි. ඉතිරි ඉඩම් කට්ටි වලින් කොටසක් ඉඩම් කච්චේරි පවත්වා මැදිරිගිරිය හා ලංකාපුර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි පදිංචිකරුවන් වෙත බෙදා දී තිබූ අතර කොටසක් තව දුරටත් බෙදා දීම ප්‍රමාදවී ඇතුණි. ඒ අනුව ව්‍යාපෘතියේ මූලික සැලසුම් අනුව නැවත පදිංචි කිරීම සඳහා හඳුනාගෙන ස්ථාපිත ගම්මාන, මඩ කුඹුරු ඉඩම් හා එම ගම්මානයන්හි ඉදිකර තිබූ සෞඛ්‍ය මධ්‍යාස්ථාන, සමූපකාර, පොදු වෙළඳපොල, සමෘද්ධි බැංකු, බස් නැවතුම්පොළ හා අනෙකුත් පොදු පහසුකම් ගොඩනැගිලි ඵලදායී උපයෝජිතව පැවතියදී ව්‍යාපෘතියෙන් පරිබාහිරව අවධිමක්ව කෝරාගත් සිරිස් ඉඩම බෙදා දී තිබුණි.

(iv) ඉඩම් පවරා ගැනීම, වන්දි මුදල් ප්‍රදානය කිරීම සහ නැවත පදිංචි කිරීම යන කටයුතු සඳහා 2008 වර්ෂයේ අවතැන් වූ පාර්ශවයන් වෙත වෙනත් ස්ථානයන්හි ඉඩම් ලබාදීම, වන්දි ගෙවීම හා ජීවනෝපාය ආධාර සඳහා 2022 වර්ෂය අවසානය වන විට රු. මිලියන 13,700 ක් වැය කර තිබුණි. 2017 වසරේ නිම කලයුතු කාර්ය වසර 5 ක් ප්‍රමාද වී තිබුනද විගණිත දින දක්වා අවසන් වී නොතිබුණි.

(v) ඉහත එක් එක් ව්‍යාපෘතියේ ඉඩම් කොටස් පවරා ගැනීම, වන්දි මුදල් ගෙවන ලද ආකාරය, හා ව්‍යාපෘතියේ කටයුතු සඳහා ඒවා භාවිත කළ ආකාරය වැනි තොරතුරු නිශ්චිතව හඳුනාගත හැකි වන පරිදි ලේඛනයක් සකස්කර හෝ යාවත්කාලීන කරන ලද පරිගණක ගත තොරතුරු පද්ධතියක් පවත්වා ගෙනගොස් නොතිබීම හේතුවෙන් ඉඩම් පවරා ගැනීමේ කටයුතු ක්‍රියාවලියේ හා ඒ සඳහා දරන ලද පිරිවැය පිළිබඳ නිරවද්‍යතාවය විගණනයට තහවුරු කරගත නොහැකි විය.

3.1.7 වාර්ෂික කාර්යසාධන වාර්තාව

(අ) වාරි සෞභාග්‍ය වැඩසටහන යටතේ GIS දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම හා නඩත්තුව සඳහා රු. මිලියන 3 ක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට සහ දිස්ත්‍රික්ක 06 ක වැව් 389ක මැනුම් කටයුතු කිරීම සහ රක්ෂිත සීමා ලකුණු කිරීම සඳහා රු. මිලියන 75 ක් මිනින්දෝරු දෙපාර්තමේන්තුවට වෙන් කර තිබුණද ඒවායේ ප්‍රගතිය කාර්යසාධන වාර්තාවට ඇතුළත් කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශයේ 2022 කෙටුම්පත් කාර්යසාධන වාර්තාවේ කාර්ය මණ්ඩල විස්තර ඇතුළත් කිරීමේදී ඒකාබද්ධ කරන ලද රාජ්‍ය අමාත්‍යාංශ සඳහා අනුමත කාර්යය මණ්ඩලය සැලකිල්ලට ගෙන නොතිබුණි.ඒ හේතුවෙන් අනුමත කාර්යය මණ්ඩලය 248 ක් තත්‍ය කාර්ය මණ්ඩලය 82 ක් පුරප්පාඩු 118 ක් හා අතිරික්ත කාර්ය මණ්ඩලය (සංවර්ධන නිලධාරී) 352 ක් අඩුවෙන් දක්වා තිබුණි.

3.2 විදේශ ආධාර ව්‍යාපෘති

3.2.1 විදේශ ආධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය

3.2.1.1 ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය

ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2014 නොවැම්බර් 05 දින වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය සහ චීනයේ CAMEC සමාගම ඇ.ඩො.690,000,000 ක EPC කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ ඒ සඳහා වැඩ පූර්ව අත්තිකාරම් ලෙස කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 4.35 ක් වූ ඇ.ඩො. 29,989,000ක් (රු.4,011,054,982) ගෙවා තිබුණි. 2015 මැයි මස 26 දින පැවති ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටුවේ තීරණයක් අනුව ව්‍යාපෘතිය තාවකාලිකව නතර කර තිබුණි. අනතුරුව ආර්ථික කළමනාකරණය පිළිබඳ අනුකමිටුව විසින් මෙම ව්‍යාපෘතිය නිල්වලා ගඟ ආශ්‍රිතව පමණක් සිදු කිරීමට නිර්දේශ කර තිබුණු අතර ඒ අනුව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දී තිබුණි. පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) එසේ වුවද අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමෙන් තොරව ගිං ගඟ හා නිල්වලා ගඟ යන කොටස් 2 ම පිළිබඳ අධ්‍යනය කිරීමට 2017 ජූලි 20 දින ගිවිසුමකට එළඹ කොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා තිබුණි.

(ආ) ගිවිසුම්ගත කොන්දේසි අනුව 2016 නොවැම්බර් 09 දින සිට මාස 8 කින්, එනම් 2017 ජූලි 09 ව්‍යාපෘතියේ පළමු අදියර නිම කිරීමට අපේක්ෂා කර තිබුණද 2023 මාර්තු දක්වා වසර 5කට වැඩි කාලයකට කාලය දීර්ඝ කර තිබුණි. එසේ වුවද දීර්ඝ කල කාලය අවසානයේ කාර්යයෙන් සියයට 92.5ක් පමණක් නිම කර තිබුණි. ඒ අනුව අවුරුදු 5කුත් මාස 4 ක් ප්‍රමාද වූ පසුවද පළමු අදියර වූ ව්‍යාපෘතියේ සැලසුම් සකස් කිරීමේ කටයුතු වලින් සියයට 7.5ක ප්‍රමාණයක් තව දුරටත් නිම කළ යුතුව පැවතුණි.

(ඇ) වර්ෂ 5 ක් තුළ ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ වැටුප්, දීමනා හා අනෙකුත් ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් රු. මිලියන 27 ක් වැයකර තිබූ අතර ව්‍යාපෘතියේ කටයුතු වසර 7 ක් අඛණ්ඩව ප්‍රමාද වීම තුළ එය අනාර්ථික හා අතිරේක වැය බරක් බවට පත්ව තිබුණි.

(ඈ) ව්‍යාපෘතියේ සැලසුම් සඳහා වූ සම්පූර්ණ පිරිවැයම 2014 වර්ෂයේ ගෙවා නිබියදී සැලසුම් කිරීම නිම කර නොනිබීම මත ඊට අදාළව දරා තිබූ රු.4,079,516,982 ක පිරිවැය තුලින් (2014 හා 2015 වර්ෂ වල ගෙවූ ඇ.ඩො.29,989,000 ක අත්තිකාරම්ද ඇතුළුව) වසර 9 තුළ කිසිදු ආර්ථික ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

3.2.1.2. මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන

ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක කර තිබූ උක්ත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) ව්‍යාපෘතියේ අදියර 1

මේ යටතේ කළුගඟ ජලාශයේ සිට මොරගහකන්ද ජලාශයට ජලය ගෙන යාම සඳහා කි.මී. 8.8 ක් දිගැති උමං මාර්ගය කැනීමේ කොන්ත්‍රාත්තුව, 2018 – 2021 කාලය තුළ නිම කිරීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 21.79 ක් සහ ශ්‍රී ලංකා රු. මිලියන 3,797.17ක් වශයෙන් මුළු වටිනාකම රු. මිලියන 7,146.91කට විදේශ සමාගමකට භාර දී තිබුණි. කොන්ත්‍රාක්තුව අදාළ කාලය තුළ නිම නොකිරීම හේතුවෙන් 2022 ජූනි 30 දක්වා දීර්ඝ කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විට මුළු ප්‍රගතිය සියයට 82 ක් වූ අතර 2022 වර්ෂයේ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 12ක් විය. කොන්ත්‍රාත්තුවේ මිල විවලනයන් සඳහා රු. මිලියන 274.5 ක් වෙන් කර තිබුණත් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට රු. මිලියන 781.48 ක් ඒ සඳහා ගෙවා තිබුණි. මෙම කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් පිරිවැය ඉදිරියේදී ඇමරිකානු ඩොලර් මිලියන 35 (ආසන්න වශයෙන් රු. මිලියන 9,383) දක්වා ඉහළ යා හැකි බවට ඇස්තමේන්තු කර තිබුණි.

(ආ) ව්‍යාපෘතියේ අදියර 2 - උතුරු මැද මහා ඇළ ව්‍යාපෘතිය

(i) අදියර 2 යටතේ උතුරු මැද මහ ඇළ ව්‍යාපෘතියෙහි මොරගහකන්ද ජලාශයේ සිට ජලය ගෙන යාමට කි.මී. 27.7 ක් උමං මාර්ගයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2020 – 2027 කාලය තුළ නිම කිරීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 106.09 ක් සහ ශ්‍රී ලංකා රු. මිලියන 21,179.97 ක් වශයෙන් මුළු වටිනාකම රු. මිලියන 40,073.14 කට විදේශ සමාගමකට භාර දී තිබුණි. අදාළ ණය ගිවිසුම 2018 මැයි 18 දින අත්සන් කර තිබුණද කොන්ත්‍රාත්තුව ලබා දීමට වසර 02 ½ ක කාලයක් ප්‍රමාද වී තිබුණි.

(ii) පසුව කොන්ත්‍රාත්තුවේ වැඩ නිම කළ යුතු දිනය 2027 මාර්තු 10 දින ලෙස සංශෝධනය කර තිබුණද කොන්ත්‍රාත්තුව 2025 ජූනි 07 දිනට කඩිනමින් නිම කිරීම සඳහා, භාවිත කරනු ලැබූ උමං විදුම් යන්ත්‍රයට අතිරේකව 02 වන උමං විදුම් යන්ත්‍රයක් මිලදී ගැනීමට 2021 ඔක්තෝබර් 07 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව ඇමරිකානු ඩොලර් මිලියන 143.87 ක්ද, ශ්‍රී ලංකා රු. මිලියන 20,541.94 ක්ද ඇතුළුව රු. මිලියන 46,164.31 ක මුළු වටිනාකමට මුල් කොන්ත්‍රාත්තුව සංශෝධනය කර තිබුණි. එමගින් රු. මිලියන 6,690.97 කට දෙවන උමං විදුම් යන්ත්‍රයක් මිලදීගෙන 2022 ඔක්තෝබර් මාසයේ මෙරටට ආනයනය කර තිබුණි.

(iii) අනතුරුව රටේ පවතින ආර්ථික අවපාතය හා අමතර අරමුදල් කඩිනම්ව සොයාගැනීමට ඇති අපහසුව නිසා දැනට පවතින ඇමරිකානු ඩොලර් මිලියන 69.5ක (රු. මිලියන 22,240 පමණ) ප්‍රතිපාදනය තුළ එක් උමං විදුම් යන්ත්‍රයක් පමණක් පාවිච්චි කරමින් කොන්ත්‍රාත්තුව 2024 ජූනි දක්වා පවත්වා ගෙන යාමටත් අලුතින් ආනයනය කළ උමං විදුම් යන්ත්‍රය 2024 මාර්තු දක්වා ක්‍රියාත්මක නොකිරීමටත් 2023 අප්‍රේල් 03 දින අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. සමස්ත ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය පසුගාමී තත්ත්වයක පවතින බව හා ඉදිරි ක්‍රියාකාරීත්වයද අවිනිශ්චිත අදියරක පවතින නිසා කොන්ත්‍රාත් පැකේජ 21 කින් සමන්විත මෙම ව්‍යාපෘතිය සම්බන්ධව සුදුසු විකල්ප ක්‍රමවේදයන් සකස් කිරීමට ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවට පවරා ඇති බවත්, එම දෙපාර්තමේන්තුව මගින් යෝජනා කරන විකල්ප ක්‍රමවේදය ජාතික මෙහෙයුම් මැදිරියට ඉදිරිපත් කිරීමට නිර්දේශ කරන බවත්ය. මෙම නිර්දේශය ක්‍රියාත්මක කිරීමට 2023 අප්‍රේල් 03 පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබුණි.

(iv) කොන්ත්‍රාත්තුව ආරම්භ කර වසර 02ක් ගතවී ඇති සමාලෝචිත වර්ෂය අවසානයට ඉදිකිරීම් ප්‍රගතිය සියයට 10 ක අඩු මට්ටමක පැවතුණු අතර, උමං මාර්ගයේ මීටර් 50 ක දුර ප්‍රමාණයක් පමණක් නිමකර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුවේ ඉදිරිකිරීම් පිරිවැය ඉදිරියේදී ඇමරිකානු ඩොලර් මිලියන 240.30 (රු. මිලියන 86,508) දක්වා ඉහළ යා හැකි බවට ඇස්තමේන්තු කර තිබුණි.

(ඇ) ව්‍යාපෘතියේ අදියර 2 - වයඹ මහ ඇල ව්‍යාපෘතිය

(i) වයඹ මහ ඇළ ව්‍යාපෘතිය යටතේ මගහිතුළු, මහකිරුළ ජලාශ 02 හා ඒ අතර අතු ඇළ සහ උමං මාර්ග ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2020 -2024 කාලය තුළ නිම කිරීමට ඇමරිකානු ඩොලර් මිලියන 30.21 ක් සහ ශ්‍රී ලංකා රු. මිලියන 4,591.84 ක් ඇතුළු මුළු වටිනාකම රු. මිලියන 9,978.48 කට විදේශ සමාගමකට භාර දී තිබුණි. එසේ

වුවද, කොන්ත්‍රාත් සමාගමේ කාර්ය මණ්ඩල හිඟය, ඉදිකිරීම් උපකරණ නොමැති වීම හා දුර්වල වැඩබිම් කළමනාකරණය හේතුවෙන් වසර 02 ක කාලයක් තුළ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 2.97 ක තරම් පහළ මට්ටමක පැවතුණි.

(ii) මේ හේතුවෙන් කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට ව්‍යාපෘතිය විසින් පියවර ගනිමින් පැවතුණද කොන්ත්‍රාත්කරු වෙත වැඩ පූර්ව අත්තිකාරම් ලෙස රු.මිලියන 1,197.32 ක් හා නිම කළ වැඩ වෙනුවෙන් රු. මිලියන 355.24 ක් ගෙවා තිබුණි. ඉදිරියේදී මෙම කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 48.9 (ආසන්න වශයෙන් රු. මිලියන17,604) දක්වා ඉහළ යා හැකි බවට 2021 වර්ෂයේ ඇස්තමේන්තු කර තිබුණි.

(ඇ) අදියර 2 - කෘෂිකාර්මික භාණ්ඩ මිලදී ගැනීම

අදියර 2 යටතේ ප්‍රධාන ඉදිකිරීම් කොන්ත්‍රාත් 02 ක් සඳහා වෙන්කර තිබුණු ඇමරිකානු ඩොලර් මිලියන 140.47 කින් ඇමරිකානු ඩොලර් මිලියන 39 ක් සහ තවත් අයිතම් කිහිපයකින් ඇමරිකානු ඩොලර් මිලියන 11 ක් වශයෙන් එකතුව ඇමරිකානු ඩොලර් මිලියන 50 ක් කෘෂිකාර්මික භාණ්ඩ මිලදී ගැනීම සඳහා වෙන් කිරීමට ආසියානු සංවර්ධන බැංකුව අනුමැතිය ලබා දී තිබුණි. එයින් ඇමරිකානු ඩොලර් මිලියන 39.78 ක් (රු. මිලියන 14,202) වැයකර 2022/2023 මහ කන්නයේ වී වගාව සඳහා MOP රසායනික පොහොර මෙට්‍රික් ටොන් 41,876 ක් ආනයනය කර පොහොර තොගය 2022 දෙසැම්බර් 05 දින කෘෂිකර්ම අමාත්‍යාංශයට භාර දී තිබුණි. රජයට අයත් පොහොර සමාගම් 02 කට මෙම පොහොර කිලෝ ග්‍රෑම් 50 මලුවලට අසුරා භාර දී තිබූ අතර එහිදී වටිනාකම රු. මිලියන 55.233 ක් වූ පොහොර මලු 3,230 ක ඌණතාවයක් ඇති වී තිබුණි.

(ඉ) ව්‍යාපෘතියේ අදියර 3

(i) ව්‍යාපෘතියේ 3 වන අදියර සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 93 ක් ආසියානු සංවර්ධන බැංකුව මගින්ද, ඇමරිකානු ඩොලර් මිලියන 36 ක් ශ්‍රී ලංකා රජය මගින්ද, ඇමරිකානු ඩොලර් මිලියන 114 ක් වෙනත් විදේශීය මූලාශ්‍ර මගින්ද ලබා ගැනීමට නියමිතව තිබුණත්, රට තුළ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් මෙම ප්‍රතිපාදන සපයාගත නොහැකිව තිබුණි. ඇමරිකානු ඩොලර් මිලියන 675 කට ඇස්තමේන්තු කර තිබූ මුළු ව්‍යාපෘතියේ වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 976 දක්වා ඉහළ යාහැකි බවට 2021 වර්ෂයේ ඇස්තමේන්තු කර තිබුණි.

(ii) අදියර 3 යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු කොන්ත්‍රාත් පැකේජ 09 ක් අතරින්, කොන්ත්‍රාත් පැකේජ 06 ක් සඳහා අදියර 2 යටතේ ලැබුණු ප්‍රතිපාදන වලින් රු. 1,708,486 ක් වැයකර කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගෙන තිබුණද අදියර 3 සඳහා අවශ්‍ය

මූල්‍ය ප්‍රතිපාදන නොලැබීම මත කොන්ත්‍රාත් ක්‍රියාත්මක කර නොකිබීමෙන් ප්‍රසම්පාදන කටයුතු සඳහා දරන ලද රු. 1,708,486 ක වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.

3.2.1.3 දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය

දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ (CRIP) ප්‍රතිපාදන යටතේ 2021 වර්ෂය දක්වා රු. මිලියන 430 ක් වැය කර ශක්‍යතා අධ්‍යනයන් 6 ක් සිදු කර තිබුණද ඒ යටතේ ඉදිරිපත් කර තිබූ වාර්තා අනුව ව්‍යාපෘතීන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශය අපොහොසත්ව තිබුණි.

3.2.1.4 වැව්ගම් පුබුදුව ව්‍යාපෘතිය/දේශගුණික විපර්යයාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය

(අ) ව්‍යාපෘතිය සඳහා හරිත දේශගුණික අරමුදල (GCF) පසුගිය වසර 06 තුළ රු. මිලියන 6650.66කට සමාන එ.ජ.ඩො. මිලියන 30.01 ක් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) වෙත ලබා දී තිබුණද, 2022 දෙසැම්බර් 31 වන විට රු. මිලියන 1,465.15 කට සමාන එ.ජ.ඩො. මිලියන 7.99 ක් පමණක් වාරිමාර්ග අමාත්‍යාංශය (MMDE) වෙත ලබා දී තිබුණි. ලබා දී තිබූ සම්පූර්ණ මුදලින් සියයට 22 ක් නියෝජනය වන උක්ත මුදල සඳහා පමණක් ව්‍යාපෘතිය විසින් මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබුණු අතර ඒ හේතුවෙන් සමස්ත ව්‍යාපෘතියේ මූල්‍ය කාර්යසාධනය සහ මූල්‍ය තත්ත්වය එමගින් පිළිබිඹු වී නොතිබුණි.

(ආ) ඉතිරි රු.මිලියන 5185.51 කට සමාන එ.ජ.ඩො.මිලියන 22.01 ක මුදලින් ව්‍යාපෘතියේ කටයුතු කිහිපයක් සිදුකිරීම සඳහා UNDP විසින් රු.මිලියන 2776.61 කට සමාන එ.ජ.ඩො.මිලියන 13.94 ක් වැය කර තිබුණි. ඒ අනුව එ.ජ.ඩොලර් මිලියන 8.07 කට සමාන රු. මිලියන 2,408.9 ක වියදම් සම්බන්ධ තොරතුරු හෙළිදරව් නොකෙරුණි.

(ඇ) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් උක්ත ව්‍යාපෘතියේ කටයුතු සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන සීමාව ඉක්මවා 2020 වර්ෂයේ රු.මි 470 ක් හා 2021 වර්ෂයේ රු.මි.103ක් වැය කර තිබුණි.

(ඈ) හරිත දේශගුණ අරමුදල සමඟ ශ්‍රී ලංකා රජය අත්සන් තබන්නා ලද ආධාර ගිවිසුම අනුව ශ්‍රී ලංකා රජයේ දායකත්වය 15% කි. මෙම ව්‍යාපෘතිය යටතේ මහා භාණ්ඩාගාරය වෙත 2017 සිට 2022 දක්වා කාලසීමාව තුළ රු.මි 1465 ක් ලැබී තිබුණු අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය ලෙස රු.මි.1,423 ක් වැය කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය මගින් ප්‍රතිපූර්ණය කරන ලද මුදලට සමාන මුදලක් රජය මගින්ද වැය කර තිබුණි.

3.2.1.5 විදේශාධාර ව්‍යාපෘති සඳහා මුදල් නොලැබීම මත සිදුවන ආර්ථික බලපෑම

විදේශ ණය අපේක්ෂාවෙන් EPC කොන්ත්‍රාත් ගිවිසුම් යටතේ ඇමරිකානු ඩොලර් මගින් ගෙවීම් කිරීමේ කොන්දේසි ඇතුළත් කර ආරම්භ කර තිබූ ගිං නිල්වලා හැරවීමේ ව්‍යාපෘතිය, උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය සහ භූගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීම යන ව්‍යාපෘතීන් සඳහා විවිධ හේතූන් මත අපේක්ෂිත පරිදි විදේශ අරමුදල් ලැබී නොතිබූ නමුත් ඒවා දේශීය අරමුදල් යොදවා ක්‍රියාත්මක කර තිබුණි. විදේශ අරමුදල් නොලැබීම මත ඇමරිකන් ඩොලර් මගින් ගෙවීම් කිරීමට සිදුවීමෙන් රටෙහි විදේශ සංචිත වලට ඇති වන බලපෑම පිළිබඳ ප්‍රමාණවත් තක්සේරුවක් කර නොතිබුණි.

3.3 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

3.3.1 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති කාර්යසාධනය

(අ) ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ වාරිසෞභාග්‍ය වැඩසටහන මගින් ග්‍රාමීය වැව්, අමුණු සහ ඇළ මාර්ග 5,000ක් පුනරුත්ථාපනය, අලුත්වැඩියා කිරීම් සහ නවීකරණය කිරීමට සැලසුම් කර තිබුණි. එහිදී දිවයිනේ දිස්ත්‍රික්ක 25 ආවරණය වන පරිදි ග්‍රාමීය වැව්/ අමුණු 1,340 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2021 වර්ෂයේදී රු. මිලියන 4,210.29ක්ද, 2022 වර්ෂයේදී රු. මිලියන 2,493 ක්ද වශයෙන් එකතුව රු. මිලියන 6,703.29 ක ප්‍රතිපාදන ආයතන 13 කට බෙදා දී තිබුණි. එයින් 2022 වර්ෂය වන විට වැව්/ අමුණු 1,034 ක පමණක් ඉදිකිරීම් භෞතික ප්‍රගතිය සම්පූර්ණ කර තිබුණු නමුත් ඉදිකිරීම් ප්‍රගතිය සියයට 03 සිට සියයට 75 අතර වූ වැව්/ අමුණු 133 ක්ද ඇතුලුව 1167 ක නිමකර ඇති බවට ප්‍රගති වාර්තා වල ඇතුළත් කර තිබුණි.

(ආ) **ඵලදායීතා ප්‍රවර්ධන හා වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය**

(i) මෙම ව්‍යාපෘතිය 2017 - 2021 කාල පරිච්ඡේදය තුළ රු.මිලියන 18,500 ක පිරිවැයක් යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබුණු අතර ඒ සඳහා සංවර්ධන පාර්ශවකරුවන් වෙතින් අරමුදල් ලබා ගැනීමේ හැකියාව පිළිබඳ පරීක්ෂා කර බලන ලෙස අමාත්‍ය මණ්ඩලය විසින් උපදෙස් ලබා දී තිබුණද ඒ සඳහා පියවර ගෙන නොතිබුණි.

(ii) මේ සඳහා 2017 සිට 2022 දක්වා රු. මිලියන 2,978.85 ක් වෙන්කර තිබූ නමුත් ඉන් රු. මිලියන 1,730.99 ක් පමණක් වැයකර තිබූ අතර ව්‍යාපෘතියේ මහඉහිය කාර්යසාධනය සියයට 10 ක් විය. එසේ තිබියදී 2023 වර්ෂයේ සිට ඉදිරියට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට තීරණය කර තිබුණි. දරන ලද පිරිවැයෙන් වැඩි කොටසක් ව්‍යාපෘතිය සඳහා බඳවා ගත්

නිලධාරීන්ගේ වැටුප්, දීමනා වශයෙන් හා ව්‍යාපෘති කාර්යාලය පවත්වාගෙනයාම හා එහි නඩත්තු කටයුතු සඳහාද ඉන්ධන ගමන් වියදම් ඇතුළු පරිපාලන වියදම් සඳහා ද දරා තිබුණි.

(ඇ) ගම සමග පිලිසඳරක් වැඩසටහන

උක්ත වැඩසටහන දිස්ත්‍රික්ක 5ක ක්‍රියාත්මක කිරීමට 2021 වර්ෂයේ ව්‍යාපෘති 6 ක් සඳහා රු.මි 1,616 ක මුදලක්ද 2022 වර්ෂයේ රු. මිලියන 610.14 ක්ද වෙන් කර තිබුණි

(i) මු.රෙ 20(1) විධිවිධානයන්ට අනුකූලව වාර්ෂික ඇස්තමේන්තු තුළ ප්‍රතිපාදන වෙන් කර ගැනීමකින් තොරව 198-02-03-52-2506(11) වැය විෂයය යටතේ 2022 වර්ෂය සඳහා රු. මිලියන 610.14 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර ඉන් රු. මිලියන 208.31 ක් උක්ත ව්‍යාපෘතිය සඳහා වැය කර තිබුණි.

(ii) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පදවිය හා වාහල්කඩ ගොවි ව්‍යාපාර වල ඇළ පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා රු.මිලි 116 ක ඇස්තමේන්තු 2 ක් අනුඥාත කර තිබූ අතර ඇස්තමේන්තුවට අදාළ වැඩ කොටස් සිදු කිරීම සඳහා ඇස්තමේන්තුගත බොරළු ප්‍රමාණය කැණීම් කර ගැනීම සඳහා නිසි ක්‍රමවේදන් අනුගමනය නොකිරීම හේතුවෙන් අදාළ ආයතන වලින් අවසර නිමි නොවීම මත සැපයුම්කරුවන්ගෙන් බොරළු මිලදී ගෙන සංවර්ධන කටයුතු සිදු කර තිබුණි.

(iii) වගාබිම් සඳහා ජල සැපයුම් ඉදිකිරීමට සැලසුම් කර තිබූ අතර ඒ සඳහා අවශ්‍ය හීයුම් පයිප්ප 2411 ක් මිලදී ගෙන ඉන් 1017 ක් ගොවි සංවිධාන වෙත නිකුත් කර තිබුණද එමගින් අපේක්ෂිත ජල සැපයුම් ඉදිකර නොනිබුණි.හීයුම් පයිප්ප 1395ක් පදවිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ ගොඩ ගසා තිබුණි.

(iv) නියමිත අනුමත කිරීමේ පටිපාටීන් අනුගමනය කිරීමකින් තොරව ආරම්භ කර තිබූ උක්ත ව්‍යාපෘති සඳහා 2023 වර්ෂය සඳහා ප්‍රතිපාදන ලැබී නොතිබීම මත අතරමග නවතා තිබීම හේතුවෙන් දරන ලද පිරිවැය නිෂ්කාර්ය වී තිබුණි.

3.3.2 ව්‍යාපෘති ආරම්භ නොකිරීම

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, වැලිඔය මහවැලි L කලාපය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය - කිවුල් ඔය ජලාශය ඉදිකිරීම ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යටතේ 66 MCM ධාරිතාවකින් යුත් ජලාශයක් ඉදිකිරීමට යෝජිත වූ අතර එමගින් වැලි ඔය ප්‍රදේශයේ පවතින හෙක්ටයාර 700 ක් සඳහා සහ මා ඔය හා වැලි ඔය අතර ප්‍රදේශයේ නව ඉඩම් හෙක්ටයාර 1,700ක් සඳහා වාරි පහසුකම් සැපයීමද, පානීය ජලය

සැපයීමද අරමුණු කරගෙන තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2012 සිට 2022 වර්ෂය දක්වා රු. මිලියන 364.64 ක් වැය කර තිබුණි.

(i) ව්‍යාපෘතිය 2012 වර්ෂයේ සිට වර්ෂ 4ක් තුළ නිම කිරීමට අපේක්ෂා කර තිබුණද නමුත් විගණිත දිනය වූ 2023 අප්‍රේල් 30 වන විටත් ප්‍රධාන ජලාශයේ හෝ ඇළ මාර්ගයේ ඉදිකිරීම් කටයුතු කිසිවක් ආරම්භ කර නොතිබුණි.

(ii) ව්‍යාපෘතියට අදාළව සිදුකළ ශක්‍යතා අධ්‍යනයන වාර්තාවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වූ පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව සඳහා මධ්‍යම පරිසර අධිකාරිය 2021 මැයි 03 දින ප්‍රධාන කොන්දේසි 15 ක් යටතේ වූ උප කොන්දේසි 94කට යටත්ව අනුමැතිය ලබා දී තිබුණ ද එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රායෝගිකත්වය හා ඒ සඳහා දැරීමට සිදුවන අතිරේක පිරිවැය පිළිබඳ කිසිදු විශ්ලේෂණයක් සිදුකර නොතිබුණි.

(iii) ව්‍යාපෘතිය සඳහා දරා තිබූ රු. මිලියන 364,64 ක පිරිවැයෙන් වැඩි ප්‍රමාණයක් කාර්යමණ්ඩල වැටුප් හා දීමනා සඳහා, ව්‍යාපෘති කාර්යාලය පවත්වාගෙන යාම හා එහි නඩත්තු කටයුතු සඳහා, ඉන්ධන වියදම් සඳහා හා ගමන් වියදම් සඳහා දරා තිබුණි.

(iv) වසර 10 සඳහා ව්‍යාපෘතියේ වාර්ෂික ගිණුම් වාර්තා සකස් කර නොතිබුණු අතර පරිපාලන වියදම් හා සංවර්ධන කටයුතු සඳහා වූ වියදම් වෙන් වෙන්ව හඳුනාගත හැකි පරිදි ගිණුම් පවත්වා ගෙනගොස් නොතිබුණි.

(v) මහාපරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණය හා කඩිනම් කිරීමේ (RAMP) කමිටුවේ නිර්දේශ අනුව කිවුල්ඔය ජලාශ ව්‍යාපෘතිය වසා දැමිය යුතු වුවද විගණිත දිනය වූ 2023 අප්‍රේල් 30 දක්වා එම ව්‍යාපෘති කාර්යාලය තවදුරටත් විවෘතව පැවතුණි.

3.4 වත්කම් කළමනාකරණය

වාරිමාර්ග අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වී ඇති වාහන පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය තුළින් ලබාගත් තොරතුරු අනුව වාරිමාර්ග අමාත්‍යාංශය, වාරිමාර්ග ලේකම්, හෝ අමාත්‍යාංශ ලිපිනය යටතේ වාහන 650 ක් ලියාපදිංචි වී තිබුණි. වාරිමාර්ග අමාත්‍යාංශයේ වාහන ලේඛනය අනුව අමාත්‍යාංශයට අයත් හා පරිහරණය කරණු ලබන වාහන සංඛ්‍යාව 306 ක් විය. ඒ අනුව වාහන 347 ක් අමාත්‍යාංශය භාරයේ නොපැවතුණි.

3.5 පාඩු හා හානි

මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් පාඩු හා අත්හැරීම් ප්‍රකාශනයේ තව දුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති වාහන අනතුරු 4 කට අදාළව එකතුව රු.12,189,753 ක් වූ අතර, ඉන් වාහන අනතුරු 2 කට අදාළව සිදුව තිබූ අලාභය රු. 11,716,700 ක් 2022 දෙසැම්බර් 31 දිනට රක්ෂණ ආයතන වලින් ලබා ගැනීමට නොහැකි වී තිබුණු අතර උක්ත වාහන වල අලාභය නිර්දේශ පරිදි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.6 අනාර්ථික ගනුදෙනු

(අ) මොරගහකන්ද ජලාශයේ ප්‍රධාන බැම්ම ඉදිකිරීම ව්‍යාපෘතියේ විදුලි උත්පාදන යන්ත්‍ර හතරක් සවිකිරීම වෙනුවෙන් ඇමෙරිකානු ඩොලර් 10,937,960ක් වැඩිපුර ගෙවීම.

මොරගහකන්ද ජලාශයේ ප්‍රධාන බැම්ම ඉදිකිරීම මුලික ගිවිසුමේ විෂය පථය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් තොරව 2013 පෙබරවාරි මස වෙනස් කර තිබූ අතර ඒ සඳහා 2016 නොවැම්බර් 23 දින ඉදිරිපත් කර තිබූ අංක 16/2513/704/067 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය මගින්, ව්‍යාපෘතියේ මුල් විෂය පථය වෙනස් වීම හේතුවෙන් EPC/Turnkey කොන්ත්‍රාත්කරු වෙත ඇමෙරිකානු ඩොලර් 10,937,960 ක් ගෙවීමට නිර්දේශ කර ඒ සඳහා අනුමැතිය ඉල්ලා තිබුණි. මණ්ඩල සංදේශය අනුව, ව්‍යාපෘතියේ මුලික සැලැස්ම මගින් ඉදිකිරීමට යෝජිතව තිබූ මෙගාවොට් 5 විදුලි ජනන යන්ත්‍ර 2 ක් හා මෙගාවොට් 15 විදුලි ජනන යන්ත්‍ර 1 ක් සහිත විදුලි ජනන යන්ත්‍ර 3 ක් මගින් මෙගාවොට් 25 ක් උත්පාදනය කරන විදුලි බලාගාරය වෙනුවට මෙගාවොට් 5 ක විදුලි ජනන යන්ත්‍ර 2 ක් හා මෙගාවොට් 7.5 ක විදුලි ජනන යන්ත්‍ර 2 ක් සහිත විදුලි ජනන යන්ත්‍ර 4 ක් මගින් මෙගාවොට් 25 ක් උත්පාදනය කරන විදුලි බලාගාරයක් ඉදි කිරීමට තීරණය කර තිබුණි. 2016 නොවැම්බර් 29 දිනැති අංක අමප/16/2513/704/067 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඒ සඳහා අනුමැතිය ලබා දීමේදී "මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණයන්හි අවධාරණය කරනු ලැබූ කරුණු සැලකිල්ලට ගෙන ඒ අනුව ක්‍රියාකරන" ලෙස මහාවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නියම කර තිබුණි. එසේ වුවද මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණය ක්‍රියාත්මක කිරීමෙන් තොරව අතිරේක ගෙවීම පමණක් සිදු කර තිබූ අතර අතිරේකව දැරීමට සිදු වූ ඇමෙරිකානු ඩොලර් මිලියන 10.94 ක වියදම රජයට සිදු වූ පාඩුවක් විය. එහිදී "මෙගා වොට් 10 ඉක්මවූ විදුලි බලාගාර ක්‍රියාත්මක කිරීමේ බලය ලංකා විදුලිබල මණ්ඩලය පමණක් සතුවන නිසා මෙගාවොට් 15ක විදුලි ජනන යන්ත්‍රය මෙහෙයවීමට මහවැලි සංවර්ධන අමාත්‍යාංශයට බලය නොමැති බව පසුව අනාවරණය වීම ව්‍යාපෘතියේ විෂය පථය වෙනස් කිරීමට හා කොන්ත්‍රාත් විවලනයට හේතු වී ඇති බවත්, ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට පූර්ව ලංකා විදුලිබල මණ්ඩලයෙන් මේ සම්බන්ධයෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම රේඛීය අමාත්‍යාංශයේ වගකීමක් වන බවත්, ව්‍යාපෘතියේ විෂය පථය තීරණය කිරීමට පූර්ව මෙම ව්‍යාපෘති සැලැස්මේ පාර්ශවකරුවෙකු වූ ලංකා විදුලිබල මණ්ඩලයෙන්

උපදෙස් ලබා නොගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ නිලධාරීන් වගකිව යුතු බව"ත් මුදල් අමාත්‍යවරයා නිරීක්ෂණය කර තිබුණි.

ඒ අනුව අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ව්‍යාපෘතියේ දුර්වල සැලසුම් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට අදාළ පත්කිරීම් බලධාරීන් වෙත වාර්තාකළ යුතුව පැවති නමුත් ඒ සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) උක්ත අමාත්‍ය මණ්ඩල සංදේශයේ 2.2 ඡේදය අනුව ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසුව ප්‍රධාන බැම්ම හා එහි විදුලිබල පද්ධතිය වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ පාලනය කර, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විදුලි බලය නිපදවිය යුතු අතර, නිෂ්පාදිත විදුලිය ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයට අලෙවිකර ලබා ගන්නා මුදලින් ව්‍යාපෘතිය සඳහා ලබාගත් ණය මුදල ආපසු ගෙවිය යුතුවේ. මොරගහකන්ද, කළුගඟ ව්‍යාපෘතියේ 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය සඳහා දරා තිබූ පිරිවැය රු. 107,941,306,934 ක් විය. ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද මෙගාවොට් 25ක විදුලි බලාගාරය මගින් වාර්ෂික සාමාන්‍ය විදුලි උත්පාදනය මෙගාවොට් 67,549,773ක් හා ලංකා විදුලිබල මණ්ඩල ගාස්තු අනුව එහි වටිනාකම රු.1,188,898,473ක් විය. ඒ අනුව විදුලි උත්පාදනයේ සමස්ත ආදායම මගින් ව්‍යාපෘතියේ ප්‍රාග්ධන පිරිවැය ආවරණය කිරීම සඳහා ගතවන කාලය අවුරුදු 90.9ක් විය.

3.7 විගණන විමසුම් වලට පිළිතුරු ලබා නොදීම

සමාලෝචිත වර්ෂය සඳහා නිකුත් කරන ලද විගණන විමසුම් 04 ක් සඳහා 2023 අප්‍රේල් 30 දින වන විටත් පිළිතුරු ලබා දී නොතිබුණි.

3.8 කළමනාකරණ දුර්වලතා

වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කරන ගෙවීම් පටිපාටිය, මුදල් රෙගුලාසි 135 ප්‍රකාර මූල්‍ය පාලනය සම්බන්ධව කාර්යයන් පැවරීමට අනුකූල නොවන බැවින් එම පටිපාටිය නිවැරදි කරන ලෙස 2011 මාර්තු 22 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී අමාත්‍යාංශ ලේකම්ට නියෝග කර වසර 12 ක් ගත වී තිබුනද 2023 අප්‍රේල් 30 වන විටත් නියෝගය ක්‍රියාත්මක කර නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 428 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 247 ක් විය. ඒ අනුව, ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 51 ක්, තෘතීක මට්ටමේ තනතුරු 14 ක්, ද්විතීක මට්ටමේ තනතුරු 55 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 62 ක් වශයෙන් පුරප්පාඩු 182 ක් වූ අතර 352 ක අතිරික්ත කාර්ය මණ්ඩලයක් (සංවර්ධන නිලධාරී) විය.

එම්.ඩී.සුදර්ෂණී අමරතුංග
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට